## 2019.11.05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**(01)**

**01.01** **2019 – 10 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත**

2019-10-08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2019 – 10 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන **: නැත**

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ සෞඛ්‍ය අංශයට අවශ්‍ය වැසි කබා ලබාගැනීමට ඉල්ලා ඇති ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සෞඛ්‍ය අංශයේ සෞඛ්‍ය පරිපාලක සාරාංග මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන්ට සිය රාජකාරි කටයුතු වල නිරත වන අතර වර්ෂාවෙන් ආර්ෂාකාරි වීම සඳහා සේවයේ නියතු සේවකයින් හට ගැළපෙන අන්දමේ වැසිකබා ( උඩ සහ යට කොටස් වශයෙන් වෙනම ) ලබා දෙන ලෙස ඉල්ලීමක් කර සිටිනවා. එය සභාවෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන්ටසිය රාජකාරි කටයුතුවල නිරතවන අතර වර්ෂාවෙන් ආරක්ෂාකාරි වීම සඳහා සේවයේ නියතු සේවකයින් හට ගැලපෙන අන්දමේ වැසිකබා ලබා ( උඩ සහ යට කොටස් වශයෙන් වෙනම ) දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.02 බූස්ස යුධ හමුදා කඳවුරට 2019.10.08 සහ 09 දින කඳවුරේ අවශ්‍යතාවයට කැනපි 02 ක් ( මාකිෂ් හට් ) සභා අනුමැතියට යටත්ව ලබා දීමේ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

බූස්ස , යුධ හමුදා කඳවුරේ 58 සේනාංක මූලස්ථානයේ 2019.10.08 සහ 09 දින කඳවුරේ අවශ්‍යතාවයක් සඳහා කැනපි02ක් (මාකිෂ් හට්) ඉල්ලා තිබෙනවා. එය සභා අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

බූස්ස යුධ හමුදා කඳවුරට 2019.10.08 සහ 09 දින කඳවුරේ අවශ්‍යතාවයට කැනපි 02 ක් ( මාකිෂ් හට් ) සභා අනුමැතියට යටත්ව ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.03 ජාත්‍යාන්තර ළමා දිනයට සමගාමීව අම්බලන්ගොඩ පැන් එෂියා බැංකුව මඟින් සංවිධානය කරනු ලබන එළිමහන් ළමා විවිධ ප්‍රසංගය සඳහා 2019 නොවැම්බර් 02 වන දින උදෑසන 9.00-12.00 දක්වා කාය වර්ධන මධ්‍යස්ථානය අසල පිහිටි පොදු ළමා උද්‍යානය නොමිලේ ලබා දෙනමෙන් කරන ලද ඉල්ලීම (ආදායම් පරික්ෂක මහතාගේ වාර්තාව සමඟ ) සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉහත 03.03 ලිපිය ඉවත් කරනවා. මෙය මෙම ස්ථානයේ පැවැත්වුයේ නැහැ.

**තීරණය-**

ජාත්‍යාන්තර ළමා දිනයට සමගාමීව අම්බලන්ගොඩ පැන් එෂියා බැංකුව මගින් සංවිධානය කරනු ලබන එළිමහන් ළමා විවිධ ප්‍රසංගය සඳහා 2019 නොවැම්බර් 02 වන දින උදෑසන 9.00-12.00 දක්වා කාය වර්ධන මධ්‍යස්ථානය අසල පිහිටි පොදු ළමා උද්‍යානය නොමිලේ ලබා දෙනමෙන් ඉල්ලීමක් කර තිබුණද මෙය මෙම ස්ථානයේ නොපැවැත්වනු ලැබූ හෙයින් මෙම ලිපිය ඉවත් කරන ලදී.

**03.04 සභා රැස්වීම් ශාලාව සඳහා කුෂන් පුටු 25ක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභා රැස්වීම් ශාලාව සඳහා අමුතන්ගේ කුෂන් පුටු 25ක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනවා . එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

සභා රැස්වීම් ශාලාව සඳහා අමුත්තන්ගේ කුෂන් පුටු 25ක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව එය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් එහි වහල පිළිසකර කිරීම පිළිබඳ ස්තුතිය පුදකිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ කුලරත්න පාරේ පිහිටි අප සංගමය මගින් පාලනය වන බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයේ වහල නගර සභාව මගින් පිලිසකර කිරිමට කටයුතු කර දීම පිළිබඳ අප සංගමයේ හෘදයාංගම ස්තුතිය මෙයින් පිරිනමන බවට සභාපති ධර්මසිරි ගිනිගේ , ලේකම් එගොඩගේ ජයසේන යන අය විසින් ප්‍රකාශ කර ලිපියක් ඒවා තිබෙනවා.එය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් එහි වහල පිළිසකර කිරීම පිළිබඳ ස්තුතිය පුදකිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.06 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මගින් නගර සභා නගරාධිපතිවරුන් සඳහා යෝජිත නිල කබාය සහ පළඳනාව පිළිබඳව දන්වා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයයි. නගර සභා නගරාධිපතිවරුන් සඳහා යෝජිත නිල කබාය සහ පළඳනාව පිළිබඳවයි.2019 සැප්තැම්බර් මස 21 වන දින ගම්පොල දී පැවති නගරාධිපතිවරුන්ගේ සම්මේලනයේදී නගර සභා නගරාධිපතිවරුන් සඳහා යෝජිත නිල කබාය සහ නිල පළඳනාව 2020 ජනවාරි මාසයේ සිට භාවිතා කිරීමට යෝජනා සම්මතයක් ගෙන එන ලදී.එය සම්ප්‍රදායක් පමණක් බවත් එයට නෛතික බාධාවක් නොමැති බව මේ පිළිබඳ නෛතික තත්ත්වය සොයා බැලීමේදී අපහට උපදෙස් ලැබිණ. එම යෝජනාව 2019 ඔක්තොම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී නැවතත් අනුමත කරන ලදී. ඒ අනුව 2020 ජනවාරි මස සිට සියලු සභා රැස්වීම් සඳහා නගර සභා සභාපතිවරු මෙම නිල කබාය භාවිතා කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා රිදියෙන් සකස් පළඳනාව ජාතික මෝස්තර සැලසුම් ශිල්පීන් ආයතනය විසින් සැලසුම් කර නගර සභා සම්මේලනයේ දී අනුමත කරන ලදී. රිදියෙන් තනන ලද අඟල් 35 දිග මෙම පළඳනාව සහ නිල කබාය සඳහා සම්පූර්ණ පිරිවැය රු.60000/= ( හැට දහසක් පමණි ) මේ සමඟ අමුණා ඇති නිළ ලාංඡනයේ මැද හිස් රවුම් සඳහා නගර සභාවේ නිල ලාංඡනය යොදා ගන්නා බැවින් නගර සභාවේ නිල ලාංඡනයේ පැහැදිලි ස්කෑන් ඡායාරූපයක් ඊමේල් මගින් එවන මෙන් ඉල්ලා ඇත.ඉහත සඳහන් මුදල ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන් ගේ සංසදයේ ලංකා බැංකු ගිණුම් අංක 0009330603 තැන්පත් කර ලදුපත අපට ෆැක්ස් හෝ ඊමේල් මගින් ලැබෙන්න සලස්වන මෙන් හේමන්ති ගුණසේකර ප්‍රධාන විධායක නිලධාරි - ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සංසදයේ ඉල්ලීමක් කර තිබෙනවා.නගර සභා සම්මෙලනය මඟින් නගර සභා සභාපතිවරුන් සඳහා නිල කබායක් පැළඳිය යුතු කියා එහි යෝජනාවක් සම්මත වෙලා තිබෙනවා.දැනට මෙය පළඳන්නේ මහ නගර සභා නගරාධිපතිවරු විතරයි. මොකක්ද මේ තත්ත්වය කියා බැලුවාම කිසිම පණතකින් සම්මත වෙච්ච දෙයක් නෙමේ. එය සම්ප්‍රදායක් වශයෙන් මහ නගර සභාවල පාවිච්චි කරනවා.ඒ අනුව නගර සභාවලත් ඒ වගේ ඇඳුමක් පාවිච්චි කරන්න කියා සභාපතිවරු විසින් යෝජනාවක් සම්මත කර තිබෙනවා.ඒ අනුව තමයි නිල ඇඳුමක් සකස් කර තිබෙන්නේ. මෙය මට විතරක් හදන පුද්ගලික එකක් නෙමේ. සභාවන් පාවිච්චි කරන එකක්. අවශ්‍ය නම් අපි ගන්න කියා කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩේනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය වැදගත් තීන්දුවක්. එයට පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තමයි නගරාධිපතිවරු අඳින්නේ සම්ප්‍රදායක් වශයෙනි.නිතියක් අනුව නෙමේ.මේ එකම නගර සභාවල සභාපතිවරුන්ටත් අඳින්න කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩේනව් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මෙයට අපි කිසි කෙනෙක් විරුද්ධ නැහැ.එය පළාත් පාලන කොමසාරිස් හරහා ඒ අය දැනුවත් කරලා. ඒ අනුමැතියත් ඇතිව එය පළදන්න.සභාවේ උත්තරීතර භාවය සඳහා.කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කැමතිනම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට මේ විදියත් හොඳයි. කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩේනව් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහි කිසි ප්‍රශ්නයක් නැහැ.ඒ මුදලේ ප්‍රශ්නයකුත් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම විතරක් නෙමේ මේ පුටුවේ වාඩිවෙන්නේ. මේ පුටුවේ වාඩිවෙන ඕනම කෙනෙකුට එය පළඳින්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩේනව් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මෙහි කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා එය පළඳින්න.ඔබතුමා මෙය පළාත් පාලන කොමසාරිස්තුමාට දැනුම් දෙන්න මෙන්න මෙහෙම දෙයක් ගෙන තිබෙනවා.අපි සභාවේ කවුරුත් ගරු මන්ත්‍රීවරු විරුද්ධ වෙන්නේ නැහැ. අපි ගරු මන්ත්‍රීවරු කවුරුත් එකඟයි.එමනිසා අපේ එකඟතාවය තිබෙනවා.කවුරුත් මෙයට විරුද්ධ වෙන එකක් නැහැ. නිත්‍යානුකූලව මේ වැඩේ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව කවුරුත් විරෝධතාවයක් තිබෙනවාද?රු.60000/= ක් ගෙවන්න වෙනවා.ඒ සඳහා එකඟයි. එය සම්මත වෙනවා.

**තීරණය-**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මඟින් නගර සභා නගරාධිපතිවරුන් සඳහා යෝජිත නිල කබාය සහ පළඳනාව 2020 ජනවාරි මාසයේ සිට භාවිතා කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නිත්‍යානුකූලව සිදු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩේනව් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.07 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණය වටා ඇති යකඩ වැට තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඉල්ලා කරන ලද ඉල්ලීමට අනුව එය ලබා දීම සම්බන්ධව ලිපිය සභාගත කරන ලදී.( සභා අනුමැතියට යටත්ව)**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පොල්වත්ත පියසේන ළමා ක්රිඩාංගණය වටා ඇති යකඩ වැට තීන්ත ආලේප කිරිම සඳහා අවශ්‍ය කාලය එළඹ ඇත. එම කාර්ය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුව පහත පරිදි වේ.

- ඇන්ටිකොරෝසිව් තීන්ත - ලීටර 20ක්
- එනමල් තීන්ත - ලීටර 20ක්
- තීනර් - ලීටර් 10
- 2 පින්සල් - 4

ඒ අනුව සහා අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා. එය අනුමත කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගණය වටා ඇති යකඩ වැට තීන්ත ආලේප කිරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහා අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- ඇන්ටිකොරෝසිව් තීන්ත - ලීටර 20ක්
- එනමල් තීන්ත - ලීටර 20ක්
- තීනර් - ලීටර් 10
- අඟල් 2 පින්සල් - 4

**03.08 වැඩ පරිපාලක හිමාල් මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලිම පරිදි කැනපි කූඩාරම් රෙදි අලුතින් ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.( අඩි 10*10 රෙක්සින් යාර 10ක් )**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ.ඩබ්.හිමාල් ගුණවර්ධන, වැඩ ක්ෂේත්‍ර පාරිපාලක මහතා විසින් කැනපි කූඩාරම් රෙදි අලුතින් ලබා ගැනීම සම්බන්ධවයි.අප සභාව සතු භාවිතා කරන කැනපි කූඩාරම් 10 සඳහා භාවිතා කරන රෙක්සින් රෙදි මේ වනවිට භාවිතා කිරිමට නොහැකි සේ ඉරී ගොස් ඇත. එම නිසා ඒ සඳහා අඩි 10*10 ප්‍රමාණයේ රෙක්සින් රෙදි වලින් අලුතින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙයට මා දෙයක් එකතු කරන්න කැමතියි.මා දුටුවා මළ ගෙදරකදි. ඒවා ඉරී තිබෙනවා. ලැජ්ජායි ඒවා නගර සභාවේ කියන්නත්.මට තේරෙනවා මේවා

ඉරෙන්නේ ප්‍රවාහනයේදි තමයි.ගරු සභාවක් පවත්වාගෙන යන විට කරුණාකරලා එයට සවන් දෙන්න.මේ චණ්ඩි වැඩක් නැහැ මෙතනට . අපිට මෙය කරගෙන යන්න දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි , ගරු මන්ත්‍රීතුමා කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

චණ්ඩි එපා මෙතනට.මෙතැන මේ සභාවක් කරගෙන යන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. වෙච්ච දේ මා දන්නේ නැහැ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දැන් මෙතැන වෙන කතාවක් යන්නේ.මේ කතා කරන්නේ කැනපි ගැන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපි කතා කළේ නැහැ.අපි සාධාරණයට කතා කරන්නේ.අපි ඕන්නම් සභාවෙන් නැගිටලා යන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාවේ කතා කරන්න. ඔබතුමාට අවස්ථාවක් ලබා දුන්නාම කතා කරන්න.අපි කතාව කරගෙන යන්න ඕන.මේ කැනපි ප්‍රවාහනය කරන කොට මේවා ඉරෙනවා.නැතිව වෙන විදියක් නැහැ ඉරෙන්න.එමනිසා මෙයට ප්‍රවාහනය කරන්න පුළුවන් විදියේ තහඩු පෙට්ටියක් ගසා මේවා දමා ප්‍රවාහනය කරන්න කියායි මා පවසන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

මේ කැනපි පිළිබඳව මට අදහසක් තිබෙනවා.තහඩු වලින් ටෙන්ට් කිහිපයක් සකස් කර ගත්තොත් එහෙම. මොකද මේ කැනපි රැගෙන ගිහින් ජනතාව බිම දමනවා, වතුරේ දමනවා.කිලිටි වෙනවා, ඉරෙනවා, නොයොකුත් ආකාරයේ කටයුතු සිදු වෙනවා. එම නිසා මෙය තහඩු වලින් අඩි 20*20 ආවරණය වන පරිදි තහඩු වලින් සකස් කරන ලෙස මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

එම අදහසට අපේ අනුමතිය නිසි අවසරය ලබා දෙන ගමන්ම වැඩ පරිපාලක මේ හිමාල් මහතා විසින් මේ කැනපි කූඩාරම් රෙදි පිළිබඳ ඉල්ලිම සත්‍ය වශයෙන්ම වැදගත් කළ යුතුම දෙයක්.මේ අවස්ථාවේ කිව යුතුයි මේ හිමාල් පරිපාලකවරයාගේ ක්‍රියා කලාපය නිසා අම්බලන්ගොඩ නගර සභාව නම් පරිපාලන ඒකකය බබළනවා කිව්වොත් එය නිවැරදියි.ඔහු කාර්යයන් වගේම ඇහෙනුත් වැඩ.දැන් එතුමා නොවන්නට නිතිඤ අරුණ ප්‍රදීප් නාමයට කැළල් ඇති වි හාමාරයි.නායකතුමනි , මා හිතන්නේ එවැනි නිලධාරින්

සුරැකිය යුතුයි.මා ඔබතුමාට යෝජනා කළා. ඔහුව මේ බරපතල කාර්යෙන් නිදහස් කරලා සැපයුම් වලට යොදවන්න කියා.නමුත් ඔබතුමා ඇහුම්කන් දුන්නේ නැහැ.ගරු සභාපතිතුමනි, මේ වන විටත් මා ඉහළ අමාත්‍යාංශයකින් මේ වන විටත් යාමට කටයුතු සුදානම් කරලා තිබෙන්නේ.මොකද එවැනි නිලධාරින් මහා ජාතික සම්පත්.එතුමා වැනි අය තැනට සුදුසු නුවණ පාවිච්චි කරලා . මේ දේ හොයා බලන්න. අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා යෝජනා කරනවා වඩාත් ආරක්ෂාකාරි වැඩ පිළිවළක් ගැන. ගරු මන්ත්‍රීතුමනි අපි කියන්න කැමතියි ඕනෑම බඩුවක් පාවිච්චි කිරිමේදි ක්ෂ වෙනවා.මේ ලෝකයේ සියළුම දේවල් අනියතයි.ඒ දහමට පිටුපාන්න කිසිවෙකුටත් නොහැකිමයි.එමනිසා එම් ක්ෂවිම් කාලයත් සමඟ සිද්ධ වෙන දේවල්.එතුමාගේ කැනපි රෙදි ටික ලබා දෙන්න. මේ ගරු මන්ත්‍රීතුමා  කියන තහඩු වැඩෙත් හරි අඟනේයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ කැනපි ගත්තොත් එහෙම කැනපිය ගහන්න තිබෙන තැනට අපිට තහඩු ගහන්න බැහැනේ.එතකොට අපිට තිබෙන පිළියම මේ කැනපිය ඩබල් කරන එක.කැනපිය පුළුවන් යට පැත්ත ඩබල් වෙන්න සුදු රෙද්දෙන්. උඩ පැත්ත පුළුවන් සුදු හෝ ඕන පාටක් ගන්න.එතකොට භාවිතා කරන්න පුළුවන් කාලය වැඩි වෙනවා.අපිට හදා ගැනීමේදි පොඩි මුදලක් වැඩියෙන් යයි.එතකොට පාවිච්චි කරන කාල පරිච්ඡේදය වැඩියි.එතකොට ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා කිවු පරිදි එම කැනපි සවි කිරිමේදි , ගැලවීමේදි , ප්‍රවාහනය කිරීමේදි ,ගබඩා කිරිමේදි අර නිසි ක්‍රමවේදය අනුගමනය කරානම් එය පාවිච්චි කරන්න පුළුවන්. නිසි ක්‍රමවේදයක් තිබේ.ගරු මන්ත්‍රීතුමා කිවු දෙයටත් අවධානය යොමු කරන්න. මුදල් වැඩිපුර ගියත් කමක් නැහැ.ඩබල් රෙදි දමන්න. මොකද කැනපි අවශ්‍යයි.හැම තැනම ටකරන් ගහන්න බැහැනේ. ටකරම ගැහුවාම කැතයි.කැනපිය ගහන්න ඕන තැන කැනපිය ගහන්න ඕන.එම නිසා කැනපි ටික හදන්න.අපි එයට මුදල ගියාට කමක් නැහැ. අර විදියට වැඩය කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඉතාම හොඳ යෝජනාවක්. ඒ වගේම අපට තිබෙන්නේ අඩි10*10 කැනපියි. මා ඉල්ලා සිටිනවා අඩි10*20 කැනපි 2ක් හෝ තුනක් හදන්න කියා. තහඩු වලින් හදනවානම් සුදු රෙද්දක් යටින් හරිගස්සන ලෙස ඉල්ලා සිටිනවා.ඒ වගේම අපේ තිබෙන පුටු ටිකක් බොහොම දිරා පත් වෙලා තිබෙන්නේ.මළ ගෙවල් වලට දෙන්න තව පුටු 300 - 400 ක් ගන්න .

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ යෝජනාව හොඳයි.සභාවෙන් අවසර ගන්න ඕන. තිබෙන කැනපි අළුත් වැඩියා කිරිමට රෙදි ලබා ගැනීමටත් , ඒවාට සුදු යටින් වියන් හදන්නත්, අපට සමහර මළ ගෙවල් වලදි භාවිතා කිරිමට ටිකක් දිග කැනපි අවශ්‍ය වෙන වේලාවල් තිබෙනවා.ඒ වගේම තහඩු වලින් ටෙන්ට් හා පුටු 300කුත් අවශ්‍යයි. උදාහරණයක් විදියට මේ ළඟදි මගේ නිවස අසළ මළ ගෙදරක් වුණා. අපේ හිටපු සිදත් මහතාගේ පියා නැතිවුණා. අම්බලන්ගොඩ නගර සභාවේ සියළු පුටු ටික මළ ගෙවල් වලට දිලා තිබුණා.එම ගෙදරට පුටු 100ක් දෙන්න නැති වුණා.අපි ලැජ්ජාවට පත්වෙනවා. අපේ නිවස ඉදිරිපස තිබෙන මළ ගෙදරට පුටු ටිකක්

දෙන්න නැති වෙනවා.එමනිසා අපි පුටු 300ක් අළුතින් ගන්න එක හොඳයි.අපි එකත් එක්කම ඇණවුම් කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ඒ සමගම කොඩි ටිකකුත් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.කොඩිත් ඔක්කොම සවුත්තු වෙලා. මඩ පාටයි. මා දැක්කේ මඩ පාට ඒවා.

**තීරණය-**

වැඩ පරිපාලක හිමාල් මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි කැනපි 10 ක් සඳහා අලුතින් අළුතින් රෙක්සින් රෙදි 10 ලබා ගැනීමටත් ඒවා සඳහා සුදු යටින් වියන් සැදීමටත් , 10*20 කැනපි 03කුත් ,අළුතින් තහඩුවලින් ටේනට් 03කුත් පුටු 300කුත් ඊට යටින් ලබා ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 අම්බලන්ගොඩ , කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ ගරු ආරියදේව ස්වාමින්වහන්සේ විසින් කඨින මහොත්සවය සඳහා 2019.10.20 දිනට කැනපි 02ක් හා පුටු 350ක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේ විසින් 2019 ඔක්තොබර් මස 20 වෙනිදා පැවැත්වෙන වාර්ෂික කඨින මහෝස්ත්වය සඳහා නගර සභාවේ ඇති ටෙන්ට් අඩි 50 ටෙන්ට් එකක්, කැනපි 02, පුටු 350 ක් , සින්ක් 02 ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටි. ඒ අනුව සින්ක් , හා තහඩු ටෙන්ට් නැහැ. අනික් ඒවා ලබා දුන්නා.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ , කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ ගරු ආරියදේව ස්වාමින්වහන්සේ විසින් කරන ලද ඉල්ලීමට අනුව කඨින මහොත්සවය සඳහා 2019.10.20 දිනට කැනපි 02ක් හා පුටු 350ක් සභා අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.10 අම්බලන්ගොඩ කෘෂිකර්ම උපදේශක මහත්මිය වන එම්.එච්.එම් ප්‍රියාශනි මහත්මිය විසින් උද්‍යාන විද්‍යා හා මල්වවන්නන්ගේ දෙවන කණ්ඩායම වාර්ෂික ප්‍රදර්ශනය සම්බන්ධව දැන්වීම් පුවරු 02ක් නොමිලේ ප්‍රදර්ශනය කිරිම සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එම්.එච්.එම්. ප්‍රියංගනී, ස්ථානභාර කෘෂිකර්ම උපදේශක . උද්‍යාන විද්‍යා හා මල්වවන්නන්ගේ II කණ්ඩායම වාර්ෂික ප්‍රදර්ශනය සම්බන්ධවයි.දකුණු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමය II කණ්ඩායම මඟින් පවත්වනු ලබන වාර්ෂික මල් ප්‍රදර්ශනය හා අලෙවි සැල 2019.12.27 සහ 28 දෙදින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එම ප්‍රදර්ශනයට අදාලව ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් අම්බලන්ගොඩ නගරයේ දැන්වීම් පුවරු 02 ක් නොමිලේ ප්‍රදර්ශනය කිරිමට අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් ඉල්ලා සිටි.

**තීරණය-**

අම්බලන්ගොඩ කෘෂිකර්ම උපදේශක මහත්මිය වන එම්.එච්.එම් ප්‍රියාශනි මහත්මිය විසින් උද්‍යාන විද්‍යා හා මල්වවන්නන්ගේ (දෙවන කණ්ඩායම) වාර්ෂික ප්‍රදර්ශනය සම්බන්ධව දැන්වීම් පුවරු 02ක් නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා අවසර ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල චන්ද්‍රාවාස මාවත පදිංචි කේ.ඩබ්. ඉන්ද්‍රජිත් මහතා විසින් මැණියන්ගේ අවමංගල්‍ය කටයුත්ත වෙනුවෙන් දැක්වූ සහායෝගයට ස්තුතිය පුදකිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, චන්ද්‍රාවාස මාවත , ජේ.ඩබ්.ඉන්ද්‍රජිත් මහතා විසින් තම මැණියන්ගේ අවමංගල්‍ය කටයුත්ත වෙනුවෙන් ශ්‍රමයෙන් , ද්‍රව්‍ය වලින් හා පැමිණ අප සමඟ ශෝකය බෙදා ගැනීම සම්බන්ධව දැක්වූ සහයෝගයට ගරු නගරාධිපතිතුමා ඇතුලු සියලුම නාගරික මන්ත්‍රීන් හා ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට මාගේ ශෝකාකුල ස්තුතිය පුදකර සිටිනවා. කියා දැන්වීමක් එවා තිබෙනවා. එය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල චන්ද්‍රාවාස මාවත පදිංචි කේ.ඩබ්. ඉන්ද්‍රජිත් මහතා විසින් මැණියන්ගේ අවමංගල්‍ය කටයුත්ත වෙනුවෙන් දැක්වූ සහායෝගයට ස්තුතිය පුදකිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැණිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.12 තණකොළ කපන යන්ත්‍රය (බ්‍රෂ් කටර් එක ) සම්බන්ධව වැඩ පරිපාලක මහතා විසින් කරන ලද ඉල්ලිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

වැඩ පරිපාලක ඒ.ඩබ්. හිමාල් මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. තණකොළ කපන යන්ත්‍රය ( බ්‍රෂ් කටර් එක ) සම්බන්ධවයි. අම්බලන්ගොඩ නගර සභාව සතු පැරණි බ්‍රෂ් කටර් තණකොළ කපන යන්ත්‍රය කිහිප වතාවක්ම නගර සභා ගරාජය තුළ අළුත් වැඩියා කර

පාවිච්චි කළ අතර නැවත වතාවක් අක්‍රිය තත්ත්වයට පත් වී අළුත් වැඩියා කරීම නොහැකි තත්ත්වයකට පත් වී ඇත. එම නිසා එය වෙනත් බුෂ් කටර් අළුත්වැඩියා කරන ස්ථානයට ගෙන ගොස් අළුත් වැඩියා කිරීමට උත්සාහ කල අතර එම ස්ථානයෙන් උපදෙස් ලැබුණේ මෙම යන්ත්‍රය අළුත් වැඩියා කිරීමට නොහැකි බවත් අවශ්‍ය අමතර කොටස් ද වෙළෙඳ පොලේ නොමැති බවය. මෙම තත්ත්වය මත අළුතින් තණකොළ කපන යන්ත්‍ර ( බුෂ් කටර් ) දෙකක් ලබා ගැනීම කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටී.

__ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, බුෂ් කටර් ගැන කතා කරන විට අපට තිබෙන මේ සංචිතය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ.මේ වන විට අපිනම් දුටුවේ එක කටර් එකක් පමණි. අනික් කටර් එක පොලිසියේද දන්නේ නැහැ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

බුෂ් කටර් 3ක් තිබෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

බුෂ් කටර් 03ක් තිබ්බට 03ක් පෙනෙන්න නැහැ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

නැහැ . නැහැ . තිබෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, පුටුවේ සිටගෙන තිබෙනවා කිවුවාට වැඩක් නැහැ.ගිහිල්ලා බැලුවාම නැහැ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

එකතමයි අළුතින් ගන්න කියන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

ඒසමඟම බුෂ්කටර් 05ක්වත් ගන්න අවශ්‍යයි කියා අපි කියනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

සේවකයොත් සිටිය යුතුයි ඒ වගේම.

__ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි,එම බුෂ් කටර් ගන්නා විට අලෙවියෙන් පසු අළුත් වැඩියා කටයුතු කළ හැකි ස්ථානයකින් ලබා ගැනීම හොඳයි. මිල ටිකක් වැඩි වුණත්. නැතිනම් මේවා ගෙන බඩු නැහැ කියා විසි කරලා දානවා. එහෙම දරන්න බැහැ. එම නිසා අලෙවියෙන් පසු අළුත් වැඩියා කිරීම කළ හැකි උපකරණ ගන්න.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මා දන්නේ නැහැ. ටෙන්ඩර් කරලානේ ගන්නේ. ටෙන්ඩර් එකෙදි අපගේ ගරු මන්ත්‍රිවරු එය බලන්න.ඒ කියන කතාවත් ඇත්ත. අලෙවියෙන් පසු සේවාවක් සැපයිය හැකි ආයතන වලින් ටෙන්ඩර් කරන්න. නැතිනම් බැහැනේ කරන්න.

**තීරණය-**

තණකොළ කපන යන්ත්‍රය (බ්‍රෂ් කටර් එක ) සම්බන්ධව වැඩ පරිපාලක මහතා විසින් බ්‍රෂ් කටර් 02ක් අලෙවියෙන් පසු සේවාව සපයන ආයතනයකින් අළුතින් ලබා ගැනීමට ටෙන්ඩර් කීරිම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි එස්.එම් සරත් චන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.13 පොදු වැඩසටහන් ඡායාරූප කිරිම සහ ඡායාරූප ඇල්ම සැකසිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

පොදු වැඩ සටහන් ඡායාරූප ගත කිරීම සහ ඡායරූප ඇල්බම් සැකසීම - 2019. අම්බලන්ගොඩ නගර සභාව මහජනතාවට සේවා සැපයීමේ පොදු වැඩසටහනේ නිරන්තර සිදු වන කාර්යයන් වන අතර එම වැඩසටහන් වල ඡායාරූප ලබා ගැනීම හා ඇල්බම සැකසීම සඳහා දැරිමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා රුපියල් 50,000/=ක වටිනාකමක් සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් ඉල්ලීමක් කර ඇත.

ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මේ අල්බම් සැකසීම පිළිබඳ වචන කිහිපයක් කිව යුතුයි. මෙවැනි ඇල්බම් සැකසීම පිළිබඳ රාජ්‍ය ආයතන තුළ ඇල්බම් ගොඩ ගහලා. අපි දකින්නේ මෙවැනි කාර්යයන් තුළදි අත්‍යවශ්‍ය ඡායාරූප කිහිපයක් ලබා ගැනීම ප්‍රමාණවත් බවයි.දැන් කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ අපට දැකිය හැකි සභාපති, ගම් සභාපති කාලයේ ඇල්බම් ගොඩ ගසා තිබෙනවා. කිසිවෙක් බලන්නේ නැහැ.ඒ ආසන්නතම සිදුවිම සිදුවූ කාලය තුළ දවසක් බලයි, දෙකයි බලයි. මෙවැනි ඇල්බමයකට රු 12000/= ක් රු.15000/= ක් යයි.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

නැහැ . එච්චර මුදලක් යන්නේ නැහැ.

ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්

එච්චර මුදලක් ගියාද නොගියාද කියා මා දන්නේ නැහැ. සමහර අය විශාල මුදලක් අයකරනවා.එතකොට එච්චර මුල්‍ය නාස්තියක් නොකර අවශ්‍ය අඩුම ඡායාරූප කිහිපයක් පමණක් ගොනු කිරිමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ මෙහේ අවශ්‍ය තාක්ෂණය භාවිතා කරලා වෙනමම පරිගණකයේ වෙබ් පිටුවක් හදලා මේවා ගබඩා කිරීමේ ක්‍රමයක් සකස් කරන්න.අම්බලන්ගොඩ නගර සභාව කියා ගසා එම ඡායාරූප ටික ඔක්කොම දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙකත් අනුමත කරන්න. මෙය අනුමත කරන්න කියන්නේ මේ අය සැරින් සැරේ එක එක උත්සව වලට ඡායාරූප කියා දමනවා.ඊට වඩා හොඳයි මේ වගේ දෙයක් අනුමත කර තිබෙනවා නම් ෆොටෝ ගන්න පුළුවනි. අපේ ගරු මන්ත්‍රීතුමා කිවුව පරිදි වෙනම් වෙබ් අඩවියක් සකස් කළාම එයට ගිහාම එය බැලිය හැකියි.ඒ උත්සවය දිනය සමඟ ඇතුළත් කරන්න. ඡායාරූප කරන්න අපි වෙනම කැමරාවක් ගත්තා.එතකොට

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇල්බම් හදන්න නෙමේ . අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ ඉතාමත් කලෝචිත දෙයකි මේ තාක්ෂණයත් සමඟ.ගරු මන්ත්‍රීතුමා කිවුවේ නගර සභා වෙබ් සයිඩ් එකට ඇතුලත් වුණාම ඒ දිනයත් සමඟ දැම්මාව බලන්න පුළුවනි. ඡායරූප ගැනීමට කැමරාවක් ගන්න තීරණය කලානේ.එතකොට ඡායරූප ටික ගත්තා. ඒවා වෙබ් එකට දැමිය හැකිය. එතකොට ඒවා මුද්‍රණ ලබා ගැනීම අවශ්‍ය නැහැ.එතකොට ඔබතුමාට මොකක් හරි හදිස්සියකට ජායරූප ගන්න අවශ්‍ය නම් අපේ කැමරාවෙන් ගත හැකියි. ඒ විදියට එය අනුමත කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය රු50000/= ක වෙනම අනුමත කරන ලෙස ඉල්ලා සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි කැමරාවක් ගත්තා නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තවම නැහැ.ගන්න යෝජනා කළා. තවම ටෙන්ඩර් කළේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එතකොට මෙකට රු.50000/=ක් අවශ්‍ය නැහැ. කැමරාවක් ගත්තා නම්.ලක්ෂ 2ක 3 ද යන්නේ හොඳම කැමරාවක් ගන්න.ආයේ බාල කැමරාවක් ගන්න එපා. ගන්න හොඳ කැමරාවක්. ටෙන්ඩර් ගෙන්වන්න. හොඳ කැමරාවක් ගන්න.ලෙන්ත් තියෙන. එතකොට අපිට රු.50000/= ක් වෙන්කර තියන්න ඕන නැහැ ඡායාරූප ගැනීමට.කැමරාව තිබෙනවා. අපි ඡායාරූප ගන්නවා. එය වෙබ් එකට දානවා. අමතර මුදලක් ලබා දෙන්න අපට අවශ්‍ය නැහැ. මා යෝජනා කරනවා ටෙන්ඩර් පත් කැඳවන්න.හොඳම කැමරාවක් ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉදිරියට කැඳවන්න තිබෙන්නේ ටෙන්ඩර් පත්.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එච්චර විශාල මුදලක කැමරාවක් ගන්නවා නම් ඒම වැඩය කරන කෙනාට පොඩි පුහුණුවකුත් ලබා දී ගත්තා නම් හොඳයි. වටිනා කැමරාවක් නිසා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මා නම් දකින්නේ මෙච්චර මුදලකට කැමරාවක් ගැනිම නිෂ්ඵල වැඩක් කියා. මාස 2කට 3කට සැරයක් තමයි උත්සවයක් එන්නේ.දැන් මේ ඕනම ජංගම දූරකථනයකින් ඡායාරූපයක් ගත හැකියි.මානමාලියකට අන්දන තැනක් නෙමේනේ මෙතන.ඔච්චර ෆොටෝ ගන්න. ජාතික අපරාදයක්.හොඳ කැමරාවක් ලක්ෂ ගාණක් වෙනවා.සාමාන්‍යයෙන් එම ඡායාරූප ගන්නා පුද්ගලයෙකුට කියා ෆොටෝ ටික ගන්න එකනේ වෙනදාත් අපි කළේ.ඔය පවත්වාගෙන යාමේදි පත්ගස් බැඳෙනවා . එය පවත්වාගෙන යාම කරන්න බැහැ.කැමරා අවාට ගියාට පව්ච්චි කරන්න බැහැ.මන් දන්නේ නැහැ දෙවරක් හිතා බලන්න. මෙය කරනවාද කියා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ අදහසට මා ගරු කරනවා.ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කිව්වේ වැරදි චේතනාවකින් නෙමේ. දැන් මේ කැමරාවක් මිලදී ගෙන ඡායාරූපාගාරයක් වගේ අපේ ආයතනය පවත්වාගත යුතු නැහැ.ඔය කිවුවා වගේ කැමරා සහිත ජංගම දූරකථනයකින් අද ඕනැම මාදිලියේ ඡායාරූපයක් ලබා ගත හැකිය. අනවශ්‍ය මුදල් නාස්තියක් නොකර අපේ එම කාර්ය ඒ විදියට කර ගන්නවානම් හොඳ බව තමයි මගේ අදහස.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි කැමරාවක් ගැනිම සඳහා යෝජනා සම්මත වෙලා තිබෙන්නේ. අපි විශාල මුදලක් වැය කර කැමරාවක් ගැනීමට අවශ්‍ය නැහැ. අපිට අවශ්‍ය වන්නේ අපේ සංවර්ධන වැඩ කටයුතු වල ඡායාරූප ගැනිම පමණයි. එය අපි ඉදිරියට කරනවා.මෙම ඡායාරූප ගැනීම එම ශිල්පියා සමඟ ඔහුට තිබෙන හැකියාව සමඟ වෙනස් වෙනවා. එය වඩා හොඳයි විශේෂඥ දැනුම තිබෙන කෙනෙකු ලවා ඒ ටික කර ගන්න එක. අපිට ඔය ඇල්බමයක් හදන්න එක උත්සවයකවත් රු.5000/= ක් රු.6000/= ක් වැයවෙලා නැහැ. අපිට එම මුදලත් සමඟ බැලුවාම කමක් නැහැ එම ගණන වියදම් වුණාට. සාමාන්‍යයෙන් පරණ කරන ලද විදියට අපි කරන්නම්.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව මහජනතාවට සේවා සැපයීමේ පොදු වැඩසටහන් නිරන්තර සිදුවන කාර්යයක් වන අතර එම වැඩසටහන් වල ඡායාරූප ලබා ගැනීම හා ඇල්බම් සැකසීම සඳහා දැරිමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා රු.50000/= ක වටිනාකමක් සඳහා අනුමැතිය ලබා දිම සඳහා සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 අම්/නස/01/12/56 ලිපිගොනුව යටතේ PC062017 දරණ කාර්යාලයේ ප්‍රයෝජනයට ගන්නා ඡායාපිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

**අප කාර්යාලයේ ප්‍රයෝජනයට ගන්නා ඡායාරූප යන්ත්‍රිය අළුත් වැඩියා කටයුතු කිරිමට අනුමැතියට අනුව අළුත්වැඩියා සඳහා කරන ලද දුරකථන දැනම් දීමට අනුව පැමිණ පරික්ෂා කිරිමෙන් පසුව Jhon Keels ආයතනය මගින් 2019 අගොස්තු 30 වන දින ඇස්තමේන්තු අංක 4766 දරණ ඇස්තමේන්තුවෙන් අදාල කොටස් අලුතින් සවි කිරිම සඳහා රු.62428.90 ක ඇස්තමේන්තු බිල්පතක් ලබා දී ඇත. ඒ අනුව එම ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සඳහා ඇස්තමේන්තු අනුමැතිය ඉල්ලා සිටිනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

**මෙය නිර්දේශ දමා තිබෙන්නේ කවුද ?**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

**මෙහි නිර්දේශ දමා තිබෙන්නේ තොරතුරු තාක්ෂණ නිලධාරිණි නිලන්ති මහත්මිය විසින්. එය අනුමතයි.**

**තීරණය-**

අම්/නස/01/12/56 ලිපිගොනුව යටතේ PC062017 දරණ කාර්යාලයේ ප්‍රයෝජනයට ගන්නා ඡායාපිටපත් යන්ත්‍රය රු.62428.90 ක මුදලකට අලුත්වැඩියා කිරිම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 තක්සේරු දෙපාර්තමේන්තුව වරිපනම් විරෝධතා පරික්ෂණයේදි සහන ලබාගැනිම සඳහා ඉදිරිපත්වු අයගෙන් සහන ලබා දිය යුතු නාමලේඛණය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

03.15 පසුව ලබන සභාවට ඉදිරිපත් කරනවා.

**තීරණය-**

තක්සේරු දෙපාර්තමේන්තුව වරිපනම් විරෝධතා පරික්ෂණයේදි සහන ලබාගැනිම සඳහා ඉදිරිපත්වූ අයගෙන් සහන ලබා දිය යුතු නාමලේඛණය සම්බන්ධ ලිපිය ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.16 2020 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම . එය ඉදිරිපත් කරනවා. එම දැන්වීම පුවත්පතේ පළ කරලා ලබන සභාවට ඔවුන් ලියාපදිංචිය කරනවා.

**තීරණය-**

2020 වර්ෂයට අදාළව නගර සභාවේ වැඩ හා සේවා සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට දැනුවත් කිරීමේ නිවේදනය සැපයුම්කරුවන් වෙත දැනුවත් වීමට තෛභාෂාවෙන් රජයේ පුවත්පත් වල පළ කිරීම සුදුසු බවටත් එය ලබන සභාවට ඉදිරිපත් කරන බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.17 ආපදා කළමනාකරණය පිළිබඳව වු ස්ථාවර කාරක සභා රැස්වීම් වාර්තාව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ආපදා කළමනාකරණය පිළිබඳව වු ස්ථාවර කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරනවා. බොහොම කෙටි වාර්තාවක් තිබෙන්නේ. පිටපත් ලබා දුන්නාද? මෙයට සහභාගි වී තිබෙනවා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා යන අය සහභාගි වෙලා තිබෙනවා. මේ දිනවල පවතින අයපහත් කාලගුණික තත්ත්වය නිසා පිඩාවට පත්වන ජනතාව ගැන සැලකිල්ලට ගනිමින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරිමෙන් පසු ජනතාවට සහන සැලසිම සඳහාත් ඒ පිළිබඳව අනුමතිය ලබා දීම සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ ආපදා කළමනාකරණය පිළිබඳව වු ස්ථාවර කාරක සභාව රැස්වුණි. ස්ථාවර කාරක සභාව සඳහා වු අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සාකච්ඡා කළ අතර අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය වන පෝරඹ , කෙරමිණිය , පනියන්දුව , මහ අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ , පොල්වත්ත යන කොට්ඨාශ වල පවුල් 100 කට වැඩිය ජල ගැලිමට ලක් වි පිඩාවට පත්විය. එම අපදාවට ලක්වු පවුල් සඳහා ආහාර පාන ලබා දීම සුදුසු බවට යෝජනා ස්ථිර විය. එම ආපදා කළමනාකරණ ස්ථාවර කාරක සභාවට පැවරි ඇති බලතල ප්‍රකාරව රු.500000/= කට උපරිමයකට යටත්ව

වියදම් දැරීමට අනුමත කර තිබෙනවා එම අවස්ථාවේදී.අය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය අනුමත කරන ලද දිනය හා වියදම් කරන ලද දිනය අතර පරතරයක් තිබෙනවා.මා කැමති නැහැ. බොරුවට අත ඔසවන්න. ඕවා ඔක්කොම වුණාට පසු තමයි මේ කාරක සභාව රැස්වුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනුමත කරපු දිනයේ ප්‍රශ්නයක් තිබෙනවා කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කාරක සභාව රැස්වුණේ ඔක්කොම වියදම් වුණාට පසුවයි.මේ කමිටුව රැස්වුණේ ඔක්කොම වුණාට පසුවයි. ඒ තින්දුව ඉදිරියටයි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඔබතුමාත් රැස්විමට පැමිණ තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>.**

මා එකඟයි. හැබැයි මේ තින්දුව ගනු ලැබුවේ ඒ ඔක්කොම සිදු වුණාට පසු.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හදිස්සි ආපදාවකදි ඒ වේලාවට ඔබතුමලාට ඒ වගේ තින්දු ගන්න වෙනවා.ජනතාවට සහන දෙන්න එපැයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>.**

මා ප්‍රකාශ කරන්නේ මේ දිනවල පරස් පරයක් තිබෙනවා කියා. මේ ක්‍රියාදාමය සිද්ධ වුණාට පසු තමයි මේ කමිටුව රැස්වෙලා මෙය අනුමත කරන්නේ.එකයි එක කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ වගේ අවස්ථාවකදි ගංවතුරක් එනවා කියන එක කලින් තීරණය කරන්න බැහැ.ඒ ගංවතුරක් ආවම ගන්න තින්දුව පිළිබඳ අපි සභාවෙන් බලය පවරා තිබෙනවා. ඒ සභාවෙන් බලය පැවරුවාම ඒ අවස්ථාවේ ආපදා පිළිබඳ ස්ථාවර කාරක සභාව ස්වේච්චාවෙන් ඉදිරිපත් වෙලා මේ කටයුත්ත සිදු කිරිම ගැන මා කියන්නේ සියළුම ගරු මන්ත්‍රිවරුන්ට ස්තුති වන්ත විය යුතුයි. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහන සලසන්න ඉස්සෙල්ලා ඒ අවස්ථාවේ ගමට ගිහින් ජනතාවට සහනය සැලැස්සුවා. ඒ අවස්ථාවේ මා හිටියේ නැහැ. නමුත් අපේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා යන අය තමන්ගේ වගකිම වශයෙන් එකතුවෙලා මේ

කටයුත්ත කිරිම ගැන මා විශේෂයෙන් ස්තුති වන්ත වෙනවා.වාර්තාවේ දිනය පිළිබඳව තිබෙනවා නම් දිනය වෙනස් කර හරි මෙය අනුමත කරන්න.දිනය වෙනස් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>.

ගරු සභාපතිතුමනි. තව පොඩි කාරණයක් තිබෙනවා.අපි දැන් දින දෙකක් හරි තුනක් හරි තමයි මේ කටයුත්ත සිදු කළේ.ඉන්පසුවත් ගංවතුරට යටවෙලා හිටිය ජනතාව හිටියා.ඒ ගොල්ලන්ට එහෙම සැලකිමක් කළේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා , දැන් මේ ආපදා අවස්ථාව අපි සභාවෙන් අනුමත කර ගත්තේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට , ග්‍රාමසේවක මහතුන්ට ඒ නියෝග ලැබිලා ජනතාවට සහන සලස්වන්න දින දෙක තුනක් යනවා. එවිට අපගේ ජනතාව පිඩනයට පත්වෙලා ඉවරයි.ජනතාව ගංවතුරට යටවෙලා කන්න නැතිව සිටිනවා.ඒ දින දෙක තුන තුල කටයුතු කිරිම අපගේ වගකිමකි.ඒ මුලික වගකිමකි. ඒ තමයි අපි මේ කර තිබෙන්නේ.රජයෙන් එයට මැදිහත් වෙන්න ඉස්සර වෙලා වහාම අම්බලන්ගොඩ නගර සභාව අපේ ජනතාවට පිඩනයට පත් වෙච්ච ජනතාවට අපි සහන සලසා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙන්න ඕන. කිසිම වරදක් නැහැ.තුන්වෙනි දිනයෙන් පසු ඇත්තටම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එය භාර ගත්තා.ඊට පසු අපිට ප්‍රශ්නයක් නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>.

ඊට පසුවත් මා ඒ ප්‍රදේශවල ඇවිද බැලුවා. නමුත් ඒ අය කියනවා අපට නගර සභාවෙන් ඒ දින දෙක තුනක් දුන්නා.ඉන්පසු කිසි කෙනෙකුගේ සරණක් නැහැ කියා තමයි ඒ අය අපට චෝදනාවක් කළා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමනි, ගරු සභාපතිතුමා කිවු ප්‍රකාශය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ඒ වන විට ලොකු මුදලක් වෙන්වෙලා තිබුණා.ඊට අමතරව අපේ ලේකම්තුමිය කැඳවලා මැතිවරණ ලේකම්තුමිය කාර්යාලයෙන් කියා තිබුණා. මෙය නතර කරන්න කියා. ලේකම්තුමිය වෙනුවට අපේ ප්‍රධාන කළමනාකරණ සහකාර තමයි එයට සහභාගි වුයේ.හේතුව මෙය දේශපාලන වාසි ලබා ගැනිම මත මෙය නතර කරන්න කිවුවා.විශේෂයෙන් මතක් කරන්න ඕන තුන්වෙනි දින සභාවෙන් මුදල් වියදම් කළේ නැහැ. ඒ වෙනුවට ලලිත් හැලඹගේ මහතා තමයි ඒ වෙනුවට සහායෝගය ලබා දුන්නේ.එයයි තව දෙන්නා තුන්දෙනෙක් එක්ක.ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා හා මා අපි දෙන්නා අතින් මුදල් වියදම් කර උදේ කෑම අරගෙන දුන්නේ. ප්රාදේශිය ලේකම් කාර්යාලයට මුදල් වෙන් කරලා තිබියදි අපිට මුදල් වියදම් කරන්න බැරි කියන ප්‍රශ්න තමයි ලේකම්තුමිය කියා සිටියේ.ඒ අනුව තමයි එය නතර කරන්න සිද්ධ වුණේ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**.

ගරු සභාපතිතුමනි, මේ ගැන තවත් වාද කිරිම අනවශ්‍යයි මා සිතන්නේ.මේ අවස්ථාවේදි අපේ තරුණ බල මුළුව පාරට බස්සපු අපේ ගරු උප සභාපතිතුමාට ප්‍රණාමය හිමි වුණා. මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතා කරුණු හරියට අනවබෝධය නිසා වෙනත් අතුරු ප්‍රශ්නයක් නැගුවේ.තව වාද කිරිම අපගේ වේලාව කා දැමීමක්.මා අනවබෝධයකින් නෙමේ කතා කළේ.මා පැහැදිලි අවබෝධයකින් කතා කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**.

මා නෙමේ අනවබෝධයෙන් කතා කරන්නේ. ඔබතුමා තමයි අනවබොධයෙන් කතා කරන්නේ.එක තේරුම් ගන්න.ගංවතුරෙන් පසු මා ගියාම ඒ ප්‍රදේශවලට තවමත් ඒ ජනතාව යටවෙලා සිටිනවා ගංවතුරෙන්.සත්‍ය කතාව එකයි.නගර සභාවෙන් මැතිවරණ ඉලක්ක කරගෙන ඒවාට අල්ලස් දෙනවා කියපු නිසා මා තුන්වෙනි දින ආවේ නැහැ.දවස් දෙකක් මා පැමිණියා.ඔය අල්ලස් කතා මැතිවරණ කතාවලට මා කැමති නැහැ.නමුත් අපේ හෘදයාංගම කැමැත්ත වුයේ මෙයට.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා මැතිවරණ අල්ලසක් නැහැ. මෙයට අපේ කට්ටියත් එකතු වුණා. එක්සත් ජාතික පක්ෂයේ අයත් එකතු වුණා.ඔබතුමාත් එකතු වුණා.හැමදෙනාම එකතු වුණා. වෙන පක්ෂයක් නැහැ.හැමදෙනාම පක්ෂ සියල්ලම එකතු වුණා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**.

මා මෙය දැක්වුයේ ඉන්පසු කිසිම පිළිසරණක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එක දෙයක් කැපි පෙනෙන්න අප සභාවෙන් කර තිබුණා. අපේ සභාවෙන් එම කෑම පැකට් එකේ අපේ දින මුද්‍රාව තබා තිබුණා.එය ගසා තිබුණේ මෙය මෙම දිනයේ සාදන ලද කෑම එකක් කියා. එහෙම නැතිව වෙන දෙයක් නෙමේ. එය ගැසිම හැර වෙන දෙයක් කර තිබුණේ නැහැ. එම කරන ලද සත්කාරයට ඇත්තටම හවුල් වුණා ගරු මන්ත්‍රිතුමලා.ඒ වගේම අපේ සේවකයෝ ස්වෙච්ඡාවෙන් ඇවිත් ඒවා පිළියෙල කරලා බෙදලා එය කළ සියළුම දෙනාට මාගේ ස්තුතිය පුද කරනවා.

**තීරණය-**

ආපදා කළමනාකරණය පිළිබඳව වු ස්ථාවර කාරක සභා රැස්විම් වාර්තාව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී

**03.18 අම්බලන්ගොඩ නගර සභාවට අයත් බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර මසික කුලිය තක්සේරු කිරිම පිළිබඳ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

**මෙය මා ඊ ළඟ සභාවට යොමු කරනවා.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර මසික කුලිය තක්සේරු කිරිම පිළිබඳ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද ලිපිය ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.19 2019.11.01 දින ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ රැස්වීමේ සැරසිලි කටයුතු සඳහා කොඩිකණු 50ක් නොමිලේ ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නගර සභා කොඩි , පුටු බදු දීම. ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ඉල්ලා තිබෙනවා අපෙන් කොඩි කණු 100ක් නොමිලේ ලබා දෙන්න කියා. එය ලබා දි තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුව මහතා කතා කරමින්**.

නැහැ 50ක් පමණයි ලබා දුන්නේ. අපි කලිනුත් කතා වුණා. පුටු ටික ගන්නවා වගේම කොඩි කණු 100කුත් ගෙන මේ කොඩි කණු ටික වැඩි කර ගන්න. ගන්නවා කිවුවාට අපි අර ගත්තේ නැහැ.මා කියන්නේ මළ ගෙවල් 4ක් 5ක් අවොත් අපට කොඩි කණු දෙන්න බැහැ.තව කොඩි 100ක් හරි 150ක් හරි ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**.

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**

2019.11.01 දින ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ රැස්වීමේ සැරසිලි කටයුතු සඳහා කොඩිකණු 50ක් නොමිලේ ලබා දීම සුදුසු බවටත් , කොඩි කණු 100කි සැකසිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.20 අම්බලන්ගොඩ, වතුගෙදර ශ්‍රී ආනන්දාරාම විහාරස්ථානයේ බෝ මළුවෙහි පස් තැලීමට පොඩි ගල්රෝල ලබා ගැනිම සඳහා කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මිලගට ශ්‍රී ආනන්දාරාම විහාරස්ථානය , වතුගෙදර . පොඩි ගල්රෝල ලබා ගැනීම. සංවර්ධනය කරමින් පවතින අප විහාරස්ථානයේ බෝමළුව සැකසීම සඳහා එහි ඇති පස් තට්ටුව මට්ටමකට තලා ගැනීමට පොඩි ගල්රෝල අවශ්‍ය වී ඇත. ඒ අනුව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර මෙය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආවරණ අනුමැතියට යටත්ව ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ  මහතා කතා කරමින්</u>**.

ගරු සභාපතිතුමනි, මෙම විහාරස්ථාන , බෝධිමළු ඒ විවිධ සුපිංකම් වෙනුවෙන් මේ දායකත්ව සැපයීම පිං වඩවන කටයුත්තක්.අපේ ලේකම්තුමියත් හොඳටම දන්නවා.මේ වනවිට මා වැලි ට්‍රිපර් 50ක් 60ක් ලබා දි තිබෙනවා මෙම විහාරස්ථාන වලට. ඊයෙත් ආවා අපේ ධම්මවිනිත ස්වාමීන් වහන්සේ. මා විමුක්තිට කියා මාගේ පුද්ගලික මුදල් වලින් වැලි ට්‍රිපර් 03ක් ලබා දුන්නා. මාත් දුප්පත් මිනිසෙක්.ඒ හාස්කමකින්දෝ මට එන්න එන්න ජනතාව වැඩි වෙනවා.වැලි කැට ගණනට ජනතාව එකතු වෙනවා.එම නිසා ඉදිරියේදි ඔබතුමාගේ ඉලක්කය ජය ගන්න මේ වැලිදෙන එක බෝමළු සංවර්ධනය කරන එක දිගටම කරගෙන යන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගැටළුව වෙල තිබෙන්නේ අම්බලන්ගොඩ ඒවාට බොහොම අඩුවෙන් දි තිබෙන්නේ. එතුමාගේ වැඩ පිළිවෙළ හොඳයි. මා ළඟදි විහාරස්ථානයකට ගියා.ගොඩක් දුර විහාරස්ථානයක්. මේ ඇත්කඳුර පැත්තේ.ගියාට පසු ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතාට පිං දුන්නා එම ස්වාමීන් වහන්සේ. මා ස්වාමීන් වහන්සේගෙන් මේ ගැන විමසුවා. වැලි කියුබ් 03ක් ලබා දීලා එම විහාරස්ථානයට.

තීරණය-

අම්බලන්ගොඩ, වතුගෙදර ශ්‍රී ආනන්දාරාම විහාරස්ථානයේ බෝ මළුවෙහි පස් තැලීමට පොඩි ගල්රෝල ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.21 2019.09.12 දින අම්බලන්ගොඩ , පනියන්දුව පාර , 61/16D හි පදිංචි ජී. නන්දනි මහත්මිය විසින් ඉහත ලිපිනයේ සඳහන් ගොඩනැගිල්ලට ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා නගර සභාව වෙත ගෙවන ලද මුදල නිදහස් කරන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.09.12 දින අම්බලන්ගොඩ , පනියන්දුව පාර , 61/16D හි පදිංචි ජී. නන්දනි මහත්මිය විසින් කරන ලද ඉල්ලිමට අනුව ස්ථානිය පරික්ෂණයක් කරන ලදී. ඒ අනුව 61/16 D ජල සම්පාදනයක් ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ලබා දී ඇති වාර්තාව

අනුව පාර පළුදු කිරිමේ තාර පාර පළුදු කිරිමක් සිදු නොකර ඇති බව නිරික්ෂණය විය . ඒ අනුව මාර්ගය පළුදු කර ඇත්තේ මිටර් 0.5 ප්‍රමාණයක් පමණි. ඒ පළුදු කර ඇති කොටසට නගර සභාවෙන් අයවිය යුතු මුදල රු.930/= කි. ඒ අනුව මෙම ඇස්තමේන්තුව අනුව එම මහත්මිය රු.7626/= ක් ගෙවා ඇත. ඒ අනුව දැනට මාර්ග පළුදුව කර ඇති මුදල් පමණක් රඳවා ගෙන සභාවේ අනුමැතිය ලබාගෙන එම මුදල නිදහස් කිරිම සුදුසු බව කියා තිබෙනවා. ඒ අනුව එම තැනැත්තාට ගෙවිය යුතු මුදල රු7626/=කි. ලබා ගත යුතු මුදල රු.930/= කි. නැවත ගෙවිය යුතු මුදල රු6626ක් ගෙවන්න සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.ඒ වගේම ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයට දන්වා යවන්න නැවත නැවත මේවා වෙනස් කර එවන්න එපා කියා. අපිට එය හරි කරදරයක්.ඇත්තටම මා නම් මෙය ප්‍රතික්ෂේප කළා. නැවත වරක් මෙය දැමු නිසා ඉදිරිපත් කළේ . මොකද ජල සම්පාදන මණ්ඩලයෙන් අපට පැහැදිලි සැලැස්මක් ලබා දි තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>.

ඒ කියන්නේ ජල සම්පාදන මණ්ඩලයේ සැලැස්මට අනුව නෙමෙද වැඩය කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම සැලැස්මට අනුව අපි අය කර තිබෙනවා.ජල සම්පාදන මණ්ඩලයෙන් අපට දැනුම් දි තිබෙනවා මේ කඩන ප්‍රමාණය කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>.

ගරු සභාපතිතුමනි, මේ නිලධාරින් මාරුවෙලා සමහර නිලධාරින් දන්නේ නැහැ . එම සෙප්ටික් සැපයුම තිබෙන තැන.එයට ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයටත් කරන්න දෙයක් නැහැ. ඔය වරද හැම තැනම සිද්ද වෙනවා.වරදක් සිද්ධ වෙනවා. ඒ අය එතැනට ගිහින් බලා මෙන්න මෙතැන තමයි කඩන්නේ කියා මෙය අදින්නේ. එතනදි පොඩි දළ ඇස්තමෙන්තුවක් ඉදිරිපත් කරනවා.එතනදි පොඩි පොඩි වෙනස්කම් සිද්ධ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>.

ගරු සභාපතිතුමනි, දැන් ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාගේ උද්යෝගය නිසා පනියන්දුව පාර හැදුවා. කාපට් කළා. දැන් එහි කපලා තිබෙනවා වළක් හාරා කට්ටයක්. එතකොට මෙයට අදාළ මුදල් අයකරන්න ඇති. මොකක් හරි ආයතනයකින් මෙයට මුදල් අය කරනවා. නමුත් එම වළ වසා නැහැ. මාර්ග අනතුරු විය හැකියි ඔතැන.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>.

එය වහන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

බොහොම ස්තුතියි . ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා

- පෙරවරු 10.45 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මුහුදු වෙරළ පාරේ ඉතාම භායනක තත්ත්වයක් තිබෙන්නේ. කාපට් දමන්න තිබෙන්නේ.එම කාපට් වෙනම ගෙන්වන්න ඕන. එම නිසා ඊයේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කර තිබුණ නිසා මා ෆැක්ස් මඟින් එය ගෙන්වා ගන්නවා.එය මේ ළඟ පාත තිබෙන එකම ආයතනය.ඒ මතුගම ඇස්සස් ආයතනයෙන්. එයත් මේ සමඟ ඉදිරිපත් කරනවා.

**තීරණය-**

2019.09.12 දින අම්බලන්ගොඩ , පනියන්දුව පාර , 61/16D හි පදිංචි ජී. නන්දනි මහත්මිය විසින් ඉහත ලිපිනයේ සඳහන් ගොඩනැගිල්ලට ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා නගර සභාව වෙත ගෙවන ලද මුදලින් මාර්ගය පළුදුව සඳහා අයවිය යුතු ගාස්තුව පමණක් රඳවාගෙන අනෙක් මුදල් ගෙවීමටත් ( රු.6669/= ක්) , මේ සඳහා පාර පළුදු කිරිම සඳහා සකස් කරනු ලබන ඇස්තමේන්තු වල වටිනාකම නිසියාකාරව සඳහන් කර එවන ලෙසට ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය වෙත දන්වා යැවීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.22 2019 අගොස්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වාර්තාව සහගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 අගොස්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වාර්තාව ඉදිරිපත් කරනවා.ආයතනය විවෘතව තැබූ දින ගණන 21 ½ , රෝගීන් සංඛ්‍යාව 305,මාසික සඳහා ඖෂධ වල වටිනාකම රු.29286.57 කි. එක් රෝගියෙකු සඳහා රු.96/= ක් වැය කර තිබෙනවා.

**තීරණය-**

2019 අගොස්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වාර්තාව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදි.

## 03.23 2019 වර්ෂයේ ජාතික කියවීමේ මාසයේ වියදම් විශ්ලේෂණ වාර්තාව සහගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 වර්ෂයේ ජාතික කියවීමේ මාසයේ වියදම් විශ්ලේෂණ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. මෙහි පිටපත් ලබා දුන්නාද? මෙහි පිටපත් ලබා දෙන්න. මෙච්චර ගොඩක් කියවන්න බැහැ.මෙහි පිටපත ගණනේ ලබා දෙන්න හැමෝටම.

තීරණය-

2019 ජාතික කියවීමේ මාසය වියදම් ඇස්තමේන්තු විශ්ලේෂණය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදි.

**03.24 ගරු අග්‍රමාත්‍යතුමා ඇතුළු පිරිස පැමිණෙන හෙලිකොප්ටරය ගොඩබැස්සවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු විපක්ෂ නායක ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කර තිබෙන ගරු අග්‍රමාත්‍යතුමා ඇතුළු පිරිස පැමිණෙන හෙලිකොප්ටරය ගොඩබැස්සවීම. අම්බලන්ගොඩ 2019.11.01 දින පැවැත්වෙන ජන හමුව සඳහා ගරු අග්‍රමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සමඟ පැමිණෙන පිරිස පැමිණෙන හෙලිකොප්ටරය ගොඩබැස්ස වීමට ඒ සඳහා දක්වන ලද උනන්දුව ඉතා අභය කොට සලකනවා. එම නිසා ගරු අග්‍රමාත්‍යවරයා පැමිණෙන උත්සවයක් බැවින් ගාස්තු අයකිරිමකින් තොරව එය ලබා දී තිබෙනවා.ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. අපේ ක්‍රිඩා භාර නිලධාරි කෝ. ඇත්තටම වැඩියි ගණන.කෝ අශෝක මහතා ඉන්නවාද? කලින් අපේ සභාව තින්දු කළේ රු.1000/= ක් ගන්න. මා දන්නේ නැහැ එය නිලධාරින් පාලනය කරන කාලේ මේවා ගාස්තු වැඩ කර තිබෙන්නේ. අයවැයට මෙය රු.1000/=ක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**.

මොන රජයේ වුණත් රාජ්‍ය නායකයෙක් තමයි ඔය හෙලිකොප්ටරයෙන් පැමිණෙන්නේ. එහෙම නැති වුණොත් අති විශේෂ අවස්ථාවකදි තනාපතිවරයෙක් , එහෙම නැතිනම් විදේශිය මොකක් හරි එන්නේ.අපි නගර සභාවක් එහෙම ගෙන් බදු අයකිරිම හරි වැරදියි. මොන දේශපාලන පක්ෂ හෝ ඒවා මොන තනාපතිවරයා හෝ වේවා ඒ අයගෙන් අප නගරයට යම්කිසි දේවල් ලැබෙනවා. මා නම් ඉල්ලා සිටිනවා එවැනි අපේ රාජ්‍ය නායකයින් , තනාපතිවරුන් වගේ පැමිණෙන එවැනි දෙයකට ගාස්තුවක් අයනොකර ලබා දුන්නා.එයට ඉඩ දෙන්න කියා. මා යෝජනා කරනවා එයට අවසර දෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ස්ථිර කරන ගමන්ම තව සති දෙකකින් ගොඩ බසින්නේ අපේ ජනාධිපතිතුමා. මේ වනවිට අපිට මෙම තින්දුව ගැනීම ඉතා වැදගත්. නැතිනම් අපේ මන්ත්‍රිවරුන්ටත් ඔබතුමාටත් තමයි අන්තිමට මේ මුදල ගෙවන්න වෙන්නේ. එමනිසා නෙමේ මෙය නැවැත්විය යුත්තේ. රාජ්‍ය නායකයින් කුමන පක්ෂයේ වුවත් ඔහු රාජ්‍ය නායකයායි.ඔහු අපේ නගරයට පැමිණෙනවා නම් එය ඉතා ආඩම්බරයක්. මේ අවස්ථාවේදි ටිකට් කඩා ඔහුගෙන් මුදල් ගැනිම කොපමණ අවමානයක් ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය නිදහස් කළේ එම නිසා තමයි. මෙහිදි අප මතක් කරන්න ඕන පෞද්ගලිකවත් එක එක්කෙනා මෙහෙට ගොඩබාන්න ගත්තා. එමනිසා අපි රු.1000/= ක් ඒ කාලේ ගත්තා. නමුත් එම රු.1000/= රු.6000/= කරලා තිබෙනවා. අපි දැනුවත්ව නෙමේ කර තිබෙන්නේ. නිලධාරින් මහතුන් විසින් කර තිබෙන්නේ. මෙය අයවැය ලේඛණයට රු.1000/= දක්වා අඩු කරන ලෙස. කවුරුහරි පුද්ගලිකව පැමිණෙනවා නම් පමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**.

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කිවු පරිදි එතුමාගේ ජනාධිපතිතුමා ගොඩ බසින්නත් ඉඩ තිබෙනවා. ළඟදි දිනයකදි අපේ ජනාධිපතිතුමා ගොඩ බසින්නත් ඉඩ තිබෙනවා. පිට්ටනිය ඉල්ලන්නේ නැහැ. එයා බයිසිකලයෙන් එන්නේ.

**තීරණය-**

ගරු අග්‍රමාත්‍යතුමා ඇතුළු පිරිස පැමිණෙන හෙලිකොප්ටරය ගොඩබැස්සවීම සම්බන්ධව කරන ලද ඉල්ලීමට අනුව එය සභා අනුමතියට යටත්ව නිදහස් කිරිම සුදුසු බවටත්, එම ගාස්තුව රාජ්‍ය නායකයකු පැමිණෙන අවස්ථාවේදි නොමිලේ ලබාදිම සුදුසු බවටත්, පෞද්ගලිකව ආයතනයක්/ පුද්ගලයෙක් ඉල්ලීම් කළ විට එම ගාස්තුව රු.1000/= ක් අයකිරිමට අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කළ යුතු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩේනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- නැත

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා :-** ඇත

05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

05.01.01 2020 වර්ෂයට අදාල වරිපණම් බදු , සංවර්ධනය නොකල ඉඩම් මත බදු, වාහන හා සතුන් පිළිබඳව බදු , බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා වෙළඳ බදු, පරිසර ගාස්තු, ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු , හා ප්‍රචාරණ දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන් පළ කිරිම උදෙසා වූ ගැසට් යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරිම සහා ගත කිරිම.

**<u>යෝජනා:</u>**

**2020 වර්ෂයට අදාල වරිපනම් බදු, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු, වාහන හා සතුන් පිළිබද බදු, වෙළඳ බලපත්‍ර ගාස්තු, , කර්මාන්ත බදු , ව්‍යාපාර බදු ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු, පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා ත්‍රී රෝද රථ නවතා තැබීමේ ගාස්තු පැනවීම සම්බන්ධ ගැසට් නිවේදනය ගරු සභාවට යෝජනා කර සිටිමි.**

**අම්බලන්ගොඩ නගර සභාව**

2020 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම

(1) (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 166 වගන්තිය මගින් අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව 2019 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ බවත් එකී තක්සේරුව මත නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනා කමින් 7% (සියයට **හතක්**) සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරන ස්ථාන සඳහා 11% (සියයට **එකොළහක්**) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එකවර හෝ කාර්තු ලෙස සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 වසරේ ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% (සියයට දහයක)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අම්බලන්ගොඩ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%(සියයට පහක) ක වට්ටමක්ද අම්බලන්ගොඩ නගර සභාව ලබා දිය යුතු බවටත් **යෝජනා කර සිටිමි**

**උපලේඛනය**

| කාර්තුව | ගෙවිය යුතු දින | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2020 මාර්තු මස 31 දිනට පෙර | 2020.01.31 |
| දෙවන කාර්තුව | 2020 ජුනි මස 30 දිනට පෙර | 2020.04.30 |
| තුන්වන කාර්තුව | 2020 සැප්තැම්බර් මස 30 දිනට පෙර | 2020.07.31 |
| හතරවන කාර්තුව | 2020 දෙසැම්බර් මස 31 දිනට පෙර | 2020.10.31 |

***තීරණය***

(1) (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 166 වගන්තිය මගින් අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව 2019 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ බවත් එකී තක්සේරුව මත නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනා කමින් 7% (සියයට **හතක්**) සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරන ස්ථාන සඳහා 11% (සියයට **එකොළහක්**) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,තවද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එකවර හෝ කාර්තු ලෙස සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 වසරේ ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% (සියයට දහයක)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අම්බලන්ගොඩ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%(සියයට පහක) ක වට්ටමක්ද අම්බලන්ගොඩ නගර සභාව ලබා දිය යුතු බවටත් **ගරු සභාව තීරණය කරන ලදී.**

**උපලේඛනය**

| කාර්තුව | ගෙවිය යුතු දින | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2020 මාර්තු මස 31 දිනට පෙර | 2020.01.31 |
| දෙවන කාර්තුව | 2020 ජුනි මස 30 දිනට පෙර | 2020.04.30 |
| තුන්වන කාර්තුව | 2020 සැප්තැම්බර් මස 30 දිනට පෙර | 2020.07.31 |
| හතරවන කාර්තුව | 2020 දෙසැම්බර් මස 31 දිනට පෙර | 2020.10.31 |

**අම්බලන්ගොඩ නගර සභාව**

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම.

**(2)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 165 ඇ. වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභාවේ බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථිර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන යුක්ති සහගත වියදමින් ඒ ඉඩම එකී කාර්යයන් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙකහෝ

(ආ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට හා වගාවන්ට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට පනහ(50%)ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැළකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පනවා අයකලයුතු බවට **යෝජනා කර සිටිමි.**

තීරණය

(:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 165 ඇ. වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභාවේ බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථිර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන යුක්ති සහගත වියදමින් ඒ ඉඩම එකී කාර්යයන් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙකහෝ

(ආ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට හා වගාවන්ට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට පනහ(50%)ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැළකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පනවා අයකලයුතු බවට

## අම්බලන්ගොඩ නගර සභාව

*2020 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම.*

**(3)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 162 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 163 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙම එහි II වන තීරුවෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂයට පනවා අයකළ යුතු බවට **යෝජනා කර සිටිමි.**

**උපලේඛනය**

| I තීරුව | | | II තීරුව |
|---|---|---|---|
| | | | රු. ශත |
| (i) | මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මොටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | | 25.00 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා | | |
| | (අ) | එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10.00 |
| | (ආ) | එය වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 5.00 |
| (iii) | සෑම කරත්තයක් සඳහාම | | 20.00 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහාම | | 10.00 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහාම | | 75.00 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙක් සඳහාම | | 15.00 |
| (vii) | සෑම අලියෙකු සඳහාම | | 50.00 |

රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිත නොකරන අත් කරත්ත මෙම ගෙවීම් වලින් නිදහස් කෙරෙයි.

*තීරණය*

(:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 162 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 163 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂයේ දී ගැසට් නිවේදනයේ උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගේම එහි II වන තීරුවෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂයට පනවා අයකළ යුතු බවටත් රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිත නොකරන අත් කරත්ත මෙම ගෙවීම් වලින් නිදහස් කළ යුතු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

*2020 වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම*

**(4)** 255 වන අධිකාරි නගර සභා අඥා පනතේ 164 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2016/11/01 දිනැති තීරණ අංක 01:12 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් විසින් ක්‍රියාත්මක කිරීමට පිළිගෙන , එසේම 2017/08/04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2031 දරණ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පලකරන ලද්දාවූ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013-05-17 දිනැති ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද , දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුල සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුවපනතේ සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් භාවිත කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙ 'II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම්හලක් වන විටදී උපලේඛනයේ II තීරුවේ කුමක් සඳහන් වුවද ඊට අදාල බලපත්‍ර ගාස්තුව එම හොටලයේ, ආපන ශාලාවේ, ලැගුම්හලේ 2019 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් විය යුතු බවට ද 2020-01-31 දිනට ප්‍රථම අදාල පරිශ්‍රය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවටද යෝජනා කර සිටිමි.

| **උපලේඛනය** | | | | |
|---|---|---|---|---|
| I තීරුව | | II තීරුව | | |
| බලපත්‍රයේ ස්වභාවය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු.750ට වැඩි නොවන | රු.751 සිට රු.1500 දක්වා | රු.1500ට වැඩි වන විට |
| | | රු ශත | රු ශත | රු ශත |
| 01. | මාළු විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 02. | මස් විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 03. | සීසිල් බීම කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 04. | කොන්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500. 00 | 750. 00 | 1000. 00 |
| 05. | බේකරි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 06. | කිරි පට්ටි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 07. | පිහිණුම් තටාක | 500. 00 | 750. 00 | 1000. 00 |
| 08. | අයිස් කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 09. | බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ | 500. 00 | 750. 00 | 1000. 00 |
| 10. | හෝටල් | 500. 00 | 750. 00 | 1000. 00 |
| 11. | නවාතැන් පොළවල් | 500. 00 | 750. 00 | 1000. 00 |

| | | | | |
|---|---|---|---|---|
| 12. | ලොන්ඩරි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 13. | කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 14. | අවමංගල්‍ය සේවා සැපයීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 15. | සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන □ව්‍ය වෙළඳාම් කිරීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 16. | ඉදිකිරීම් □ව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් □ව්‍ය ගබඩා ස්ථාන | 500. 00 | 750. 00 | 1000. 00 |
| 17 | අවමගල්‍ය සේවා සැපයීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 18 | අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර<br><br>i. කබොක් බොරළු හෝ කළුගල් කැනීම<br>ii. කබොක් බොරළු හෝ කළුගල් ගබඩා කිරීම<br>iii. ස්වර්ණාභරණ නිෂ්පාදන කිරීම හෝ අළුත්වැඩියා කිරීම<br>iv. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම<br>v. අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම<br>vi. දැව ගබඩාවක් පවත්වාගෙන යාම<br>vii. බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වා ගෙන යාම<br>viii. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම<br>ix. ගෘහ භාණ්ඩ නිෂ්පාදන කිරීම හෝ ගබඩා කර තබා ගැනීම<br>x. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම<br>xi. කෝපි ධාන්‍ය වර්ග මාංශ බෝග කුළුබඩු හෝ පිටි ඇනීම<br>xii. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම<br>xiii. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම<br>xiv. ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තැබීම<br>xv. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වා ගෙන යාම<br>xvi. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම<br>xvii. මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තැබීම<br>xviii. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම<br>xix. වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xx. මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම<br>xxi. බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| | xxii. පෙට්‍රල් ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කර ඇති ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xxiii. පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම<br>xxiv. වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම<br>xxv. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**තීරණය**

**(4)** 255 වන අධිකාරි නගර සභා ආඥා පනතේ 164 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2016/11/01 දිනැති තීරණ අංක 01:12 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් විසින් ක්‍රියාත්මක කිරීමට පිළිගෙන , එසේම 2017/08/04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2031 දරණ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පලකරන ලද්දාවූ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ජේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952

අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013-05-17 දිනැති ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වු ද , දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුල සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුවපනතේ සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති ගැසට් නිවේදනයේ උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් භාවිත කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙ 'II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම්හලක් වන විටදී උපලේඛනයේ II තීරුවේ කුමක් සඳහන් වුවද ඊට අදාල බලපත්‍ර ගාස්තුව එම හොටලයේ, ආපන ශාලාවේ, ලැගුම්හලේ 2019 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් විය යුතු බවට ද 2020-01-31 දිනට ප්‍රථම අදාල පරිශ්‍රය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවටද ගරු සභාව තීරණය කරන ලදී.

## අම්බලන්ගොඩ නගර සභාව

2020 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

**(5)** 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162. වගන්තිය සමග කියවිය යුතු නගර සභා අඥාපනතේ 165අ (1) වගන්තිය මගින් ලැබී ඇති බලතල අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි IIවැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් ඒ අනුව කර්මාන්ත බද්දට යටත් කර්මාන්ත 2020-03-31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බව මෙයින් යෝජනා කර සිටිමි

**උපලේඛනය**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| කර්මාන්තයේ ස්වාභාවය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු.750ට වැඩි නොවන | රු.751 සිට රු.1500 දක්වා | රු.1500ට වැඩි වන විට |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 01. | ලියවන පට්ටල් | 500. 00 | 750. 00 | 1000. 00 |
| 02. | සම්භාණ්ඩ නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 03. | සපත්තු නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 04. | පිංතූර රාමු කිරීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 05. | පා පැදි අළුත්වැඩියාව | 500. 00 | 750. 00 | 1000. 00 |
| 06. | රබර් සීල් නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 07. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 08. | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 09. | වාත්තු වැඩ | 500. 00 | 750. 00 | 1000. 00 |
| 10. | කොහු භාණ්ඩ නිෂ්පාදනය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 11. | ෆයිබර් ග්ලාස් නිෂ්පාදය | 500. 00 | 750. 00 | 1000. 00 |
| 12. | බෙලෙක් වැඩපල | 500. 00 | 750. 00 | 1000. 00 |
| 13. | කම්මල | 500. 00 | 750. 00 | 1000. 00 |
| 14. | ගෑස් උපකරණ අළුත් වැඩියාව | 500. 00 | 750. 00 | 1000. 00 |
| 15. | ඔරලෝසු අලුත්වැඩියාව | 500. 00 | 750. 00 | 1000. 00 |

තීරණය

**(5)** 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162. වගන්තිය සමග කියවිය යුතු නගර සභා අඥාපනතේ 165අ (1) වගන්තිය මගින් ලැබී ඇති බලතල අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන ගැසට් නිවේදනයේ I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි IIවැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් ඒ අනුව කර්මාන්ත බද්දට යටත් කර්මාන්ත 2020-03-31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බවට ගරු සභාව තීරණය කරන ලදී.

## අම්බලන්ගොඩ නගර සභාව

*2020 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම*

**(6)** 255 වන අධිකාරිය නගර සභා අඥාපනතේ 162 වගන්තිය සමඟ කියවිය යුතු165ආ (1) උපවගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන පහත උපලේඛනයේ 1 තීරුවේ දැක්වෙන ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි IIවන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් තීරණය කරමි. ඒ අනුව ව්‍යාපාර බද්දට යටත් ව්‍යාපාර 2020-03-31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බව මෙයින් යෝජනා කර සිටිමි

| | **උපලේඛනය** | | | | | |
|---|---|---|---|---|---|---|
| | I වන තීරුව | II වන තීරුව | | | | |
| | ව්‍යාපාරයේ ස්වභාවය | පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම් | | | | |
| | | රු. 6000 සිට රු 12000 දක්වා රු. ශත | රු. 12001 සිට රු. 18750 දක්වා රු. ශත | රු 18751 සිට රු. 75000 දක්වා රු. ශත | රු. 75001 සිට රු150000 දක්වා රු. ශත | රු. 150000 ට වැඩි රු. ශත |
| | (අ) | | | | | |
| 01. | අමතර කොටස් වෙළෙඳාම (රථ වාහන, යන්ත්‍ර සූත්‍ර) | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 02. | අලෙවි නියෝජිත ආයතන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ඇ) | | | | | |
| 03. | ඇළුමිනියම්/ ප්ලාස්ටික්/මැටි බඩු වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 04. | ඇස් කණ්ණාඩි වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 2 00.00 | 3 000.00 |
| | (ඉ) | | | | | |
| 05. | ඉංග්‍රීසි/ආයුර්වේද බෙහෙත් ශාලා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 06. | ඉන්ධන සැපයුම් මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (උ) | | | | | |
| 07. | උකස් මධ්‍යස්ථාන. | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 08. | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (එ) | | | | | |
| 09. | එළවලු පළතුරු වෙළදාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ඔ) | | | | | |
| 10. | ඔරලෝසු වෙළඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ක) | | | | | |
| 11. | කායවර්ධන මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12. | කාර්යාල පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 13. | ක්‍රීඩා භාණ්ඩ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 14. | කුරුඳු වෙළඳ මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 15. | කාර්මික භාණ්ඩ කුලියට දීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 16. | කුෂන් වැඩ | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 17. | කේටරින් ස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 18. | කේක් නිර්මාණ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 19. | කුරුඳු ගබඩා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 20. | කුලුබඩු අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 21 | ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ග) | | | | | |
| 22. | ගබඩා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 23. | ගුවන් ටිකට් පත් අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 24. | ග්‍රොසරි | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 25. | ගෘහ භාණ්ඩ හා උපකරණ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ඡ) | | | | | |
| 26. | ඡායා පිටපත් හා ලැමිනේටින්/අන්තර්ජාල පහසුකම් සැපයීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 27. | ඡායාරූපාගාර | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 28. | ජ්‍යෝතිෂ්‍ය කාර්යාල | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ට) | | | | | |
| 29. | ටයර් ටියුබ් වෙළඳම හා අළුත්වැඩියාව. | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 30. | ටේලර් සාප්පු | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 31. | ටියුටරි (උපකාරක පන්ති) | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ත) | | | | | |
| 32. | තොග හා සිල්ලර වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 33. | තුරඟ තරඟ ඔට්ටු මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 34. | තීන්ත අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 35. | තැපැල් නියෝජිත කාර්යාල | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ද) | | | | | |
| 36. | දන්ත ශල්‍යාගාර | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 37. | දුරකථන සේවා මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 38. | දුරකථන අලෙවිය / අලුත්වැඩියාව | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 39. | දේපළ වෙළෙඳාම් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 40. | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (න) | | | | | |
| 41. | නිම් ඇඳුම් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 42. | නිවාස සැලසුම් නිර්මාණ ඇඳීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ප) | | | | | |
| 43. | පරිගණක හා උපාංග වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 44. | පරණ යකඩ බඩු මිලදී ගැනීම / විකිණීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 45. | පාර්සල් ලිපි ද්‍රව්‍ය බෙදාහැරීමේ සේවා (පෞද්ගලික) | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 46. | පාවහන් අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 47. | පාසල් පොත්, ලිපි ද්‍රව්‍ය හා පුවත්පත් වෙළඳම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 48. | පැළ තවාන් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 49. | පින්තූර රාමු කිරීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 50. | පුහුණු මධ්‍යස්ථාන (දේශීය/විදේශිය) | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 51. | පූජා භාණ්ඩ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 52. | පුද්ගලික පාසල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 53. | පෞද්ගලික රථ ගාල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 54. | පෞද්ගලික රෝහල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 55. | පෞද්ගලික ප්‍රවාහන සේවා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 56. | ප්‍රචාරණ මාධ්‍ය ලබා දෙන ස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 57. | ප්‍රදර්ශනාගාර | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (බ) | | | | | |
| 58. | බැංකු , රක්ෂණ, මූල්‍ය ආයතන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 59. | භාණ්ඩ කුළියට දීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 60. | බෑග් විකිණීම | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |
| | (ම) | | | | | |
| 61. | මත් පැන් විකිණීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 62. | මුද්‍රණාල | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 63. | මැටි භාණ්ඩ වෙළඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 64. | මුළුතැන්ගෙයි උපකරණ වෙළඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ර) | | | | | |
| 65. | රථ වාහන, යතුරුපැදි වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 66. | රියැදුරු පුහුණු පාසල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 67. | රෙදි වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ල) | | | | | |
| 68. | ලිහිසි තෙල් වෙළඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 69. | ලී වෙළෙඳ සැල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 70. | ලොතරැයි විකිණීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ව) | | | | | |
| 71 | වාහන අමතර කොටස් අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 72. | වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 73. | වාහන සේවා ස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 74. | වීදුරු වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 75. | විදුලි උපකරණ වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 76 | විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 77. | විදේශ රැකියා නියෝජිත ආයතන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 78. | විසිතුරු භාණ්ඩ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 79. | විශේෂඥ වෛද්‍ය සේවා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 80. | වෙස් මුහුණු වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 81. | වෛද්‍ය රසායනාගාර | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ස) | | | | | |
| 82. | සංගීත තැටි/වීඩියෝ තැටි වෙළඳම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 83. | සංචාරක බෝට්ටු සේවයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 84. | සංගීත භාණ්ඩ අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 85. | සත්ත්ව චිකිත්සාගාර | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 86. | සම්භාණ්ඩ වෙළඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 87. | ස්වර්ණාභාරණ වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 88. | සාප්පු බඩු වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 89. | සිනමා ශාලා | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 90. | සිහිවටන සෑදීම හා විකිණීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 91. | සුපිරි වෙළෙඳසැල් | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 92 | සිගරට් අලෙවි නියෝජිත | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 93. | සුරතල් මසුන්, පක්ෂීන් වෙළෙඳාම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (හ) | | | | | |
| 94. | හාඩ්වෙයාර් (ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම) | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ළ) | | | | | |
| 95. | ළදරු පාසල් / දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ශ) | | | | | |
| 96. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| | (ෆ) | | | | | |
| 97. | ෆාමසි/ආයුර්වේද බෙහෙත් බඩු අලෙවිය | 90.00 | 180.00 | 360.00 | 1 200.00 | 3 000.00 |
| 98. | වෙනත් ව්‍යාපාර | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |

**තීරණය**

**(6)** 255 වන අධිකාරිය නගර සභා අඥාපනතේ 162 වගන්තිය සමග කියවිය යුතු165ආ (1) උපවගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන ගැසට් නිවේදනයේ උපලේඛනයේ 1 තීරුවේ දැක්වෙන ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම එම උපලේඛනයෙහි **II**වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී **II** තීරුවේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් තීරණය කරමි. ඒ අනුව ව්‍යාපාර බද්දට යටත් ව්‍යාපාර 2020-03-31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බවට ගරු සභාව තීරණය කරන ලදී.

## අම්බලන්ගොඩ නගර සභාව

2020 වර්ෂයට අදාළව ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම

**(7)** නගර සභා පනතේ 153 වැනි හා 157 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාව මගින් සම්පාදිත, එම අඥා පනතේ 154 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රචාරණ දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා පහත දැක්වෙන උප ලේඛනය අනුව බලපත්‍ර ගාස්තුවක් අය කිරීමටත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර අනුමැතිය ලබා නොගත් හෝ අනුමැතියකින් තොරව ප්‍රදර්ශනය කළ, ප්‍රචාරණ පුවරු සඳහා පසුව මුදල් ගෙවීමට පැමිණෙන අවස්ථාවලදී අමතර දඩ මුදලක් වශයෙන්, ප්‍රදර්ශණය කරන දැන්වීම්වල ගාස්තුවෙන් 25%ක මුදලක් අය කිරීමටත් යෝජනා කර සිටිමි.

| **උපලේඛනය** | | |
|---|---|---|
| **තාවකාලික දැන්වීම්**<br>සති 01 දක්වා තාවකාලික දැන්වීම් සඳහා වර්ග අඩියකට<br>සති 01- 02 දක්වා තාවකාලික දැන්වීම් සඳහා වර්ග අඩියකට | රු<br>රු | 50.00<br>75.00 |
| සති 02- මාස 01 දක්වා තාවකාලික දැන්වීම් සඳහා වර්ග අඩියකට | රු | 100.00 |
| මාස 03 ක කාලයක් දක්වා තාවකාලික දැන්වීම් සඳහා වර්ග අඩියකට | රු | 150.00 |
| **ස්ථිර දැන්වීම්**<br>අවුරුද්දක කාලයක් සඳහා ස්ථිර දැන්වීම් සඳහා වර්ග අඩියකට | රු | 250.00 |
| LED දැන්වීම් පුවරු සඳහා අවුරුද්දක කාලයකට වර්ග අඩියකට | රු | 500.00 |

තීරණය

**(7)** නගර සභා පනතේ 153 වැනි හා 157 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාව මගින් සම්පාදිත, එම අඥා පනතේ 154 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රචාරණ දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා ගැසට් නිවේදනයේ දැක්වෙන උප ලේඛනය අනුව බලපත්‍ර ගාස්තුවක් අය කිරීමටත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර අනුමැතිය ලබා නොගත් හෝ අනුමැතියකින් තොරව ප්‍රදර්ශනය කළ, ප්‍රචාරණ පුවරු සඳහා පසුව මුදල් ගෙවීමට පැමිණෙන අවස්ථාවලදී  අමතර දඩ මුදලක් වශයෙන්, ප්‍රදර්ශණය කරන දැන්වීම්වල ගාස්තුවෙන් 25%ක මුදලක් අය කිරීමටත්  ගරු සභාව තීරණය කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

2020 වර්ෂයට අදාලව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම

**(8)** 255 වන අධිකාරය වන නගර සභා ආඥාපන ත මගින් ලැබී ඇති බලතල අනුව සහ 20018 ජනවාරි 25 දින අංක 1533/16 දරණ ගැසට් නිවේදනය පරිදි පහත 1 උපලේඛනයෙහි සඳහන් කර්මාන්ත සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුය.එකී බලපත්‍රයේ වලංගු කාලය වර්ෂ 3කි. එකී බලපත්‍රය ලබා ගැනීම සඳහා අයකරනු ලබන පරීක්ෂණ ගාස්තු 11 උපලේඛනයේද බලපත්‍ර ගාස්තු 111 උපලේඛනයෙහි ද දක්වා ඇති අයුරින් අය කර ගැනීමට යෝජනා කරමි.

<u>1 උපලේඛනය</u>

| | |
|---|---|
| 1. | සියළුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රොලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු) |
| 2. | සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත |
| 3. | සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන පොල්තෙල් සෑදීමේ කර්මාන්ත |
| 4. | සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත |
| 5. | වියළි ක්‍රියාවලි සහිත වී මෝල් |
| 6. | මාසික නිෂ්පාද ධාරිතාව කි.ග්‍රෑ 1000 කට අඩු වන කර්මාන්ත |
| 7. | දුම්කොළ වේලීමේ කර්මාන්ත |
| 8. | සල්ෆර් දුම්ගැසීම් සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත |
| 9. | කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත |
| 10. | ක්ෂණික තේ කර්මාන්තශාලා හැර අනෙකුත් තේ කර්මාන්තශාලා |
| 11. | කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත |
| 12. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ තර්මාන්ත |
| 13. | දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු |
| 14. | ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ තර්මාන්ත හෝ සේවකයන් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිහන් මැටි නිෂ්පාදනය කිරීමේ තර්මාන්ත |
| 15. | සියළු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත |
| 16. | උළු සහ ගඩොල් කර්මාන්ත |
| 17. | එක් වරකට එක් වලක් බැගින්  පුපුරවමින්මසකට ඝණ මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු,මිනිස් ශ්‍රමය හා පුපුරන ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැනීම් |
| 18. | (18.1) දිනකට ඝණ මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල |

| |
|---|
| (18.2) බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත |
| 19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත |
| 20. නේවාසික කර්මාන්ත 05 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල් ආගන්තුක නිවාස සහ තානායම් |
| 21. වාහන වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ,නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ |
| 22. ශීතකරණ හා වියු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන |
| 23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහලු පර්යන්ත |
| 24. සේවකයන් 10 ක් හෝ ඉට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියළුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන |
| 25. ඊයම් උණු කිරීම සිදුකිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර |

<u>11 උපලේඛනය</u>

| ආයෝජන මුදල රු. | පරීක්ෂණ ගාස්තු රු. |
|---|---|
| 250,000/- ට අඩු | 3,000/- |
| 250,001/- සිට 500,000/- | 3,750/- |
| 500,001/- සිට 1,000,000/- | 5,000/- |
| 1,000,000/- ට වැඩි | 10,000/- |

<u>111 උපලේඛනය</u>

| | ගාස්තු රු. |
|---|---|
| පාරිසරික බලපෑම් හඳුනාගැනීම පිළිබඳ ප්‍රශ්නාවලිය | 100/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම් පත්‍රය | 100/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත්කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | 50/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු | 4,000/- |

තීරණය

**(8)** 255 වන අධිකාරය වන නගර සභා ආඥාපන ත මගින් ලැබී ඇති බලතල අනුව සහ 20018 ජනවාරි 25 දින අංක 1533/16 දරණ ගැසට් නිවේදනය පරිදි පහත 1 උපලේඛනයෙහි සඳහන් කර්මාන්ත සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුය.එකී බලපත්‍රයේ වලංගු කාලය වර්ෂ 3කි. එකී බලපත්‍රය ලබා ගැනීම සඳහා අයකරනු ලබන පරීක්ෂණ ගාස්තු 11 උපලේඛනයේද බලපත්‍ර ගාස්තු 111 උපලේඛනයෙහි ද දක්වා ඇති අයුරින් අය කර ගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

2020 වර්ෂයට අදාලව ත්‍රී රෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ගාස්තු

**(9)** නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 153 වන සහ 157 වගන්ති යටතේ අම්බලන්ගොඩ නගර විසින් සාදනු ලැබ, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂාංගික විධි විධාන) පනතේ 2 වැනි වගනතිය සමඟ කියවිය යුතු ඉහත කී නගර සභා ආඥා පනතේ 154 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලය ප්‍රකාර දකුණු පළාත් සභාවේ නීතිය හා සාමය, අධ්‍යාපන, මහා මාර්ග, පළාත් පාලන, ප්‍රවෘත්ති, වතු යටිතල පහසුකම් හා පාරිසරික කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයේ ඇත්නම් මිස යම් තැනැත්තෙකු විසින් නගර සභාව විසින් නියම කරන ලද ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථානයක ත්‍රී රෝද රථ නවතා තැබීම නොකළ යුතු වන අතර වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු 1000/- ක් අය කිරීම යොජනා කර සිටිමි.

තීරණය

**(9)** නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 153 වන සහ 157 වගන්ති යටතේ අම්බලන්ගොඩ නගර විසින් සාදනු ලැබ, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂාංගික විධි විධාන) පනතේ 2 වැනි වගනතිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥා පනතේ 154 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලය ප්‍රකාර දකුණු පළාත් සභාවේ නීතිය හා සාමය, අධ්‍යාපන, මහා මාර්ග, පළාත් පාලන, ප්‍රවෘත්ති, වතු යටිතල පහසුකම් හා පාරිසරික කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයේ ඇත්නම් මිස යම් තැනැත්තෙකු විසින් නගර සභාව විසින් නියම කරන ලද ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථානයක ත්‍රී රෝද රථ නවතා තැබීම නොකළ යුතු වන අතර වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු 1000/- ක් අය කිරීමට ගරු සභාව තීරණය කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020 වර්ෂයට අදාල වරිපණම් බදු , සංවර්ධනය නොකල ඉඩම් මත බදු, වාහන හා සතුන් පිළිබඳව බදු , බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා වෙළඳ බදු, පරිසර ගාස්තු, ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු , හා ප්‍රචාරණ දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන් පළ කිරිම උදෙසා වු ගැසට් යෝජනාව මා යෝජනා කරනවා. ගිය වසරේ යෝජනා කරන ලද එකමයි යෝජනා කරනු ලබන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>.**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවලියේදි යම් බදු වැඩිවිමක් වී තිබේද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ . කිසිම බදු වැඩිවිමක් සිදු වි නැහැ. ගිය වසරේ බඳු ප්‍රමාණයමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>.**

එහෙම නම් කමක් නැහැ. මොකද බතුයි, පරිප්පුයි කාලා ඉන්න බැරි කාලේ බදු වැඩිකිරිම හරි නැහැ. ඔබතුමා ඥාන්විතව කල්පනා කර තිබෙනවා.

**තීරණය-**

2020 වර්ෂයට අදාල වරිපණම් බදු , සංවර්ධනය නොකල ඉඩම් මත බදු, වාහන හා සතුන් පිළිබඳව බදු , බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා වෙළඳ බදු, පරිසර ගාස්තු, ත්‍රිරෝද රථ බලපත්‍ර ගාස්තු , හා ප්‍රචාරණ දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන් පළ කිරිම උදෙසා වු ගැසට් යෝජනාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.02. පෝරඹ එච්.කේ.එස්.අබේවර්ධන මහතාගේ නිවස අසළ කාණු පද්ධතිය ඉදිකිරිමේ යෝජනාව සභා ගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පෝරඹ එච්.කේ.එස්.අබේවර්ධන මහතාගේ නිවස අසළ කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා යෝජනා කරනවා.

**තීරණය -**

පෝරඹ ප්‍රදේශයේ පොල්වත්ත පාරේන් පාරෙන් අතුරු පාරෙහි කාණු පද්ධතිය(එච් .කේ.එස්. අබේවර්ධන මහතාගේ නිවස අසළ ) ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03 කළුවඩමුල්ල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිමේ යෝජනාව සභා ගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කළුවඩමුල්ල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිම සඳහා යෝජනා කරනවා.

තීරණය -

කළුවඩමුල්ල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04 පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරිමේ ( පී.ජී.රණසිරි මහතාගේ නිවස අසළ ) යෝජනාව සභා ගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරිමට ( පී.ජී.රණසිරි මහතාගේ නිවස අසළ ) **යෝජනා කරනවා**

තීරණය -

පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරිම ( පී.ජී.රණසිරි මහතාගේ නිවස අසළ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05 මහජන ක්‍රීඩාංගණයේ ළිං 3හි කොන්ක්‍රිට් ආවරණ ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රීඩාංගණයේ ළිං 3හි කොන්ක්‍රිට් ආවරණ ඉදිකිරීමට **යෝජනා කරනවා.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ ළිං 3හි කොන්ක්‍රිට් ආවරණ ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06** **තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ සිට දළුක්කන්ද පාර දක්වා මීටර් 407 ක් තාර ඇතිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ සිට දළුක්කන්ද පාර දක්වා මීටර් 407 ක් තාර ඇතිරීමේ යෝජනා කරනවා.

තීරණය -

තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ සිට දළුක්කන්ද පාර දක්වා මීටර් 407 ක් තාර ඇතිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07** **තල්ගස්ගොඩ ක්‍රීඩාංගණයේ පස් කපා සංවර්ධනය කිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තල්ගස්ගොඩ ක්‍රීඩාංගණයේ පස් කපා සංවර්ධනය කිරීමට යෝජනා කරනවා.

**තීරණය -**

තල්ගස්ගොඩ ක්‍රීඩාංගණයේ පස් කපා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08** **මහ අම්ලන්ගොඩ පාරෙන් ඇන්කරු ඒජන්සිය අසලින් අතුරු පාරේ කඩා ඇති කොටස සංවර්ධනය කිරීමේ යෝජනාව සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහ අම්ලන්ගොඩ පාරෙන් ඇන්කරු ඒජන්සිය අසලින් අතුරු පාරේ කඩා ඇති කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරනවා.

තීරණය -

මහ අම්ලන්ගොඩ පාරෙන් ඇන්කරු ඒජන්සිය අසලින් අතුරු පාරේ කඩා ඇති කොටස සංවර්ධනය සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09** **මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ පළමු අදියර ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ පළමු අදියර ඉදිකිරීමට යෝජනා කරනවා.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ පළමු අදියර සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ දෙවන අදියර ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ දෙවන අදියර ඉදිකිරීමට යෝජනා කරනවා.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ දෙවන අදියර සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.11 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ වම්පැති බැම්මේ පළමු අදියර ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

**මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ වම්පැති බැම්මේ පළමු අදියර ඉදිකිරීමට යෝජනා කරනවා.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම පළමු අදියර සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.12 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ වම්පැති බැම්මේ දෙවන අදියර ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

**මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ වම්පැති බැම්මේ දෙවන අදියර ඉදිකිරීමට යෝජනා කරනවා.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම දෙවන අදියර සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.13 මහජන ක්‍රීඩාංගණය අසල බෝධි ප්‍රාකාරය අදියර 01 ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මහජන ක්‍රීඩාංගණය අසල බෝධි ප්‍රාකාරය අදියර 01 ඉදිකිරීමට යෝජනා කරනවා.

තීරණය -

මහජන ක්‍රීඩාංගණය අසල බෝධි ප්‍රාකාරය අදියර 01 සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.14 නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ල කුළුණු යෙදීම දෙවන අදියරේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ල කුළුණු යෙදීම දෙවන අදියර යෝජනා කරනවා.

තීරණය -

නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ල කුළුණු යෙදීම දෙවන අදියර සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15 හල්වතුර කසළ අංගණය කාර්යාලිය ගොඩනැඟිල්ල ඉදිකිරීම හෝ අඩු මුදලකට කන්ටේනර් එකක් ලබා ගැනීමේ යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

හල්වතුර කසළ අංගණය කාර්යාලිය ගොඩනැඟිල්ල ඉදිකිරීම හෝ අඩු මුදලකට කන්ටේනර් එකක් ලබා ගැනීමට යෝජනා කරනවා

**තීරණය -**

හල්වතුර කසළ අංගණය කාර්යාලිය ගොඩනැඟිල්ල ඉදිකිරිම හෝ අඩු මුදලකට කන්ටේනර් එකක් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩේනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16 විලේගොඩ සහ හල්වතුර අතර මාර්ගයේ ඇළ හරහා ඇති බෝක්කුව ඉදිකිරීමේ යෝජනාව සභාගත කරන ලදී.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

විලේගොඩ සහ හල්වතුර අතර මාර්ගයේ ඇළ හරහා ඇති බෝක්කුව ඉදිකිරීමට යෝජනා කරනවා

තීරණය -

විලේගොඩ සහ හල්වතුර අතර මාර්ගයේ ඇළ හරහා ඇති බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17 පොල්වත්ත හන්දියෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව සභාගත කරන ලදී.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පොල්වත්ත හන්දියෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරනවා

**තීරණය -**

පොල්වත්ත හන්දියෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18 පෝරඹ වලව්වත්ත පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීමේ යෝජනාව සභාගත කරන ලදී.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පෝරඹ වලව්වත්ත පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීමට යෝජනා කරනවා

තීරණය -

පෝරඹ වලව්වත්ත පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.19 සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීමේ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීමට **යෝජනා කරනවා.**

**තීරණය -**

සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රිට් කර්බ් යෙදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.20 ගර්භනී මවක් දරු ප්‍රසූතිය සඳහා රෝහල් ගත වීමේදි රැගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුව නොමිලේ ලබා දිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගර්භනී මවක් දරු ප්‍රසූතිය සඳහා රෝහල් ගත වීමේදි රැගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුව නොමිලේ ලබා දිම සුදුසු බවට යෝජනා කරනවා

තීරණය -

ගර්භනී මවක් දරු ප්‍රසූතිය සඳහා රෝහල් ගත වීමේදි රැගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුව නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 පින්නදූව තොටුපල පාර යාම් ඊම් කිරිමට පවා අපහසු තත්ත්වයේ පවතින පටු මාවතක් බැවින් එය අත්පත් කර ගෙන සංවර්ධනය කිරිම සඳහා ගරු සභාවට යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දිගු කාලයක පටන් කතා කරනු ලැබූ යෝජනාවක්. මා වැඩියේ වචන යොමු කරන්නේ නැහැ කාලය ගත වෙන නිසා. පින්නදූව තොටුපොළ පාරේ යාම් ඊම් කිරිමට නොහැකි තත්ත්වයේ පවතින පටු මාවතක් බැවින් එය අත්පත්කරගෙන සංවර්ධනය කරන ලෙස ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්**

ස්තුතිය පුද කරනවා . අපේ උප සභාපතිතුමාට. මෙම මාර්ගය පිළිබඳ සියළුම ගරු මන්ත්‍රීවරු දන්නවා. මේ වනවිට ගැලරියේ සිටිනවා එම සංවර්ධනය කර ගැනීමට ගැටළුව දැඩිව වෙහෙසෙන අවිච්චින්නව මෙම ගැටළුව පිළිබඳ පසුපස එළවන ඒ අපේ වැසියෝ. මාවත් වැසියෝ කිහිපදෙනෙක්ම. ඔවුන් පමණක් නොවේ . කිසිදු වාහනයක් යා නොහැකියි. ඔබතුමා ගියා.නොනිමෙන ඇටුවාන් බැහැපු වැඩිහිටියන් කිහිප දෙනෙක් තමන්ගේ මේ වචනය වෙනස් නොකොට මේ මාවත පුළුල් කරන්න දෙන්නේ නැහැ. එමනිසා අධිකරණ ක්‍රියාමාර්ගයට ගිහින් හෝ මෙම මාවත පුළුල් කර ගැනිම අපේ යුතුකමක් වෙනවා. ඒ සඳහා සියළුම අවශ්‍යතාවයන් කල් නොයවා ඉටු කරන්න කියා මා මේ අවස්ථාවේදි කියනවා.

**ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කාලයක් තිස්සේ දිග් ගැහි ගැහි යනවා. මොකද මෙය අත්පත් කරගෙන කිරිමේ යෝජනාව සම්මත වුණා.ඒ වගේම මුදල් පවා මේ සඳහා වෙන්වෙලා තිබුණා.ඉතිං එකත් එක්ක මෙය යෝජනාවක් විදියට යන්න අවශ්‍ය නැහැ. තිබෙන්නේ මෙය ක්‍රියාත්මක කිරිමටයි. එම නිසා දෙදෙනෙකුගේ තමයි මේ සඳහා විරෝධය තිබෙන්නේ. ඉතිං එම දෙදෙනාගේ විරෝධය නොසලකා හැරලා ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කිවූ පරිදි නඩු මාර්ගයට ගිහින් හරි එහෙම නැතිනම් දැන් මෙය සමථ මණ්ඩලයටත් මෙය ගිහින් තිබෙනවා.නැවත ගෙදර පැමිණ අපි මෙය කරන්න දෙන්නේ නැහැ. අපිට මුදල් ඕන කියනවා.ඔය සියළු දේවල් පැත්තකට දාලා මෙය තව දිගින් දිගටම යාමට අවශ්‍ය නැහැ.මේ සඳහා මේ ක්‍රියාමාර්ගය මේ අවස්ථාවේම ගන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ අද දියුණුවන සාමාජයේ අපේ නගරයේ පින්නදුව තොටුපොළ පාර මුදල් දුන්නාත් අපිට හදන්න බැහැ. මේ තිබෙන ප්‍රමාදය නිසා.එම ගමේ ජනතාව බොහොම සාධාරණව ඉල්ලා සිටින්නේ මෙම පාර පළල් කර දෙන ලෙස. එක්කෙනෙකු දෙදෙනෙකු මෙයට විරුද්ධ වෙනවා නම් නිත්‍යානුකුල තත්ත්වයට ගිහිල්ලා හරි මේ පාර අවශ්‍ය පරිදි වාහනයක් ගමන් කිරිමට හැකි පරිදි පළල් කර ඔබතුමාගේ නගර සභා මුදලින් හෝ මාගේ මුදල් හෝ මා දිලා එම පාර හදන්නම්. අපේ වගකිමක් අපේ යුතුකමක් නගර සිමාවේ ජීවත්වන ජනතාවට මෙච්චර දියුණු සමාජයක මිනිසුන්ට තිබෙන අඩුපාඩුවක් සකස් කිරිම . අද නිවෙස් වල සමහර නිවෙස්වල වාහන දෙක තුන තිබෙනවා. ඉතිං මේ අයට හදිස්සියකටවත් තමන්ගේ අවශ්‍යතා ඉටු කරගැනීමට නොහැකි පාරකි. මෙයට මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අපි සියළු ගරු මන්ත්‍රීවරුන් එකඟයි.නිත්‍යානුකුල ප්‍රශ්නයකට යන්න වුණත් එම ගමේ ජනතාව වෙනුවෙන් මෙම ප්‍රශ්නය විසඳා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව සංශෝධනය විය යුතුයි. මෙය කරන්නම බැරි වුණොත් අන්තිමට කරන්න ඕන නිශ්චිතම තැන සඳහන් වෙලා නැහැ.මෙය සංශෝධනය කරන්න පින්නදූව තොටුපොළ පාර ඉඩම් අත්පත් කර ගැනීමේ පණතේ වගන්ති ප්‍රකාරව නගර සභාව වෙත අපත්පත් කර ගත යුතුයැයි යෝජනා කරන ලෙස නිවැරදි විය යුතුයි. එතකොට තමයි අපි නියම ප්‍රවේශයට යා හැක්කේ. මෙයට එකඟ වෙච්ච ආකාරයට මට මතකයි අපේ ගරු නගර සභා මන්ත්‍රී චම්පා මහත්මියත් ඔබතුමාත් ගිහිල්ලා මේ ජනතාව සමඟ සාකච්ඡා කර ගිහින් ලක්ෂ 8ක මුදලක් වෙන්කළා මෙහි වැටි ටික බැඳීමට. කැමති වෙලා ඉදලා තිබෙනවා . මා මෙම සභාවේ දැන් වසර විසි ගණනක් පමණ ඉඳලා තිබෙනවා.එම අවුරුදු විසි ගණනේදීම ජනතාවගෙන් ඉදිරිපත් වුණු යෝජනාවකි.හැමදාම ඔය කතා කරන ලද මනුස්සයාම තමයි මුලින්ම ඇවිත් කියන්නේ මෙය කර දෙන්න කියා. නමුත් හැමදාම විරුද්ධ වෙන්නෙත් එයා. එම නිසා අපි මෙය කරන්න ඕන.අත්පත් කර ගැනීම සඳහා යාමට ඒ සඳහා සැලැස්මක් හදා මිනින්දොරු සැලැස්මක් හදලා එයට තක්සේරුව ගෙන කරන්න. අපි මෙයට මුදල් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කතා කිරිමේදි ඇත්ත වශයෙන්ම ඔය කෙරම්ණිය පින්නදූව මාර්ගය පිළිබඳව කතාව ගොඩක් අවුරුදු 15කට 20කට යනවා.මා හිතන්නේ එදා සිටම මේ ජනතාව නගර සභාවෙන් මෙම ඉල්ලීම කළා.අපි සභාවක් විදියට අම්බලන්ගොඩ නගර සභාව බැඳිලා සිටිනවා ජනතාවගේ පාරවල් අයිතින් ලබා දීමට. හැබැයි අවාසනාවකට එම පාරවල් දෙපැත්තේ සිටින අය අකමැති වෙනවානම් අපිට තිබෙන එකම ක්‍රියාමාර්ගය අධිකරණ ක්‍රියා මාර්ගයකට යාම පමණි. එතකොට මේ පැමිණ සිටින ජනතාව පිඩාවට පැමිණෙනවා.මෙය අද ඊයෙක දෙයක් නෙමේ. මේ අයගේ වැඩිහිටියොත් මෙයට පැමිණියා.එතකොට මේ අයගේ දරුවොත් මෙයට පැමිණෙයි අපි මෙය පිළිසකර නොදුන්නොත්. එම නිසා ගරු සභාපතිතුමනි කවුරු මතිමතාන්තර දැරුවත් මෙම පාර හදා දිම තමයි අපේ යුතුකම හා වගකීම වෙන්නේ.එමනිසා ඉක්මනින් නැවත වතාවක් එම සාකච්ඡාවට කැඳවා එයට ඉදිරිපත් වෙන්නේ නැතිනම් මොකද ඉතාම සරල ක්‍රියාමාර්ගය එක. මෙයට අනුගත වෙන්නේ නැතිනම් අධිකරණ ක්‍රියාවලියට අත්පත් කර ගැනිමේන් හෝ මෙම පාර සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. මෙම ජනතාව සම්බන්ධයෙන් ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතාට මා ස්තුති වන්ත වෙනවා එම යෝජනාව දැම්ම වෙනුවෙන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, යම් ඌන පුරණයක් කළ යුතු නම් එය කරන්න. මොකද ඔබතුමාගේ අවමංගල්‍ය දිනවලදියි මෙම යෝජනාව දැමුවේ. එම නිසා සුදුසු පරිදි යෝජනාව සංශෝධනය කරමින් මේ පිළිබඳ අදහස් දක්වා මගේ බල ප්‍රදේශය නංවන්නට උදවු උපකාර කළ ගරු මන්ත්‍රීවරුන්ට වරියන්ට තුති පුද කරනවා මේ අවස්ථාවේ.

**05.03 ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනාව**

**05.03.01 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 6 වන විධායක ජනාධිපති වශයෙන් කටයුතු කරන අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනතා ප්‍රණාමය පුද කළ යුතු යයි කරන ලද යෝජනාව සභා ගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 6 වන විධායක ජනාධිපති වශයෙන් කටයුතු කරන අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනතා ප්‍රණාමය පුද කළ යුතු යයි මා යෝජනා කරනවා. මෙවැනි අවස්ථාවක ආදර්ශමත් චරිතයක් වශයෙන් කටයුතු කරලා කියපු දේ කරන ජනාධිපතිවරයෙක් වශයෙන් එතුමා කටයතු සිදු කරනු ලැබුවේ. ඇත්ත වශයෙන්ම එතුමා දිවුරුම් දෙන අවස්ථාවේ ප්‍රකාශ කළා. වසර 5ක වගේ කාලයක් තමයි ජනාධිපති පදවියේ සිටින්නේ කියලා. කියපු දේ කරන ජනාධිපතිතුමෙකු ලෙස තමයා මා එතුමාට ගරු කරන්නේ.

- පෙරවරු 11.55 ට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා සභාවේ මුලාසනයෙන් පිටව ගියහ.
- මුලාසනය සඳහා පෙරවරු 11.55ට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් සභාවේ මුලාසනයට පැමිණියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ඒ වගේම එතුමා සරල දිවි පෙවෙතක් ගෙවන ලද චරිතයකි. අපේ ජීවිත වලටත් හරි ආදර්ශමත් ඒ වගේ චරිත. මා හිතනවා මගේ සහෝදර සියළු ගරු මන්ත්‍රීවරු මේ යෝජනාවට එකඟත්වය පල කරයි කියා. අතිගරු ජනාධිපතිතුමා එතුමා සිටි වසර 5ක කාලය තුළ එතුමාට කළ හැකි සේවය කළා. මත්ද්‍රව්‍ය උවදුර මැඩලීමට ගත යුතු ක්‍රියාමාර්ග බොහෝ ගනු ලැබුවා. ඒ වගේම පතාලය සඳහාත් එතුමාට ගන්න පුළුවන් ක්‍රියා මාර්ග එතුමා ගත්තා. ඒ වගේම ඉදිරි කාලයේදිත් එතුමා ඒ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටියදි තමයි එතුමාගේ නිල කාලය අවසන් වි නිකම් යාමට සුදානම් වෙමින් තිබෙන්නේ.මාගේ පුද්ගලික මතය මා විශේෂයෙන්ම එතුමාට ස්තුති වන්ත වෙනවා.මොකද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගාලු දිස්ත්‍රික්කයේ සංවිධායකවරියක් වශයෙන් මා වැනි සාමාන්‍ය පන්තියක කෙනෙකුට පොළොවේ පය ගසා සිටිමට කටයුතු කිරිම. ඒ සම්බන්ධවත් මාගේ ප්‍රණාමය එතුමාට පුද කර සිටිනවා. එසේම දැන් අප රට ගත්තාම නිර්පාශ්ශිකව මැතිවරණයක් පැවැත්වෙනවා. ජනාධිපතිවරණය සඳහා. ඇත්තෙන්ම එතුමා නියම රාජ්‍ය නායකයෙක් වශයෙන් යහපාලන රජය පත් කරන්න එක්සත් ජාතික පක්ෂය සමඟ තමයි එතුමා බලයට පත්වුණේ. දැනට අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණය කර තිබෙනවා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ගරු ගෝඨාභය රාජපක්ෂ මහතාට සහාය දීමට. එතුමා තීරණය කළා නිර්පාර්ශිකව දෙපැත්තම සමබරව තබා ගැනීමට. තමන්ගේ වගකිමක් හා යුතුකමක් තමයි එතුමා කර තිබෙන්නේ. ඇත්තෙන්ම අපි එය අගය කළ යුතුයි. මොකද තමන්ට යම්කිසි කෙනෙකුට උදවුවක් කළාම එය මතක තිබෙන්නේ ඕන. ඒක තමයි මා හිතන්නේ කළගුණ සැලකීම. එමනිසා දිර්ඝව කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.එතුමා වගේ නිහඩ , සරල ආදර්ශමත් ජීවිතයක් ගත කරන ලද නායකයෙකු ලෙස අම්බලන්ගොඩ නගර සභාවේ මා ඇතුළු , ගරු සභාපතිතුමා ඇතුළු , සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රණාමය එතුමාට පුද කළ යුතු යයි ඉල්ලා සිටිනවා.

## ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගාලු දිස්ත්‍රික්කයේ සංවිධායකා වන අප සභාවේ ගරු නගර සභා මන්ත්‍රිනි වන ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ගෙන එනු ලබන යෝජනාව ගෙන එම සම්බන්ධව ස්තුතිය පුද කරනවා. මොකද 2015 වර්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා නැවත හංසයා ලකුණින් මැතිවරණයට ඉදිරිපත් වෙලා ජනාධිපති වූ අපගේ වත්මන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිදුන් සම්බන්ධව ගෙනු එනු ලැබූ යෝජනාවකි. මා හිතන්නේ එතුමාගේ පාලන තන්ත්‍රය තුල එතුමා විශාල වැඩ කොටසක් කරන්න පැමිණියට කර ගැනිමට නොහැකි වූ වැඩ කොටසකුත් තිබුණා .එතුමා වැඩ කොටසකුත් කළා. මා හිතන්නේ අපි සතුටු වෙනවා රටේ ආර්ථිකමය වශයෙන් මොරගහ කන්ද ව්‍යාපෘතිය. ඉතාමත්ම වැදගත් කවුරුත්ම කතා නොකරන ව්‍යාපෘතියක්. එහි විශාල වශයෙන් ගොවි බිම් කරා , ජල විදුලි බලාගාර සඳහා ජලය ලබා දීමෙන් විශාල සේවාවක් ඉටු වෙනවා. පරිසරික පැත්තෙනුත් විශාල වැඩ කොටසක් එතුමා විසින් කරනු ලැබුවා.ඒ වගේම මෙතුමිය කිවූ පරිදිම අද රටේ මහඟු විපාකයක් බවට පත් වි තිබෙනවා මේ කුඩු ප්‍රශ්නය. මත්ද්‍රව්‍ය ප්‍රශ්නය සම්බන්ධයෙන් ඒ වගේම හොඳ තින්දු ගෙන ක්‍රියාත්මක කර මේ වන විට විශාල වශයෙන් මර්ධනය කර තිබෙනවා එම කුඩු ප්‍රශ්නය. ඒ වගේම වෙනත් සමාජ විරෝධි ක්‍රියාකාරකම් මැඩ පවත්වා තිබෙනවා.මා දකින විශේෂත්වය නම් එතුමා එක වාරයක පමණක් ජනාධිපති ධුරයේ සිටිනවා කිව්වේ.එතුමා එම වාරයේ එම වැඩ කොටස කර තව දින කිහිපයකින් නිමාවට පත්වෙනවා එතුමා එම තනතුරේත් ගෞරුත්වය තබා එම වැඩ කොටස කරලා ඒ සමුදිමට තමයි කටයුතු සිදු කර තිබෙන්නේ. එය අපි අභය කරන්න ඕන. මොකද බල ලොභයෙන් ක්‍රියා නොකර ඒ අවශ්‍ය දේ කලා . ඒ ජනතාවගේ සමාජ වර්ධනය සඳහා අවශ්‍ය දේ කළා. අවංකම වැඩ කළා . මොකද කිසිම දිනක චෝදනාවක් එල්ල වෙලා නැහැඑතුමන්ට.ජනාධිපතිවරයෙකු වශයෙන් එතුමාගේ කාලය තුළ විශාල වැඩ කොටසක් කළා. එතුමාටත් සතුටු වෙන්න පුළුවනි. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒ සභාපති ධුරය ගෙන අපිත් නියමාකාරයෙන් මෙහෙයවා ඒ දෙන්න පුළුවන් උපරිම සහායෝගය ලබා දී ඒ ජනාධිපති ධුරයේ, අපගේ ගරු සභාපති ධුරයේ කටයුතු කළා.එම වැඩ කටයුතු සිදු කරන විට අම්බලන්ගොඩ නගර සභාවේ ඕනෑම ගරු මන්ත්‍රිවරයෙක් අවංකව වැඩ කරන ඒ සියළු මන්ත්‍රිවරයෙක් අභය කිරිම සිදු කළ යුතුයි.මෙම යෝජනාව ගරු සභාවට ගෙන එම පිළිබඳ අපගේ ගරු නගර සභා මන්ත්‍රිවරියක් වන ගරු එම්.ඩබ්. නිලානි මෙනවිය ගෙනු එනු ලැබූ යෝජනාවට මා පෞද්ගලිකව ස්තුති වන්න වෙන ගමන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රිවරයෙක් විදියට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිදුන්ගේ ඉදිරි අනාගත වැඩ කටයුතු , ඒ වගේම දේශපාලන වැඩ කටයුතු සාර්ථක වෙන්න කියා ප්‍රාර්ථනා කරමින් එතුමාට නිරෝගි සුවය ලැබිලා තවත් සමාජ මෙහෙවරක් කිරිමට අවස්ථාව උදා වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

## ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ගෙන එනු ලබන යෝජනාව සම්බන්ධයෙන් කතා කිරිමේදි ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය තුළ 1977න් පසු ජේ. ආර් ජයවර්ධන ජනාධිපති ධුරයෙන් පසුව මෑතකදි පත්වුණු ඉතාමත් බරපතල ගැටළු වලට පත්වෙච්ච ජනාධිපතිවරයෙක් වශයෙන් අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා හඳුන්වා දෙන්න පුළුවනි. මොකද ඉතිහාසය පුරාම එම පක්ෂයේ නායකයා ලෙස තමයි හැමදාම

පත්වුයේ. හැබැයි මෛත්‍රීපාල සිරිසේන මහතාට ජනාධිපතිවරයා ලෙස පත්වෙන්න වුණේ නැහැ. එතුමා නියෝජනය කරන ලද පක්ෂය සමඟ.හැබැයි එතුමා එම හංසයා කියන පොදු ලකුණ යටතේ තරඟ කරලා තමයි දිනුවේ.එතකොට ඒ ආණ්ඩුවත් ජනාධිපතිවරයා අතරත් ගට්ටනය තිබේද්දිත් එතුමා , එතුමාගේ නිල කාලය අවසන් වන තුරු සිදු වුයේ මේ රට වෙනුවෙන් සේවය කරන්න. එය අපි අගය කළයුතු වෙනවා.මොකද එතුමා තමයි දන්නේ එතුමා මුහුණ දුන් දුෂ්කරතා. හැබැයි රට ජාතිය වෙනුවෙන් එතුමාගෙන් සේවයක් සිදු වුණා කියා පිළිගන්න තිබෙනවා. විශේෂයෙන්ම අද මේ පවතින වතාවරණයේදි අද පවතින ආණ්ඩුව විශේෂයෙන්ම ස්වාධින කමිෂන් සභා පවා පිහිටුවිමේ මුලිකත්වය සිදු කරනු ලැබුවේ එතුමා. එතුමා පත්කරනු ලැබූ ස්වාධින කොමිෂන් සභා හරහා තමයි අද රට දුවන්නේ. ඒවාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අපට යම් යම් ගැටළු තිබෙනවා.ඒවා කොතරම් ස්වාධින කියන එක අපට බරපතලම ගැටළු තිබෙනවා. ඒවා පාලනය කිරිමේ හැකියාවක් එතුමාට නැහැ අද වෙනකොට. ජනාධිපතිවරයා වශයෙන් එතුමා තින්දු ගත්තාට ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. අන්න එකයි මා කිවුවේ ගරු ජේ.ආර්. ජයවර්ධන මහතාගෙන් පසු පත්වුණු ජනාධිපතිවරයෙක් දුෂ්කරතා වලට මුහුණ දුන්නා නම් ඒ ගරු මෛත්‍රීපාල සිරිසේන මහතායි.එම නිසා එතුමාගේ භූමිකාව රට ජාතිය වෙනුවෙන් විශාල භූමිකාවක් සිදු කරනු ලැබුවා. ඒ පිළිබඳව අපි එතුමන්ට අපගේ කෘතවේදත්වය පුද කරන ගමන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙම යෝජනාව ගෙන එනු ලැබූ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මන්ත්‍රීතුමියට ස්තුති වන්ත වෙන අතර එතුමන්ට දිර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල මැතිතුමා මේ රටේ ජනාධිපතිත්වයට පත් කිරීම සම්බන්ධව එක්සත් ජාතික පක්ෂය මා විශාල දැවැන්ත කාර්ය භාර්යක් ඉටු කළා. එහිදි මේ වැඩ කටයුතු වලට අම්බලන්ගොඩ සංවිධායක ධුරයේ මේ වැඩ කටයුතු භාරගෙන දැන් මාස තුනක් පමණි. ඒ ඉඳලා අපි දැවැන්ත කැප කිරිමක් කරලා තමයි මෛත්‍රීපාල සිරිසේනජනාධිපතිතුමා මේ රටේ 6වන අතිගරු ජනාධිපතිතුමා බවට පත්කරනු ලැබුවේ. එතුමාගේ කාලය තුළ යම් යම් දේශපාලන ගැටළු තිබුණා. යම් යම් නොගැලපෙන තැන් තිබුණත් ඒ කෙසේ වෙතත් එතුමා උත්සාහ කළා මේ රටේ කුඩු ව්‍යාපාරය නතර කිරීම සඳහා නොභියව සටන් කළා.එතුමා යම් යම් දේවල් ක්‍රියාත්මක කරන්න උත්සාහ කළත් සියළු දෙනාගේ ඒකමතිකව සහායෝගය නොමැති නිසා යම් හිතු දේවල් කරන්න බැරි වුණා.කෙසේ වුණත් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එම ජනාධිපති ධුරයට පත් කිරිම සඳහා අම්බලන්ගොඩ මැතිවරණ මෙහෙයුම කරනු ලැබුවේ මාගේ නායකත්වයෙනි. මා වසර 5ක කාලයක් මේ රටේ ජනාධිපතිවරයා විදියට රටට යම් සේවයක් කර තව නොබෝ දිනකින් මේ තනතුරෙන් නික්ම යනවා. අපි එතුමාගේ අනාගතය සහ එතුමා නිරෝගිමත්ව එතුමාගේ ඉදිරි දේශපාලන ගමන කිරිමට එතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

අම්බලන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රීතුමිය , ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමිය ඉදිරිපත් කරන යෝජනාවට අප එතුමාට වැඩ නොකළත් එම ගෙන එනු ලැබූ යෝජනාවට සහායෝගය දැක්විය යුතුයි. එතුමා බලයට පත්වුයේ මේ රටේ වසර 6ක්

ජනාධිපතිත්වය දැරීමට. වසර 6ක් බලයේ සිටීමට පත් වූ කිසිදු ජනාධිපතිවරයෙක් වසර 5කින් තම කාලය අවසන් කිරීමට තීරණය ගැනීම සිදු කරනු ලැබුවේ නැහැ. වසර 6කට ලබාදුන් බලය තමයි වසර 5කට සීමා කිරීමට කටයුතු සිදු කර මේ මසේ ( නොවැම්බර් මස ) 16 වෙනිදිනට නැවත වරක් ජනාධිපතිවරණයකට ගිහින් ජනාධිපතිවරයෙක් පත්වෙනවා. එතුමා ප්‍රකාශ කළ ආකාරයට ජනාධිපතිවරණයෙන් අයින් වෙනවා කියා. ඒ කියන කතාව සත්‍යයක් කරමිනි. අපි කියනවා එතුමාට දේශපාලනයෙන් විශ්‍රාම ගන්න එපා. එතුමා අදත් ගෙන තිබෙනවා එතුමා ස්වාධීනව ඉන්න තීන්දුව.මා හිතන්නේ උසස්ම ගුණාංග තිබෙන තීන්දුවකි මේ අවස්ථාවේ ගෙන ඇත්තේ. මේ වකවානුව තුළත් එතුමා නිශ්ශබ්දව සිටිනවා. පක්ෂයේ සභාපතිකමත් මේ කාලයේ වෙනත් පුද්ගලයෙකුට පවරා ඒ ගනු ලැබූ තීරණය අපි ගරු කළ යුතුයි.මෙතුමා ලංකාවේ දේශපාලනයේ ඉන්න ඕන කියන මතයේ තමයි මා සිටින්නේ. ඒ වගේ දේශපාලනඥයකු රටට බිහිවෙන එකක් නැහැ. එතරම් මනුස්ස ගුණාංග තිබෙන දේශපාලනඥයෙක් , ගරු ජනාධිපතිවරයෙකු ලෙසයි අපි දකින්නේ.මේ වන කොටත් එතුමා අපිත් සමඟ එකතු වෙයි කියන විශ්වාසයේ අපි ඉන්නවා. ඉදිරි කාලයේ එතුමාට අපගේ සහායෝගය ලබා දෙන බව ප්‍රකාශ කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඒකමතික තීන්දුව අනුව මා මාගේ යෝජනාවක් හැටියට ගරු සභාවට ඉල්ලීමක් කරනවා අම්බලන්ගොඩ තනායම භූමිය බදු දීම පිළිබඳව.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා ගෙන එනු ලැබූ යෝජනාවට සියම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා අපගේ ගරු ජනාධිපතිතුමා පිළිබඳ යෝජනාව සම්බන්ධව එකඟත්වය පල කිරීම සම්බන්ධව. මෙම යෝජනාව ඉහළට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිමින් නැවත වරක් සියළුම දෙනාට ස්තුති වන්න වෙනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ජනාධිපති ලේකම් කාර්යාලයට දන්වා යවන්න.

**තීරණය**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ 6 වන විධායක ජනාධිපති වශයෙන් කටයුතු කරන අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනතා ප්‍රණාමය පුද කළ යුතු යයි ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් කරන ලද යෝජනාව පිළිගත යුතුබවට ගරු සභාවේ මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල්වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

- පස්වරු 12.10ට පමණ ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ගරු සභාවේ මූලාසනයට පැමිණියහ.

## 06. කාරක සභා වාර්තා :-

**06.01 2019.10.15 දින පැවති පුස්තකාලකමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2019.10.15 දින පැවති පුස්තකාලකමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය

2019.10.15 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.10.21 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2019.10.21 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.10.21 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.10.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2019.10.25 දින පැවති ටෙන්ඩර් කමිටු කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා. ගරු සභාපතිතුමනි මා ටෙන්ඩර් කමිටුවේදි යෝජනා කරනවා . ටෙන්ඩර් මිළ ගණන් ඒ සියළු දේ ගෙන්වා ගැනීමේදි එක්කෝ තැපැලෙන් හෝ ෆැක්ස් මඟින් ගෙන්වා ගන්නා ලෙස. මොකද එක එක්කෙනා යවා ගන්න එපා.මා ඉල්ලා සිටිනවා. මා හිතන්නේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම එකඟ වෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම සිද්ධියක් වෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා ඔබතුමාට පසුව කියන්නම්. එය ඒ විදියට ගෙන්වා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. අපි එහෙම කවුරුත් යවන්නේ නැහැ. වරදක් තිබේනම් කියන්න. අපි එය නිවැරදි කරන්නම්.

තීරණය

2019.10.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවටත්, ටෙන්ඩර්පත් ගෙන්වා ගැනීමේදි නිත්‍යානුකූලව විධිමත් පරිදි ගෙන්වා ගැනීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.10.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.10.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා. මිට මාස කිහිපයකට පෙර මා යෝජනාවක් කළා. අපේ දඩාවතේ යන බල්ලන්ට බැල්ලියන්ට වන්දාකරණ සැත්කම කිරිම සඳහා අපගේ නිවහන් වලට ගම්වලට මෙම පිරිස නොයන නිසා ඒ සිටින බල්ලන් බැල්ලියන් අල්ලාගෙන ඇවිත් මේ පාශු වෛද්‍ය කාර්යාලයේ එම සැත්කම කිරිමට. ඒ අවස්ථාවේ වාහනයක් දීමට ඔබතුමා එක්සිතින් එකඟ වුණා. නමුත් මා වාහනයක් ඉල්ලුවා කිහිප විටක්ම බලධාරින්ගෙන්. රියදුරන් කියා සිටිනවා බල්ලෝ ගෙනියන්න පුළුවන්ද මෙකේ කියා. ඔබතුමාගේ මතයට අනුව වැඩ නොකරනවා නම් කොහොමද මේ නගර සභාවක් පවත්වාගෙන යන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

කොට්ඨාශ මට්ටමින්නේ කළේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

කොට්ඨාශ මට්ටම මේ වන විට හකුලාගෙන හාමාරයි. එමනිසා අපි මෙතැනට ආ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට තෙරුණේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

අපේ ප්‍රදේශයේ බලු බැල්ලියෝ 60ක් 70ක් විතර සිටිනවා කෙරමිණිය පින්නදූව ප්‍රදේශයේ. මේ බලු බැල්ලියෝ ටික අල්ලාගෙන ඇවිත් මේ පාශු වෛද්‍ය කාර්යාලයේ මේ වන්දාකරණ සැත්කම කිරීමට මා කැමතියි. මගේ කණ්ඩායමක් සිටිනවා බල්ලන්ට ආදරය කරන බැල්ලියන්ට ආදරය කරන.ඉතිං අපේ වාහන පහසුකමක් නැහැ. අපි තවම දුප්පත් මිනිසුන්. අපිට එම වාහන පහසුකම ඔබතුමා අපට ලබා දෙන්න පොරොන්දු වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලබා නොදුන්නේ කවුද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

මා අපේ හිමාල් මහතාගෙනුත් ඉල්ලා සිටියා. එතුමා අවිවේකී නිසා වෙන්නැති.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට කියන්න එපැයි එතකොට. දැන් හිමාල් මහතා ගැන හොඳ කිවුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

හිමාල් මහතා වැරැද්දක් කළා නෙමේ. ඔහු යාන්ත්‍රික මනුස්සයකි. ඔහුට මේ අවිවේකිබව නිසා මග හැරෙනවා. රියදුරා මා අහගෙන බල්ලෝ කොහොමද මෙකේ ගෙනියන්නේ. එහෙම කතාවක් කිවුවා.ඉතිං බල්ලොත් අපේ සියව සත්වයෝනේ. එමනිසා අපි සියළු සත්වයන්ට හිතානුකම්පිත විය යුතුයි.එම නිසා මේ සතිය තුළදි එය ඉටු කර දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. අපට අර බල්ලෝ ගෙනියන මට්ටමේ මේවා එකක් අපේ සභාවේ නැහැ.ඔබතුමාට වෙන්නේ බල්ලා ඔලුව අතගාගා අඩගහගෙන එන්න.නැතිනම් විශාල ප්‍රශ්නයක් ඕක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

නැහැ. එහෙම නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බල්ලෝ ට්‍රැක්ටරයට දමා ගන්න බැහැ. ලොරියට දමා ගන්නත් බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බල්ලන් හිලා කරගන්නා හැටි බෞද්ධයන් හැටියට අපි දන්නවා. අපිට අමුතු උපදෙස් අවශ්‍ය නැහැ.එම නිසා අවශ්‍ය වන්නේ වාහනය ඇතුළට දමා ගැනීමට නොවේ. අර ට්‍රේලරයක් තිබීම හොඳටම ප්‍රමාණවත්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුලින්ම ඔබතුමාට බෙහෙත් විදගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ සමගම ඔබතුමාට අපි කිව්වා කුඩා ට්‍රිපර් රථය පිළිබඳව. ඉක්මනින් අළුත් වැඩියා කරන්න එය. මා හිතන්නේ එය මල්අල දරමින් සිටිනවා. එය හරි ගන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදී මා මේ සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටුවේදි තීන්දුවක් ගත්තා පසුගිය වතාවේ.එම ගත්ත තීන්දුව තමයි ගර්භනි මවුවරුන් සඳහා රෝහල් ගත වන අවස්ථාවේදි ගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුවක් තිබෙනවා.එම භාණ්ඩ ලැයිස්තුවෙන් කොටසක් නගර සභාවෙන් ලබා දිම සුදුසුයි කියා යෝජනා කරනවා. ඒ අනුව ලබන වසරේ ගර්භනි මාතාවන් සඳහා මේ සඳහා අපට වියදම් වෙනවා ලක්ෂ 16ක වගේ ලොකු මුදලක්. අපට වියදම් කරන්න වෙනවා.ඒ අනුව නොමිලේ මෙන්න මේවා ලබා දෙනවා.ගර්භනි මතාවක් වුණාම තමන්ට එවා ලබා ගැනීමට ශක්තියක් නැතිනම් ශක්තියක් තිබෙන අයට නෙමේ දුප්පත් අම්ලාට තමයි මෙය ලබා දෙන්නේ.මෙන්න මේ ආකාරයෙන් දීම සුදුසුයි කියා අපි යෝජනා කරනවා.චිත්ත 03ක්,සුදු චිත්ත 01,Bed jacket 03, සුදු Bed jacket 01, සුදු ඇඳ ඇතිරිලි 01, සුදු ඇඳ ඇතිරිලි 01, සුදු කොට්ට උරය, සනිපාරක්ෂක තුවා පැකට් 02,වස්තිබෝතලය,උෂ්ණත්වමානය,පැනල් 01, නැප්කින් පැකට් 01, ආදියයි. මේ සඳහා රු.3985/=ක මුදලක් එක මවක් සඳහා වැය කරනවා.මෙය ලබන ජනවාරි සිට ක්‍රියාත්මක කරන්න ලබන අයවැය ලේඛණයට ඇතුලත් කිරිමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය හොඳම දේ තිබෙන්නේ සමෘද්ධි හරි එහෙම පදනමකට දෙන්න.අඩු ආදායම්ලාභි නිර්නායකයක් අපි ගත යුතුයි.සමෘද්ධිලාභි අඩු ආදායම්.එතකොට හරි. නැතිනම් මේ වාහන කුරුඳු ඉඩම් තිබෙන ජනතාවට නෙමේ.සමෘද්ධිලාභි පවුල්.සමෘද්ධිලාභි පවුල් අරගත්තාම ඊට අමතරව සමෘද්ධිය හසුනොවු දුප්පත් පවුලක් සිටිනවා. එතකොට අපේ ගරු මන්ත්‍රීවරයෙක් යෝජනා කරනවා මේ පවුලට සමෘද්ධි නැහැ. හැබැයි මෙම පවුල දුප්පත්.එතකොට අපි ගරු මන්ත්‍රීගේ නිර්දේශ මත ග්‍රාම නිලධාරිගෙන් ඉල්ලනවා මේ පවුල පිළිබඳ ඒ අයගේ ආර්ථික තත්ත්වය පිළිබඳ වාර්තාවක්.එතකොට ගරු මන්ත්‍රීවරයාගේ ඉල්ලීමත් මන්ත්‍රීවරයාට ගරුත්වයක් තිබෙනවා. එය සනාථ කරනවා ග්‍රාම නිලධාරිගේ වාර්තාව. එතකොට සමෘද්ධිලාභි පවුල් වලට අමතරව අර අහිංසක පවුළුත් ආවරණය වන පරිදි ඔය තීන්දුව ගන්න. ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම හොඳ යෝජනාවකි. සමහර ගම්වල සිටිනවා ඔය දේවල් ගන්න බැරි උදවිය. අපට ඔය දිමේ තමයි ගැටළුවක් ඇති වෙන්නේ.ඕක නිකන් දෙනවා නම් හැමෝම ඉල්ලන්න බලනවා.අපට එය සනාථ කර ගැනීමට ග්‍රාමසේවක මහතා , පවුල් සෞඛ්‍ය සේවිකාවගේ වාර්තා ගෙන එය සානාථ කර ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව යෝජනාව ඉදිරිපත් කළේ පවුල් සෞඛ්‍ය සේවිකාව තමයි.ඒ වගේම අපගේ මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමියත් මේ සම්බන්ධව කරුණු දැක්වුවා. මේ බඩු ලැයිස්තුව දැක්කාම ආණ්ඩුවේ රෝහලෙන් ළමයෙකු ලැබිමට මේ බඩු ලැයිස්තුවට යනවා නම් රු.20000/= ක වත් බඩු ගෙන යා යුතුයි. අපි මෙය බැලුවේ දුප්පත් අම්මා , තාත්තාට අවම පහසුකමක් වශයෙන් මෙය ලබාදිමට. මේ තත්ත්වය යටතේ මෙහි කී දෙනෙකු සිටිනවාද කියා . අපේ සායන වලට 300ක් 250ක් අතර ප්‍රමාණයක් තමයි පැමිණෙන්නේ. ඒ අනුව මුදල් නොමැති කම ඇතිව වසරකට

රෝහල්ගත වන මවුවරු සංඛ්‍යාව 320කි. ඒ අනුව අපිට ලබන වසරේ මෙයට ඇස්තමේන්තුගත කරන්න වෙනවා රු.1275200/= ක මුදලක්.මෙයට අපි පවුල් සෞඛ්‍ය සේවිකාවගෙනුත් , මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනියගෙනුත් ,ග්‍රාම නිලධාරි මහත්මියගෙනුත් වාර්තා අනුව තමයි මෙය අපි බලාපොරෝත්තු වෙන්නේ.ඒ කියන්නේ දෙන්නම් පලියට නිකන් දෙන්න නෙමේ.අවශ්‍යතාවයට ගැලපෙන පරිදි , ඔබතුමා යෝජනා කළ ආකාරය හොඳයි. සමෘද්ධි නොමැති නම් අපේ ගරු මන්ත්‍රිවරයා සහ ග්‍රාම නිලධාරි සහතික කළ යුතුයි. ඒ සඳහා කටයුතු කිරිමට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කලෝචිත හොඳ යෝජනාවක් තමයි ගෙනවිත් තිබෙන්නේ.මා දැනුවත්ව පවුල් සෞඛ්‍ය නිලධාරිතුමිය ලබා දෙන එම ලැයිස්තුවේ භාණ්ඩ ලබා ගැනීමට නොහැකිව අසරණ වෙලා තිබෙනවා. මේ අවස්ථාවේ අපේ නගර සභාවෙන් ඉටුවිය යුතු යුතුකමක් තමයි ඔබතුමා යෝජනා කර තිබෙන්නේ.එය ලබා දීමේදි අපේ විපක්ෂනායකතුමාත් කිවු ආකාරයට ප්‍රශ්නයක් ඇති නොවන විදියට ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ර්.ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා පලමුවෙන්ම ස්තුති වන්ත වෙනවා මෙවැනි යෝජනාවක් සම්මත කරගෙන කාන්තාවන්ට අවශ්‍ය දේවල් ලබා දීම පිළිබඳ.නමුත් උපහාසයට අපහාසයට පත්කිරිම පිළිබඳව මා පළමුව කනගාටු වෙනවා. කාන්තාවට යම් වැදගත් දෙයක් කිව්වාම අද සමාජයේ මා දුටු දෙයකි .ඒය අභිරහසක් නෙමේ.පවුල් සෞඛ්‍ය සේවිකාව වුණත් කියා තිබෙන්නේ එය ලබා දීම වැදගත් .මෙම භාණ්ඩ ලැයිස්තුව කිවුවාම හිනා වුණා.මෙය සෞඛ්‍ය අංශයට විශාල සේවාවවකි.

තීරණය

2019.10.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් , ගර්භනි මවක් දරු ප්‍රසුතිය සඳහා රෝහල් ගත වීමේදි රැගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුව නොමිලේ ලබා දිම සඳහා සමෘද්ධිලාභි පවුලකට නම් පවුල් සෞඛ්‍ය සේවිකාවගේ , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනියගේ ,ග්‍රාම නිලධාරි මහත්මියගේ වාර්තා අනුවත් , සමෘද්ධි නොමැති නම් ග්‍රාමසේවක මහතා සහ ගරු නගර සභා මන්ත්‍රිවරයා සහතික කළ යුතු බවත් මෙය ලබන වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරිම සුදුසු බවටත් , ගරු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා ඩෙනට් පතියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.10.25 දින පැවති අම්බලන්ගොඩ වෙළඳ සංගමය සමඟ පැවති සාකච්ඡා වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.10.25 දින පැවති අම්බලන්ගොඩ වෙළඳ සංගමය සමඟ පැවති සාකච්ඡා වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.10.25 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටු වාර්තාව පිළිගත යුතු සුදුසු බවට ගරු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.06 **2019.10.29 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>**

2019.10.29 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා

**තීරණය**

2019.10.25 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටු වාර්තාව පිළිගත යුතු සුදුසු බවට ගරු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.07 2019.10.29 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.10.29 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කමිටු ගැන කතා කිරිමේදි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ක්‍රීඩා කමිටු වාර්තාවද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ත්‍රිවිල් කමිටුව ගැන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ත්‍රිවිල් කමිටු වාර්තාවක් මෙහි නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

වාර්තාවක් නැති එක ගැන තමයි මේ කතා කරන්නේ.වාර්තාවක් එන්නේ , කමිටුවක් රැස් කරන්නේ මාස දෙක තුනකට සැරයක්.අපි ත්‍රිවිල් කමිටුවට සහභාගී වෙනවා. දැන් අවුරුද්දට දෙතුන් පාරක් තමයි තියන්නේ.විපක්ෂනායකතුමාත් දන්නවා. එතුමාත් සැහෙන්න කතා කරනවා මේ ගැන.එතකොට මාස තුනකට පස්සේ තිබ්බේ.හැබැයි ගිය මාසයේ තිබ්බේ නැහැ. මෙහි සඳහන් වෙන්නෙත් නැහැ.තිබ්බද නැද්ද කියා. තියන්නේ නැහැ.දැන් මේ ත්‍රිරෝද කමිටුවෙන් ගනු ලබන තීරණ කිසිවක් ක්‍රියාත්මක වන්නේ නැත.අපි යෝජනා කරලා යනවා.තේ එකක් බිලා යනවා. එය පොත පතට විතරක් සීමා වෙනවා. මේ වසරටම ත්‍රිරෝද කමිටුවෙන් කරනු ලැබුවේ ඒ සඳහා ස්ටිකර් එකක් නිකුත් කළ එක පමණි. ගරු උප සභාපතිතුමා යෝජනා කරනවා.ගරු විපක්ෂ නායකතුමා යෝජනා කරනවා, අපි යෝජනා කරනවා. කිසිම දෙයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අර පුංචි පොළ ඉදිරිපස තිබෙන පාරේ වාහනයක් ගන්න බැහැ. ඔබතුමාටත් පෙනෙනවා ඇති. එතැන වළක් තිබෙනවා. වාහන යනවිට එම වළට බහින්න වෙනවා. එය වසා දමා නැහැ.ඒ පුංචිපොළ පාරේ වෙළඳාම් කරන කාන්තාවන් බයිසිකලයක් යන විට අයින් කරන විට කාන්තාවන් බනිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මං එයට විසඳුමක් දෙන්නම්. ලේකම්තුමිය දැන් හැම කමිටුවකම ගන්න තීන්දු තීරණ ඊළඟ කමිටුවේ සඳහන් කරලා විශ්ලේෂණය කරන්න.මේ යෝජනාව කළා. මොකද කළේ කියා එය තිබිය යුතුයි. හැම එකෙම් පසු විපරමක් කරන්න.න්‍යාය පත්‍රයට ඇතුල් කරන්න. එම පසු විපරමේදී දෙවැනි වාරත් මතක් කරන්න තිබුණොත් එම නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට පිටපතක් සමඟ එම නිලධාරියා දැනුවත් කරන්න. තුන්වෙනි වරත් පැමිණියහොත් එම නිලධාරියාට ලැබෙන ප්‍රතිඵලය මොකක්ද කියා එම නිලධාරියා දැන ගනිවි. නැතිනම් නිලධාරින් වැඩ කරන්නේ නැහැ කියන්න බැහැනේ. දැන් මේ තින්දු ගන්න පුළුවනි ගරු මන්ත්‍රිවරුන්ට. එය ක්‍රියාත්මක විය යුත්තේ නිලධාරින් තුළිනි.දෙවැනි පාරත් ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් එම නිලධාරියා අම්බලන්ගොඩින් ගෙදර යනවාද කියා තීරණය කලාවි.ඒ අනුව කටයුතු කරන්න. එහෙම නොකොලොත් තුන්වෙනි ලිපිය එන්නේ ඔයාගේ ෆයිල් එකට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

නගර සභාවේ වැඩක් සිද්ධ වෙන්නේ සෞඛ්‍ය අංශයෙන් හා කර්මාන්ත අංශයෙන් පමණි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපි කළමනාකරණ කමිටුවේදි සාකච්ඡා කළා. මා ලේකම්තුමියට උපදෙස් දුන්නා මේ සම්බන්ධව ක්‍රියාත්මක වන්නේ නැති නිලධාරින්ට ඊළඟ පාර කතා කරනවිට න්‍යාය පත්‍රයට දමන්න.ඊළඟ පාර එනවිට එයාගේ පුද්ගලික ලිපි ගොණුවටත් දමන්න.උසස් විමක් ඉල්ලන විට එම නිලධාරියා දක්ෂ නිලධාරියෙක්ද අදක්ෂ නිලධාරියෙක්ද කියා ඔහුගේ පෞද්ගලික ලිපි ගොණුව පරික්ෂා කළාම පෙනෙනවා. එම හින්දා ඒ අය වැඩ කලාවි.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ඔබතුමා ගරු උපසභාපතිතුමාටයි , කමිටුවටයි බලය පවරා තිබෙනවා.එතුමා කියනවා මාස තුනක් බලා මා අයින් වෙනවා කියා.නමුත් මෙහෙම අයින් වීමෙන් මේ කටයුතු ඉෂ්ඨ සිද්ධ වෙන්නේ නැහැ.ගාල්ලේ බන්ධනාගාරේ පාලනය යන්නේ මාගල්ලෙන්. ඒ වගේ කවදා හරි අම්බලන්ගොඩ නගරය පාලනය කරන්න වෙන්නේ ත්‍රිවිල් රියදුරන් විසිනි.ඔන්න ඔයවගේ තත්ත්වයක් තමයි උදා වෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ක්‍රිඩා කමිටු වාර්තාව නිසා මෙහි අතුළු නොවුන කාරණයක් මතක් කළ යුතුයි.අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයේ තිබෙන වුඩ්න් ෆොලෝ එක අබලන් වී ගෙන යනවා. මෙකට හේතුව මා හොයා බැලුවා . අපි මෙය පොලිෂ් කරලා ලස්සනට හදා තිබෙනවා. මේ සඳහා අපි ලක්ෂ 5කට වැඩි මුදලක් වැය කර තිබෙනවා. වෙලා තිබෙන්නේ එම ක්‍රිඩකයෝ එම ක්‍රිඩා පාවහන් නිවසේ සිට පැළද ගෙන පැමිණ ආවොත් නැවත සෙල්ලම් කරන විට මෙම කාපට් එක කැපෙනවා. එමනිසා මෙය සවුත්ත් වෙලා තිබෙන්නේ දැන්. ගොඩගන්න බැරි මට්ටමට සවුත්තු වෙලා තිබෙන්නේ. දැනට පාවිච්චි කරන්නේ වුඩ්න් ෆොලෝ එක නෙමේ කාපට් එකක් පාවිච්චි කරන්නේ.එම සාකච්ඡා කළා. මා ලේකම්තුමියටත් එම ලිපිනය ඔක්කොම දුන්නා.එම කාපට් එකක් ඇලවීමට හැකියාව තිබෙනවා. ලක්ෂ 4යි ගණනක් වගේ වියදම් වෙනවා. අපි සභාවේ එම කටයුත්ත නිම කරන්නත් අනුමැතිය ඉල්ලා සිටිනවා. එහිදි මා මතක් කළ යුතුයි මේ පැමිණෙන ක්‍රීඩකයෝ තමන්ගේ සපත්තු දෙක වෙනම බෑග් එකක දමා ගෙන එන්න ඕන. එසේ දමාගෙන ඇවිත් ක්‍රිඩා කරන අවස්ථාවේදි පමණක් දමා ගත යුතුයි. පාර දිගේ දමාගෙන ආවොත් එහෙම සම්පුර්ණම එය නැතිවෙනවා. දැනට මිට වසර 7කට 8කට කලින් අපි ලක්ෂ 4ක් වියදම් කර සාදන ලද ෆොලෝ එක සවුත්තු විමට ප්‍රධානම හේතුව පාරදිගේ දමාගෙන ඇවිත් එහි ක්‍රීඩා කරනවා. මෙය බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය තුළ දැන්විමක් පළ කරන්න. නැතිනම් අපි කොච්චර වියදම් කළත් වැඩක් නැහැ. මේ තත්ත්වය තිබුණොත්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා අර කමිටුව ගැන සාකච්ඡා කළා. විශේෂයෙන්ම අපි ගිය මාස 3කට එකක් වගේ තිබ්බේ. මෙතැන අපි ගන්න තින්දු ක්‍රියාත්මක වුණේ නැති වුණාම මෙතැන අපි ඇවිත් වැඩක් නැහැ. මා එම නිසායි ප්‍රකාශ කළේ ගිය සභාවෙත් මාස තුනක් බලා මා අයින් වෙනවා කියා.අපිට දැන් මෙතැනට පැමිණ එම තනතුරු ගෙන කමිටු ගන්න තීරණ ක්‍රියාත්මක වන්නේ නැතිනම් අපි මෙතැනට පැමිණිම වැඩක් නැහැ.අපි වාඩිවෙලා වැඩකුත් නැහැ. කොතෙක් වුණත් අපි මේ කමිටු ගන්න තීන්දු තීරණ ක්‍රියාත්මක වෙලා නැහැ. මේ අම්බලන්ගොඩ නගරය ඉතාමත්ම අශෝභන නගරයක් විදියට තමයි මා දකින්නේ. මා මේ සභාවේ පාලක පක්ෂයේ මන්ත්‍රිවරයෙක් හැටියට , උප සභාපති හැටියට ඇත්තටම කනගාටු වෙනවා.මේ අම්බලන්ගොඩ නගරයේ ක්‍රියාත්මක වන මේ කටයුතු හැටියට.මනුස්සයකුට පාරේ බැහැලා යන්න බැහැ. ලැජ්ජා වෙන්න ඕන. කොහොමද පාරේ බැහැලා යන්නේ. ගර සභාපතිතුමා යන්න පාරේ බැහලා යන්න පුළුවන්ද කියා. ක්‍රියාත්මක වෙන්න. මා ගරු සභාපතිතුමාට නියෝගයක් කළා ගංවතුර ගලන ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් වැසිකිළි වළවල් ඉහින්න

කියා ගරු සභාවේ තින්දුවක් ගත්තා. විශේෂ තින්දුවක් ගත්තා ඔබතුමා විසින්. මේවා එකක්වත් ක්‍රියාත්මක වුණාද කියන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

කොහේද ක්‍රියාත්මක වි තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එකක් මානාන පන්සලේ ක්‍රියාත්මක වුණා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ක්‍රියාත්මක වි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමිය දන්නවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මන්දන්නේ නැහැ. ක්‍රියාත්මක වි තිබෙනවාද කියා. අද වෙනකම් වාර්තා ආවාද කියා මා දන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා එහිදි අපි බැලුවා . අපි මේවා ගෙනහින් දමන්නේ ජලසම්පාදන මණ්ඩලයේ පිරිසිදු කරන තැනට. ඒ අය කියන්නේ මුළු දවසටම පිරිසිදු කර දෙන්නේ ගලි ලෝඩ් 6ක් පමණක් බවයි. ඉතිං අපිට ඕන නම් දෙකක් විතර භාර ගන්න කැමතියි.ඒක තමයි වෙච්ච ප්‍රශ්නය. අපි අදින්න කැමති වුණාට දාන්න ක්‍රමයක් නැහැ. එක තමයි වේලා තිබෙන්නේ. දෙක දෙක ඇඳලා ඉවර කරන්න ගියොත් එහෙම ඔය ටික අදින්න අවුරුද්දක් විතර යනවා. හැබැයි මෙහෙම දෙයක් තිබෙනවා. අපි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමියට හා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිට කියන්න ඕන. පුද්ගලික අංශයේ ගලි නම් හැමදාම අදිනවා. මට පෙන හැටියට මේවා අනවශ්‍ය තැන් වලට බැහැර කරනවා. මේ අය මා හිතන්නේ ජල සම්පාදන මණ්ඩලය හා ජලපවාහන මණ්ලයට දමන්නේ නැහැ. වෙන කොහේ හරි ඇළවල් , වෙළවල් වලට දමනවා. මේ ගැන හොයලා බලන්න ඕන . මෙය ලොකු පරිසර හානියක් වෙනවා. එය සොයා බැලිය යුතු වෙනවා.අපට ඇඳලා දෙන්න පුළුවනි. නමුත් අපිට දාන්න තැනකුත් තියෙන්න ඕන.අපිට දාන්න බැහැ.මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා සිටිනවා ද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා කවදාවත් මේ රැස්විමට සහභාගි වෙන්නේ නැහැ.නගර සභාවට වගකියන්නේ නැති නිලධාරියෙක් ඉන්නවානම් හරි කනගාටුයි. මා මේ ළඟදි පරණ පාරේ ගමන් කරන විට පාරේ ගැට ගසා තිබෙන රෙද්ද කඩන් වැටිලා. කඩන් වැටිලා ලණුවත් සමඟ හුළඟට යනවා. වාහනය නතර කරලා මා ඡායාරුපයක් ගත්තා. ජනතාව අපෙන් අහනවා. ඇයි මේවා තිබෙන්නේ. මනුස්සයකුට යන්න බැහැ. එක නුලක් කඩාගෙන

වැටිලා. මෙහෙම මෙහෙම හුළගේ යනවා පාර මැද.පාලකයෝ වශයෙන් මොකද හැඟෙන්නේ. පොලිසියෙන් සිටිනවා එතැන බලාගෙන.පොලිසියෙන් හිටියා එතැන හතර දෙනෙක්.මාර්කට් හංදියේ ත්‍රිරෝද ගහලා තිබෙන්නේ මෙහෙම මෙහෙම 4ක්. ඉතිං අපි පාලකයෝ. අපිට පාරේ යන්නත් බැහැ.අපි පාලකයෝ පාරේ යන්න බැරිව මහජනතාව කොහොමද පාරේ යන්නේ.මේ සභාවෙන් ක්‍රියා මාර්ගයක් ගන්නේ නැතිව. මොනවා හරි ක්‍රියා මාර්ගයක් ගන්න ඕනනේ.සභාවෙන්නේ නගරය පාලනය කරන්නේ.ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ. මෙය පොලිසියට කරන්න බැරි නම් ඉහළට හරි කතා කරන්න. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙයට ක්‍රියා මාර්ගයක් ගන්න. මේ නගරය නැති වෙනවා නැතිනම්.අපේ අම්බලන්ගොඩ ජනතාවට තමයි මෙය නැති වෙන්නේ. එමනිසා ඔබතුමා මෙය ඉහලට හරි දන්වන්න.මාසයකට රැස්වීමක් තිබෙනවා. හිමාල් මහතා සහභාගි වුණා.මූලස්ථාන පොලිසි පරික්ෂකතුමා ඇතිව. දැන් එය ක්‍රියාත්මක වෙනවාද හිමාල් මහතා. ඔබතුමා කලින් සහභාගි වෙන්නේ. දැන් ඔබතුමා සහභාගි වෙනවාද? දැන් මා දන්නේ නැහැ. දැනුවත් කරනවාද කියා.මා හරි සහභාගි වෙන්නම්. මට වඩා එතැන මීටර් 200කට එහා ඉන්නේ.ඔබතුමාට හොඳටම පෙනෙනවා. අද මෙතුමා කිවු පරිදි පුංචි පොළ පාරේ යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ.ඒ වගෙත් ත්‍රිවිල් ගහලා. මේ නගරේ ත්‍රිවිල් වලටම යටවෙලා ඉවරයි.මිනිහෙකුට පාරේ බැහැලා යන්න බැහැ. ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. අපි පාලනය කරන කොට තීරණයක් ගන්න ඕන.ඒ දේ කරන ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. නැතිනම් මේ නගරය අපට පාලනය කරන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ඇත්තටම අපේ ගරු උප සභාපතිතුමාගේ නායකත්වයෙන් මමත් දැන් මේ මාස ගණනක් තිස්සේ නිලධාරින් ගෙනෙල්ලා මේ පිළිබඳ සාකච්ඡා කළා. මෙය අම්බලන්ගොඩ නගරයට ඉතාමත් අපකීර්තිමත් සිද්ධියකි. මොකද මේ නගරයේ මා මාගේ පටිගත කළ දර්ශන පෙන්නුවා. මා දුටුවා අපේ ජී.එම්.එස්. ද සිල්වා මහතා ගමන් කරනවා. ඊට ඉදිරියෙන් මොටර්රථයක් ගමන් කරනවා. එතුමාට වාහනය ගන්න බැරිවෙන කොට එතුමාට ත්‍රිරෝද රථ රියදුරා කොහොමද බැණ වැදුනේ කියා. ඉතිං මේවා බොහොම අශෝභනයි. අපේ මිත්‍රයන් කොළඹ සිටින කියනවා උඹලාගේ නගරයේ වාහනයක් නතර කරන්න තැනකුත් නැහැ. යන්න විදියකුත් නැහැ කියා. ඔබතුමාටත් ලැජ්ජායි.මෙතැන සිටින බොහෝ අයගෙත් සිටිනවා.අපි ලැජ්ජා වෙන්න ඕන අම්බලන්ගොඩ නගරයේ බුද්ධිමත් නගරයේ අපි අපොහොසත් වෙලා තිබෙනවා. මේ ක්‍රමවේදය හරියට හදන්න.මා ගරු සභාපතිතුමාගෙන් බොහොම කරුණිකව ඉල්ලා සිටිනවා.මමත් ,ගරු උප සභාපතිතුමාත්, අපේ අනෙකුත් ගරු මන්ත්‍රිවරුත් මේ ඔබතුමා වෙනුවෙන් අපි ගන්නවා තින්දුව දෙසැම්බර් 20 ට කලින් .අපි දෙසැම්බර් මස 20 කලින් අපි ඔබතුමාට දෙනවා ත්‍රිරෝද රථ කමිටුවේ සම්පූර්ණ තින්දුව ගරු උප සභාපතිතුමා ,මමත් අපේ අනෙකුත් ගරු මන්ත්‍රිවරුත් අත්සන් කරලා. හැබැයි එම දෙන තින්දුව 31 වෙනිදාට කලින් ක්‍රියාත්මක කරන්න. අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කරන්න.මා එදත් කිවුවා. ලේකම්තුමියට මතක් කළා. සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන්න.නොවැම්බර් මස 17 වෙනිදා ගෙන් පසු සංවර්ධන කමිටු කැඳවනවා. ඔබතුමා කරුණාකරලා මෙය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන්න. එතකොට අපි තින්දුව ගන්නවා. එක ඉදිරිපත් කරන්න. මොකද ගරු උප සභාපතිතුමා කියන එක බොහොම සාධාරණයි. අපි ඔබතුමා ඇතුළු අපි සියළු ගරු මන්ත්‍රිවරුන් හැල්ලුවට ලක්වෙනවා.

නගරයේ අඩුම ගණනේ රථ වාහන ටික පාලනය කර ගන්න. නගර සභාවක් කියා. එය අපි සියළු සමස්ත ගරු මන්ත්‍රිවරුන්ට හොඳ නැහැ. එමනිසා මේ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මෙයට අපි දෙන තින්දුව වහා ක්‍රියාත්මක විය යුතුයි. අපි දැන් 80% කට වැඩියේ වැඩ අවසන්. දැන් ක්‍රියාත්මක වෙන්න තිබෙන්නේ. දැන් අපි ඒවාට අංක දුන්නා. දැන් තෙරුවා.එම ටික දමන්න පුළුවනි ත්‍රිරෝද ගාල් වලට. එම ටික දමන්න එම ත්‍රිවිල් රථ ගාල් වලට. ඇයි මේ පමා කරන්නේ. මෙතැන කමිටුවල ගනු ලබන තීරණ ගැන ක්‍රියාත්මක වන්නේ නැතිනම් ඇයි අපි මෙවගේ වාඩි වී සිටින්නේ. තේරුමක් නැහැ. ගරු සභාපතිතුමාගේ වගේම ගරු ලේකම්තුමියගේත් වගකිමක් තිබෙනවා.ගරු මන්ත්‍රීවරුන් එම කමිටුවලින් ගන්න තින්දු ක්‍රියාත්මක කරන්න ඔබතුමියටත් වගකිමක් තිබෙනවා.කරුණා කරලා එම කමිටු තින්දු ක්‍රියාත්මක කරන්න.ත්‍රි රෝද කමිටුව සඳහා මේ වන විට අපි ගොඩක් තින්දු අරගෙන අවසන්. එම තින්දු ක්‍රියාත්මක කරන්න. පොලිසි කැඳවා මේ දේවල් ක්‍රියාත්මක කරන්න.අපි කිවුවා ලේකම්තුමියට. මෙවා බිරි අලින්ට විණා වයනවා වගේ ඉන්නවා. මේක කරන්න එපා. මෙය කළාම වෙන්නේ ගරු සභාවම අපහසුතාවයට පත්වෙනවා.මෙය ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාරදූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මටත් සමහර වේලාවට අත්දැකිමට මුහුණ දෙන්න සිද්ධ වුණා. මෙම ත්‍රි විල් වල මුදල් අය කිරිම ගැන මට ගැටළුවක් තිබෙනවා.හිතෙන හිතෙන ආකාරයට මුදල් අයකරනවා. මට එහෙම වේලා තිබෙනවා. එක දවසකට රු70/= ක් හා අනෙක් දිනයට රු.100/=ක් . ඇයි අපට බැරි අපේ බලපත්‍රය දෙනවා නම් මීටර් එකක් සවි කරන්න. හැම තැනම සවිකර තිබෙනවා. අපේ බලපත්‍රය දෙන්න මීටරයක් තිබෙන ත්‍රිවිල් රථයකට. නැතිනම් ඒ අයට හිතෙන හිතෙන වේලාවට හිතෙන හිතෙන ගණන් අය කරනවා. දැන් අපේ නිවසට ගමන් කිරිමට හිතෙන හිතෙන ගණන් අය කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා ගෙන එනු ලැබුවා කමිටු සම්බන්ධව ත්‍රිරෝද රථ කමිටුව සම්බන්ධව . මා හිතන්නේ ගරු උප සභාපතිතුමා මේ පිළිබඳ ඉතා දැඩිලෙස විග්‍රහ කළා. ගරු උප සභාපතිතුමාත් ගරු මන්ත්‍රිතුමාත් ඉදිරිපත් කරන කාරණය පිළිබඳව කොහේ හරි වරදක් ඇති. එක්කෝ නිලධාරින්ගෙන් වෙන්නැති. හැබැයි නිලධාරින්ගෙනුත් අපි ඇසිය යුතුයි මෙය ක්‍රියාත්මක කිරිමට ගත හැකි ක්‍රියාමාර්ගය මොකක්ද කියා. මොනවා හරි ගැටළු ඇතිනේ.එකත් අපි සොයා ගත යුතුයි. මා නම් හිතන්නේ නිලධාරින් මෙයට යොමු වෙනවා.නමුත් පොලිසියේ සහාය අඩුයි කියා මට තෙරෙන්නේ. දැන් අහනවා අපි මොකක්දමෙය ක්‍රියාත්මක කිරිමට ඇති ප්‍රශ්නය. දැන් එක දැනගන්න කැමතියි. ඔබතුමා දැන් වුණත් කමක් නැහැ. පොලිසියේ රථ වාහන අංශයේ මුලස්ථාන පරික්ෂක මහතාට දැන් වුණත් එන්න කියන්න. පැමිණ දැන් වුණත් ප්‍රශ්නය විසඳන්න. පාලක තන්ත්‍රයේ සිටින ආසන සංවිධායක වරයා සිටිනවා. දැන්ම තින්දුව ගන්න. පස්සට යන්න හොඳ නැහැ.නමුත් මාසයක් යනවා . ආපහු පස්සට යනවා. එක අමතක වෙලා යනවා. දැන් නිලධාරින්ගෙන් අපි දැන ගන්න කැමතියි. නිලධාරින්ට බැණලා වැඩක් නැහැ. මොනවාහරි ගැටළුවක් තිබෙනවා ඇති.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

දැන් ගරු සභාපතිතුමා වෙලා තිබෙන්නේ ත්‍රිවිල් කමිටුවෙන් තින්දු ගෙන අදාල අංක ගසා අදාළ ස්ථානවල අංක ගසා දිලා තිබෙනවා. බලහත්කාරයෙන් ඒ තැන්වල ත්‍රිවිල් ගසනවා. වෙන එකෙනෙක්වත් බලපත්‍ර ගන්න එන්නෙත් නැහැ. දැන් 20ක් තිබෙන තැන්වල දෙනෙක් තුන් දෙනෙක් බලපත්‍ර ගෙන එම නම්බර් ගසා තිබෙනවා. එතකොට කට්ටියක් දොස් කියනවා අර මිනිසුන් ගන්නෙත් නැහැ. බලහත්කාරයෙන් ත්‍රිවිල් දුවනවා. මෙකට විරුද්ධව රාජකාරියක් ගරු සභාපතිතුමනි කරන්න ඕන. නැතිනම් මෙය එක්කෙනෙකුට දෙනෙක්කුට හරි කරන්න ඕන. උදාහරණයක් ලෙස නගර සභාවෙන් එක පුද්ගලයෙකුට දෙන්නෙකුට නඩුවක් දමා එම පුද්ගලයා වසර ගණනක් නඩු කිවුවා එම පුද්ගලයා නිවැරදියි කියා. එතකොට පොලිසියෙන් දුන් උපදෙස් අනුව එම පුද්ගලයා නඩු කිවුවා . වසර තුන හතරක් නඩු කිවුවා. එම පුද්ගලයා වැරදි කරු වුවා. එතකොට නගර සභාව නඩුව දිනුවා.එතකොට මේ තත්ත්වය තුළ එක්කො මේ අයට නඩු දැමිය යුතුයි. නැතිනම් පොලිසිය දමා මේ අය අයින් කළ යුතුයි. ගරු සභාපතිතුමා අපේ දේපලනේ. දැන් ඔබතුමා උදාහරණයක් ලෙස කොරිඩෝ එක ගාව බස්රථයක් ගැහුවා. එම වේලාවේ ඔබතුමා ගිහින් එයට තීරණයක් ගත්තා. කවුරු මොනවා කිවුවත් එය හොඳ ක්‍රියාවලියක්. එහෙම ගියානම් මේ නගරය බස්රථ රියදුරන්ට දෙන්න වෙනවා. එම නිසා අපේ දේපල මේවා. අපිට අයිති නගර සභාවට අයිති දේපල. එතකොට නගර සභා දේපලින් මේ අය ගසාගෙස ඉන්නවා. ඇයි අපට නිති මාර්ගයෙන් ක්‍රියා මාර්ගයක් ගන්න බැරි.නිලධාරින් ඉන්නවානම්.ඔබතුමා උපදෙස් දෙනවා නම් ඇයි ගන්න බැරි ක්‍රියා මාර්ගයක්. නිලධාරින්ට මොකද මෙය කරන්න බැරි හේතුව. එක තමයි හේතුව.

**ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් කිව යුතුයි. අර පොඩි පොළ ළඟ පාරේ ගේට්ටුව අසළ හැමදාම ත්‍රිවිල් එකක් ගසා තිබෙනවා. හැමතැනම හිර වෙලා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. ගරු මන්ත්‍රිවරුන් තේරුම් ගන්න.අපි අම්බලන්ගොඩ පොලිසිය නෙමේ. එතකොට පොලිසියේ තිබෙන ආයුධ ඒ බලය අම්බලන්ගොඩ නගර සභාවට නැහැ. ඔය කියන ඒවා හෙට මේ පුටුවේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා වාඩි වුණත් , ගරු නගර සභා මන්ත්‍රි ධර්මදාස මහතා වාඩි වුණත් ඕක ඔහොම ම තමයි. දැන් මේ සරළ උදාහරණයක්. ආදායම් පරික්ෂක මහතාණෙනි , මෙයට නඩු පවරන්න බැරි ඇයි. ඔන්න දැන් අහන්න ඔගොල්ලන්. එක ඔගොල්ලන්ට අදාල නැහැ. නඩු දිනන පරිදින එක ඕගොල්ලන්ට අදාල නැහැ. අවුරුදු එකාමාහරක් රු.750/= කට නඩු කියනවා කියන්නේ එම මනුස්සයා අවුරුදු 1 ½ යනවිට රු.25000/= විතර වියදම් කරලා. ආයි ජිවිතයට එන්නේ නැහැ. මතක තියා ගන්න. නඩු පැවරුනායි කියා ඔයා රාස්සාවෙන් අස් කරන්නේ නැහැ. නඩු දමන්න . මෙච්චර කල් දමන ලද නඩුවක් මේ නගර සභාව පැරදි නැහැ. හැබැයි ඕගොල්ලන් නැති නිසා නඩු 6ක් විසි කළා. මේ පාර මේ අයගේ පඩි වලින් එය කපන්න.මා උසාවියේ හිටියා. හරිගස්සන් කියන්න බැහැ. අම්බලන්ගොඩ නගර සභාවෙන් නඩු 6ක් තිබෙනවා. මේ අය හිටියේ නැහැ. නඩුව කතා කරන අවස්ථාවේ. නඩුව විසිකළා. මහේස්ත්‍රාත්තුමා. මෙයට නිලධාරින් වගකිව යුතුයි. ඔයා ඔන්නම් මෙතැන අමාරු

නම් නියාගම ප්‍රාදේශීය සභාවටම හදාගෙන යන එක හොඳයි. නැතිනම් රක්ෂාව නැති වෙන්න පුළුවනි. වැඩේ කරනවානම් කරන්න. දැන් ඔන්න ඕකයි වෙලා තිබෙන්නේ. මේ ප්‍රශ්න අහන්න ගියොත් මේ අයගේ ආත්ම ගෞරුත්වයත් තිබෙනවා. එක නැති වෙන එක විතරයි වෙන්නේ. ඕගොල්ලන් ගන්න තින්දු ක්‍රියාත්මක කරන්නේ මේ අය. මේ අය ගන්නේ නැතිනම් ලේකම්තුමිය පලවෙනි පාර ලියුම දුන්නා. දෙවැනි පාර ලියුම දුන්නා. ලියුම් දුන්නාම මේ අය කරන්නේ නැති වෙනකොට මේ තරු තුන තරු දෙක වුණා. තරු එක වුණාම හම්බවෙයි තරු වලින් භාගයකුත් නැතිව. එක තමයි වෙන්නේ. වැඩ කරන්න බැරි නම් එච්චරයි. ඔයා වැඩ කරන පැත්ත නෙමේ මට කතා කරන්නේ . වැඩ නොකරන පැත්තයි කතා කරන්නේ. නෙකෙරෙන පැත්ත කතා කරනවා නම් ඒ විදියේ තැනකට යන්න. කරන්න ඕන අපට . අපිට වැඩයි ඕනේ. නැතිනම් තනතුරු වැඩක් නැහැ.

**තීරණය**

2019.10.29 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් , බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය සඳහා කාපට් එකක් ලබා දීමටත් බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා පැමිණෙන ක්‍රිඩකයන් පිටතින් පැළඳ එන පාවාහන් පැළඳ ක්‍රීඩා කිරිමෙන් වලකින් ලෙසත් ඒ සඳහා පාවාහන් පැළඳ ගත යුත්තේ ක්‍රිඩාගාරයට පැමිණීමෙන් පසු බවටත් ගරු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

- පස්වරු 12.40 ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා සභා ගර්භයෙන් පිටව ගියහ.
- පස්වරු 12.40 ට ගරු සභාවේ මුලාසනයට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පැමිණියහ.

07. **ටෙන්ඩර් හා මිළ ගණන්**

07.01 ටෙන්ඩර්

07.02 මිළ ගණන්

07.02.01 අම්බලන්ගොඩ නගර සභාව සතු මාර්ග වල පලුදු වැසීමේ කාර්යය සිදු කිරිම සඳහා Pot holes (තාර ) ලබා ගැනීම සඳහා මිළ ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | Access Engineering<br>එකක් තොගය |
|---|---|---|---|---|
| 01 | Asphat wearing course | Mt 1.00 | | 7500.00 |

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ .සෝභිත රංජිත් මහතා කතා කරමින්**

මුහුදු වෙරළ පාරේ වැලි ට්‍රිපර් රථ යන විට පාර කැඩෙනවා. එයට මොකක් හරි තීරණයක් . ගන්න.මුදලක් අයකරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපට එහෙම පාරක් වහන්න තීරණයක් ගන්න බැහැ.එහෙම මුදලක් අය කරන්න බැහැ.නිත්‍යානුකූල තත්ත්වයක් නැහැ. පාරක් වහන්න.

අම්බලන්ගොඩ නගර සභාව සතු මාර්ග වල පලුදු වැසීමේ කාර්යය සිදු කිරිම සඳහා Pot holes(තාර ) ලබා ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබුණේ එක ආයතනයක් බැවින් මාර්ග නඩත්තු කිරිමට අත්‍යවශ්‍ය බැවින් ලැබි අති එකම මිළ ගණන් පිළිගැනීමට සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.02

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Eser Marketing | Sports Shop | Rangjaya sports | Sports Zone |
|---|---|---|---|---|---|---|
| | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | Sky Stepper | 03 | 327000.00 | 615000.00 | 375000.00 | 555000.00 |
| 02 | Air walker | 03 | 447000.00 | 615000.00 | 495000.00 | 555000.00 |
| 03 | Pull and Push Chair | 03 | 477000.00 | 642000.00 | 555000.00 | 630000.00 |
| 04 | Sit up bench | 03 | 207000.00 | 297000.00 | 315000.00 | 555000.00 |
| 05 | Fitness Rider | 03 | 267000.00 | 372000.00 | 375000.00 | 555000.00 |
| 06 | Running Machine | 03 | 537000.00 | 525000.00 | 435000.00 | 615000.00 |
| 07 | Parallel Bar | 03 | 417000.00 | 660000.00 | 585000.00 | 537000.00 |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය එළිමහන් ව්‍යායාම උපකරණ ලබා ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති Eser Marketing ආයතනයෙහි මිළ ගණන් පිළිගැනීමට සුදුසු බවටත් , තාක්ෂණසේවා නිලධාරි හර්ෂණ මහතා , අම්බලන්ගොඩ ක්‍රීඩා නිලධාරි හා කලාප අධ්‍යාපන කාර්යාලයේ ක්‍රීඩා අධ්‍යක්ෂකතුමන් යන නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය මත එළිමහන් ව්‍යායාම උපකරණ මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

08. **ගෙවීම් :-**

08:01 2019 ඔක්තෝම්බර් මස NBT කොටසක් වන රු.25000/= ක මුදලක් මුදලක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:02 සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2019.10.01 දින සිට 2019.10.15 දක්වා ඉන්ධන ලබා ගැනිම වෙනුවෙන් රු.109168/= මුදලක් සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:03 සභාව සතු LL-7642 අංක දරණ කෘ කැබ්රථයේ සේවාව හා දොර ලොක් 01ක් සවිකිරිම සඳහා කග්ගොඩ ආරච්චි කේටරින් වෙත රු.16910/=ක මුදලක් දේශිය ණය සහ සංවර්ධන අරමුදලට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:04 ආදාහනාගාරය වෙනුවෙන් ලබාගෙන ඇති ණය මුදල 2011( I,II,III,IV) කාර්තු සඳහා වාරික සහ පොලි මුදල වන රු.314250/= ක මුදලක් දේශිය ණය සහ සංවර්ධන අරමුදලට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:05 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ස්ථාන වල 2019 ජුලි මස විදුලිබිල්පත් වල මුදල වන රු 87925.33ක මුදලක් සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත සභා අනුමතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:06 අම්බලන්ගොඩ නගර සභාව පොදු මංමාවත් වල 2019 අගොස්තු මස විදුලිබිල්පත් වල මුදල වන රු 12619.06ක මුදලක් සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත සභා අනුමතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:07 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ස්ථාන සඳහා 2019 මැයි මස ජලබිල්පත් මුදල වන රු.32049.21ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා අනුමතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:08 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ස්ථාන සඳහා 2019 ජුනි මස ජලබිල්පත් මුදල වන රු.22337.78 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා අනුමතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:09 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ස්ථාන සඳහා 2019 ජුලි මස ජලබිල්පත් මුදල වන රු.22461.99ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා අනුමතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:10 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් භාවිතා කරන ලද Led Screen සැපයීම වෙනුවෙන් රු.45000/= ක මුදලක් H2 Etertainment (Pvt) Ltd ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:11 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සමරු තිළිණ වෙනුවෙන් රු.20600/= ක මුදලක් සමරා ප්ලාස්ටික් ඇන්ඩ් ග්‍රැපික් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:12 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සහතිකපත්‍ර හා ආරධනා පත්‍ර, ලිපිගොණු, මෙරුන් කලර් බැජ් වෙනුවෙන් රු.40900/= ක මුදලක් සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:13 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් භාවිතා කරන ලද ශබ්ද විකාශන සැපයීම වෙනුවෙන් රු.34700/= ක මුදලක් උපේන්ද්‍ර එගොඩගේ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය සභාවේ අනුමත කරලා තිබෙනවා. එම ටෙන්ඩරය මේ සභාවේ අනුමත කරගෙන තිබෙන්නේ. මේ ගෙවීම හරි ඒ වුණත් මෙහි ලොකු වැඩි මුදලක් මෙයට තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාවෙන් අනුමත කර තිබෙනවා. ඒ ගැන කතා කිරීම වැරදියි. එක ටෙන්ඩරයෙන් අනුමත කරලානම් කරන්න දෙයක් නැහැ. අනුමත නොකර කර දෙයක් නෙමෙනේ.ගෙවන්න වෙනවා කොහොම වුණත්. මොකද සැපයුම් නිලධාරි දමා තිබෙනවා මේ මුදලක්. සේවාව ලබා ගත්තානම් ගෙවන්න වෙනවා.

08:14 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා පද්ධතිය විවෘත කිරිම වෙනුවෙන් පවත්වන ලද පාපාන්දු තරඟාවලියේ පාපන්දු මිලදී ගැනිම වෙනුවෙන් රු.15600/=ක මුදලක් ගිත්මි ස්පෝට්ස් ගුඩ්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:15 අම්බලන්ගොඩ නගර සභා මාර්ග සංවර්ධනයට අවශ්‍ය තාර මිලදී ගැනිම සඳහා රු.669350/= ක මුදලක් බිටුමික්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:16 අම්බලන්ගොඩ නගර සභා බස්නැවතුම්පොළ වහළ ප්‍රතිසංස්කරණය කිරිම සඳහා ආමානෝ ෂීට් මිලදී ගැනිම වෙනුවෙන් රු..384120/=/=ක මුදලක් Maxda Hardware power Tools වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:17 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Inter Lock ගල් ලබා ගැනිම වෙනුවෙන් රු.21600/=ක මුදලක් කේ.ඩී.ඒ. වීරසිංහ සහ ( ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:18 අම්බලන්ගොඩ නගර සභා ආදාහනාගාර වලට අවශ්‍ය ගෑස් මිලදී ගැනීම.(2019.09.30) වෙනුවෙන් රු.48280/= ක මුදලක් එස්.එච්.එන්.ඒ.එස් ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:19 අම්බලන්ගොඩ නගර සභා ආදාහනාගාර වලට අවශ්‍ය ගෑස්.(2019.10.14) මිලදී ගැනීම වෙනුවෙන් රු.48280/= ක මුදලක් එස්.එච්.එන්.ඒ.එස් ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:20 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනිම වෙනුවෙන් රු.44530/= ක මුදලක් Chanaka Enterpries ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:21 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක උපාංග මිලදී ගැනිම වෙනුවෙන් රු.13700/= ක මුදලක් Tulip Computers ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:22 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි ඡායරූප යන්ත්‍රය මිලදී ගැනිම වෙනුවෙන් රු.569250/= ක මුදලක් metropolitan Office(Pvt) Ltd වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:23 ජාතික කියවීමේ මාසයට සමගාමීව පවත්වනු ලබන ජිනේන්ද්‍රවංශභිදානෝත්සව වැඩ සටහනෙහි විශේෂ ආරාධිත දේශණය පැවැත්විම වෙනුවෙන් රු.25000/= ක මුදලක් මහාචාර්ය සරත් විජේසුරිය මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

08:23 ට මාගේ විරෝධතාවයක් තිබෙනවා . මොකද අපි මේ රු.25000/= ක මුදලක් ගෙවනවා කතිකයෙකුට. දැන් ඊළඟ එකෙක් අනුර සී පෙරේරා මහතාට තිබෙනවා. මේ අය කොළඹ සිට එනවාද එංගලන්තයේ සිට එනවාද කියා මට සැකයක් තිබෙනවා. මේ රු.25000/= ක් කියන්නේ ජනතාවගේ බදු මුදල් මේ ගෙවන්නේ. නිදහස් අධ්‍යාපනය ලබලා විශ්ව විද්‍යාල වල අධ්‍යාපනය ලබලා කතාවක් පවත්වන්න රු.25000/=ක් අය කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිතුමා ඒ අයට අද නෙමේ . මිට වසර 20 කට 25කට උඩදි වුණත් රු.20000/= ක් ගෙවා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මා සභාවට නෙමේ චෝදනා කරන්නේ . මේ පුද්ගලයන්ට.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මේ පුද්ගලයන් ස්භාවයෙන්ම ගන්න ගණන. එකයි වෙලා තිබෙන්නේ. නොමිලේ පැමිණියා නම් හොඳයි.

__ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්__ලංකාවේ ඉඳලා පැමිණ නෙමේ. එංගලන්තයේ හරි ඇමෙරිකාවේ හරි ඉඳලා පැමිණ ඇවිත් තමයි මේ ගණන් අය කරන්නේ. මේ අආධාරණ මුදල් .මේවා මේ අසාධාරණ මුදල් මේ ගෙවීම්. මේ අහිංසක මිනිසුන්ගේ මුදල්.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මෙහි මහාචාර්ය සරත් විජේසුරිය මහතාට රු.25000/= ක මුදලක් ගෙවා තිබෙනවා.එතුමා සිංහල පිළිබඳ අංශයේ ප්‍රධාන කථිකාචාර්යවරයා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, නැහැ. මේ කියන කතාව හරි. දැන් අපිත් මේ සද්ධ නැතිව ඉන්නවා . දැන් මේකට විරුද්ධ වුණායි කියයි. දැන් මෙකේ කියලා තිබෙන්නේ ජිනේන්ද්‍රවංශ මහතාගේ මොකක් හරි ගුණ සමරුවක් හරි මොකක් හරි කියා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

නැහැ. මේ අපේ කියවීමේ මාසය වෙනුවෙන්.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

මෙය තව කෙනෙකුට ඉල්ලුවොත් එහෙම තව කෙනෙකුට ගුණ සමරුවක් කරන්න කියා. එතකොට අපි එක කරන්න වෙනවානේ. එක වෙනවානේ. දැන් කමිටුවක වුණත් තින්දු ගන්නකොට ප්‍රශ්නයක් නොවන විදියට තමයි තින්දු ගන්න ඕනේ. අපි කියන්නේ මේකයි. දැන් සරත් විජේසිරි මහතා ගැන අපිත් හොඳට දන්නවා. කලිනුත් පැමිණ තිබෙනවා. මෙතැන රු.50000/= ක් සම්පත් දායකත්වය දරන කථිකයන් දෙදෙනෙකුට ගෙවනවා. මා කියන්නේ මේ නගරයේ තිබෙන ප්‍රශ්න ගැටළු සමඟ මේවා සීමා කරලා යනවා නම් හොඳයි.ඉදිරියේදි මේවා අනුමතිය ගන්න විට මේ සියළු දේවල් බලන්න. මේවා කොමසාරිස්තුමාගේ අනුමැතිය ගෙනද කර තිබෙන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

නැහැ. කොමසාරිස්තුමාගේ අනුමැතිය අවශ්‍ය නැහැ. ගරු සභාවේ අනුමැතිය ගෙන තිබෙනවා.ඇස්තමේන්තු අනුමත කර තිබෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

මොකද සමහර දේවල් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු ආණ්ඩුකාරතුමාත් අනුමත කර තිබෙනවා. මේ වැය ඇස්තමේන්තු

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒක ගැටළුවක් නැහැ.අනුමත කරන එක හරි. එතුමලා දන්නේ නැහැ. නමුත් මේ නගරයට ඊට වඩා ගැටළු ප්‍රශ්න තිබෙන නිසා ඉදිරියේදි ගන්නා විට කල්පනාකාරිව ගන්න කියා පවසනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මහතාට ආරධනා කිරිම සම්බන්ධව අද නෙමේ. මීට කලින් සභා වාර්තාවලට ඇතුළත් කරලා ඔබතුමලාගේ අනුමැතියෙන් තමයි ගෙන තිබෙන්නේ. කියලා ගෙන තිබෙන්නේ. ඇත්තම කියනවා නම් සරත් විජේසිරි මහතාගේ හා මගේ දේශණයයි එකට ගලපන්න බැහැ.නමුත් අපි ගැලපීම නැති වුණත් අපි ගෙන්නුවා.

08:24 2019 ජාතික කියවීමේ මාසයට සමගාමීව පවත්වනු ලබන ජිනේන්ද්‍රවංශභිදානෝත්සව වැඩ සටහනෙහි විශේෂ ආරාධිත දේශණය පැවැත්වීම වෙනුවෙන් රු.25000/= ක මුදලක් විද්‍යා ප්‍රබන්ධ ලේඛක හා තාරකා විද්‍යාඥ අනුර සී පෙරේරා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:25 2019 ජාතික කියවීමේ මාසයේ පොදු කටයුතු වෙනුවෙන් රු.20000/= ක මුදලක් මුදලක් ඕ.ජේ.එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:26 2019 ජාතික කියවීමේ මාසයේ පොදු කටයුතු වෙනුවෙන් රු.20000/= ක මුදලක් මුදලක් ඕ.ජේ.එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:27 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහනේ හා ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ වැඩ සටහනෙහි ශුරතාවය දිනූ දේවානන්ද විද්‍යාලයිය කණ්ඩායම වෙනුවෙන් රු.25000/= ක මුදලක් ගා / ශ්‍රි දේවානන්ද විද්‍යාලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:28 2019 ජාතික කියවීමේ මාසයට සමගාමීව පවත්වනු ලබන ජිනේන්ද්‍රවංශභිදානෝත්සව වැඩ සටහනෙහි සම්පත් දායකයන් වෙනුවෙන් ප්‍රවාහන වියදම් වන රු.12000/= ක මුදලක් ඕ.ජේ.එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08:29 2019 ජාතික කියවීමේ මාසයේ සැරසිලි වෙනුවෙන් රු.10000/= ක මුදලක් ඕ. ජේ. එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:30 2019 ජාතික කියවීමේ මාසයේ සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.14900/= ක මුදලක් ඕ.ජේ.එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:31 2019 ජාතික කියවීමේ මාසයේ සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.20000/= ක මුදලක් ඕ.ජේ.එල් . විදානපතිරණ මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:32 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහනේ හා ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ වැඩ සටහනට අදාල වේදිකා නාට්‍ය නිර්මාණයේ හොඳම අධ්‍යක්ෂණයට හා පිටපතට හිමි ත්‍යාගය වෙනුවෙන් රු.10000/= ක මුදලක් දිනූ දේවානන්ද විද්‍යාලයේ උපගුරු ජී.එම් තනුජා මනෝහරි ද සිල්වා මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:33 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහනේ හා ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ වැඩ සටහනෙහි වේදිකා නාට්‍ය තරඟයේ අනු ශූරතාවය දිනූ ගා/ප්‍රජාපති විද්‍යාලයිය කණ්ඩායම වෙනුවෙන් රු.10000/= ක මුදලක් විදුහල්පති ගා/ප්‍රජාපති විද්‍යාලයියට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:34 252-0730 දරණ කැබ් රථයේ අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු.20750/=ක මුදලක් රත්න මොටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:35 අම්බලන්ගොඩ නගර සභා වාහන වල අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් 61560/= ක මුදලක් එස්.එම් . මෝටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:36 පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණයේ විදුලි ආලෝක ධාරාව විවෘත කිරිමේ උත්සවයේ සමරු ඵලකය සඳහා රු.24000/= ක මුදලක් සමාරා ප්ලාස්ටික් ග්‍රැපික් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:37 කරිත්ත කන්ද වසමේ පිරිස් වෙද මාවතේ හා පොල්වත්ත හරස් මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රැඳවුම් මුදල වන රු46090.70 ක මුදලක් කේ.ආර්.කේ එන්ට්‍රප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:38 තල්ගස්ගොඩ සුදුවැල්ල හරස් මාර්ගය කොන්ක්‍රිට් කිරිමේ රැඳවුම් මුදල වන රු.30692.20ක මුදලක් කේ . ආර්.කේ . එන්ට්‍රප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:39 අම්බලන්ගොඩ අයිඩියල් සිටි මාර්ගය තාර දැමීම සඳහා රැඳවුම් මුදල වන රු.89392/= ක මුදලක් කේ . ආර්.කේ . එන්ට්‍රප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම් ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:40 හල්වතුර කසළ අංගනයේ කසළ තුනිකිරිම සඳහා D4 යන්ත්‍රය ලයා ගැනිම වෙනුවෙන් රු.310530/= ක මුදලක් ( මිටර් පැය 94.1ක් සඳහා ) P.H.C. C ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:41 කළුවඩුමුල්ල මාර්ග සති පාර සංවර්ධනය කිරිම සඳහා A,B,C ගල් කියුබ් 05ක් යෙදිම වෙනුවෙන් රු.33750/= ක මුදලක් P.H.C.C ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:42 මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරීම 01 කර්මාන්තයේ වැඩ අවසන් කර ඇති කොටස වෙනුවෙන් අත්තිකාරම් වන රු.27130.95 ක මුදලක් ඕකන්ද ජ්‍යේෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:43 මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරීම 02 කර්මාන්තයේ වැඩ අවසන් කර ඇති කොටස වෙනුවෙන් අත්තිකාරම් වන රු.238565.97 ක මුදලක් ඕකන්ද ජ්‍යේෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:44 තල්ගස්ගොඩ නිව්යෝක් ගම්මානයේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.395613.08 ක මුදලක් තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:45 තල්ගස්ගොඩ පෙර පාසල සීවිලිම සකස් කිරීම වෙනුවෙන් රු.473785.21 ක මුදලක් තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:46 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් දරුවන්ගේ විනෝද චාරිකාව යාම වෙනුවෙන් 2019.11.01 දින අම්බලන්ගොඩ උඩවලව දක්වා යාම එම සඳහා බස්රථ 07ක් සැපයීම වෙනුවෙන් රු.157500/= ක මුදලක් ඒ.එම්.ඩී.එස්.පී. දිල්රුක්ෂි මහත්මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:47 2019 ඔක්තෝබර් මාසයේ ගමන් වියදම් වෙනුවෙන් රු.75000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ජාතික කියවීමේ මාසය වෙනුවෙන් අයවැයට වෙන්කර තිබෙනවාද?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහෙම වෙන්කර තිබෙන්නේ.

## 09. ගිණුම් :-

09.01 2019 සැප්තැම්බර් මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.

**තීරණය**

2019 සැප්තැම්බර් මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2019 සැප්තැම්බර් මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 10. ඇස්තමේන්තු :-

**10.01 පෝරඹ ප්‍රදේශයේ පොල්වත්ත පාරේන් පාරෙන් අතුරු පාරෙහි කාණු පද්ධතිය(එච් .කේ.එස්. අබේවර්ධන මහතාගේ නිවස අසළ ) ඉදිකිරීම සඳහා රු.430000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

පෝරඹ ප්‍රදේශයේ පොල්වත්ත පාරේන් පාරෙන් අතුරු පාරෙහි කාණු පද්ධතිය(එච් .කේ.එස්. අබේවර්ධන මහතාගේ නිවස අසළ ) ඉදිකිරීම සඳහා රු.430000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.02 කළුවඩමුල්ල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිම සඳහා රු.350000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

කළුවඩමුල්ල පොදු නාන ළිඳ අළුත්වැඩියා කිරිම සඳහා රු.350000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.03 පොල්වත්තපුර රැදවුම් බැම්ම ඉදිකිරිම ( පී.ජී.රණසිරි මහතාගේ නිවස අසළ ) සඳහා රු.2000000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරිම ( පී.ජී.රණසිරි මහතාගේ නිවස අසළ ) සඳහා රු.2000000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.04 මහජන ක්‍රීඩාංගණයේ ළිං 3හි කොන්ක්‍රිට් ආවරණ ඉදිකිරිම සඳහා රු.120000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ටෙන්ඩර් කරලා ලබා දිලා ද තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කරලා තිබෙන්නේ. මේ ළිං වල උඩ පියන්. ඒවා වැසිමට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේවා කලින් දැම්මේ නැත්තේ මොකෝ. මේවා අරෙහෙන් දමනවා. මෙහෙන් දමනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේක තේරුම් ගන්න. අපට ඇස්තමේන්තු හැදිමේදි ලබන වසරේ අන්තිම විතර තමයි මේ ඇස්තමේන්තු අනුමත වෙන්නේ. ඉතිං අපේ තාක්ෂණසේවා නිලධාරින්ට කරන්න පුළුවන් වෙන විදියට කොටස් කඩලා දමන්නේ. එටකයි වේලා තිබෙන්නේ.

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ ළිං 3හි කොන්ක්‍රිට් ආවරණ ඉදිකිරීම සඳහා රු.120000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.05 තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ සිට දළුක්කන්ද පාර දක්වා මිටර් 407 ක් තාර ඇති රු.1,100,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ සිට දළුක්කන්ද පාර දක්වා මිටර් 407 ක් තාර ඇති රු.1,100,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.06 තල්ගස්ගොඩ ක්‍රීඩාංගණයේ පස් කපා සංවර්ධනය කිරිම සඳහා රු.500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

තල්ගස්ගොඩ ක්‍රීඩාංගණයේ පස් කපා සංවර්ධනය කිරිම  සඳහා රු.500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.07 මහ අම්ලන්ගොඩ පාරෙන් ඇන්කරු ඒජන්සිය අසලින් අතුරු පාරේ කඩා ඇති කොටස සංවර්ධනය  රු80,000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහ අම්ලන්ගොඩ පාරෙන් ඇන්කරු ඒජන්සිය අසලින් අතුරු පාරේ කඩා ඇති කොටස සංවර්ධනය රු80,000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර  මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.08 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ පළමු අදියර රු.500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ පළමු අදියර රු.500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර  මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.09 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ දෙවන අදියර රු.490,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුවේ දකුණු බැම්මේ දෙවන අදියර රු.490,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර  මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.10 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම පළමු අදියර රු.450,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම පළමු අදියර රු.450,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ  මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.11 මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම දෙවන අදියර රු.240,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහජන ක්‍රීඩාංගණයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ පැති කාණුව වම් පැති බැම්ම දෙවන අදියර රු.240,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.12 මහජන ක්‍රීඩාංගණය අසල බෝධි ප්‍රාකාරය අදියර 01 රු.280,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ මහජන ක්‍රීඩාංගණයේ බෝධි ප්‍රකාරය පහළ බැම්ම ඉදිකිරිමට පමණයි. මෙය ඔක්කොම කරන්න ගියාම වැඩය කැත වෙනවා. එම නිසා මෙය අපි සිදු කරනවා. උඩ වැඩ ඉදිකිරිමට ලක්ෂ 5ක් පමණ වැයවෙනවා. තාප්පය ඉදිකර ලස්සනට හදා දමනවා.

තීරණය -

මහජන ක්‍රීඩාංගණය අසල බෝධි ප්‍රාකාරය අදියර 01 රු.280,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.13 නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ල කුළුණු යෙදිම දෙවන අදියර රු.300,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය -**

නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ල කුළුණු යෙදිම දෙවන අදියර රු.300,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.14 හල්වතුර කසළ අංගණය කාර්යාලිය ගොඩනැඟිල්ල ඉදිකිරිම සඳහා රු.950000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය -**

හල්වතුර කසළ අංගණය කාර්යාලිය ගොඩනැඟිල්ල ඉදිකිරිම සඳහා රු.950000/= ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද ඊට වඩා අඩු මුදලකට කන්ටේනර් එකක් ලබා ගැනීම සුදුසු බවටත් , එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මොකක්ද ඒ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අයට සිටිමට කාර්යාලයක් හදා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කවදා හරි දිනයක හල්වතුර ගොඩ කරලා අවසන් වුණාම ඔය කඩා ඉවත් කරනවා. මා ඔබතුමාට යෝජනා කරනවා අඩි 20 කන්ටේනර් එකක් ගන්න.අඩි 20 කන්ටේනර් එකක් ගත්තාම ඔබතුමාට නගර සභාවේ ඕන ඕන තැනකට ගෙනියන්න පුළුවන්. ඔබතුමාත් හොයන්න. මට ඇත්තටම බොරු කියන්න අවශ්‍ය නැහැ. මිට මාස 2කට කලින් විදේශ ආයෝජකයෙක් ගෙනවා. මා එතනින් බඩු වගයක් ගත්තා. මට ලක්ෂ 2කට දෙන්නම් කිවුවා කන්ටේනරයක්. මට ගෙනහින් තියන්න තැනක් නැති නිසා මා ගත්තේ නැහැ. මා අද හවසට දුරකථන ඇමතුමක් දී අසන්නම්. ලක්ෂ 2කට ගන්න බැහැ. ටෙන්ඩර්පත් කැඳවන්න. එය තිබුණොත් මා ඔබතුමාට ටෙන්ඩර් පත් ගෙනත් දෙන්නම්. තව තැනකිනුත් ගන්න. මා යෝජනා කරනවා එතැන නැතිනම් කන්ටේනරයක් ගන්න.කන්ටේනරය වැඩි දියුණු කරන්න. මොකද එය ඡාරා වෙන්නේ නැහැ. අනිත් එක හදපු ඒවා තිබෙනවා. අපිට ඒවා කාලයක් පාවිච්චි කරන්න පුළුවනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හදපු ඒවා තිබෙනවා. සැප වැඩියි. ලක්ෂ 17ක් පමණ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එච්චර වෙන්නේ නැහැ. අපරාදේ මුදල්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ කියන කතාව ඇත්ත. අපට කවදාහරි මේය අයින් කරන්න වෙනවා.එමනිසා අපි කන්ටේනරයක් තියමු එතැන. ඒක බලා ඇස්තමේන්තුවක් ලබා දෙන්න.

**10.15 විලේගොඩ සහ හල්වතුර අතර මාර්ගයේ ඇළ හරහා ඇති බෝක්කුව ඉදිකිරීම සඳහා රු.3,171,373.46 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය අපට ගාලු යවන්න වෙනවා. මොකද ලක්ෂ 20 පැන්නාම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම බෝක්කුවේ වාහනයක්වත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

දැන් අපි මෙය ගාලු යවනවා. මෙහි මැනුම්පත් ටික කෝ. මෙහි මැනුම්පත් ටික ගරු මන්ත්‍රිතුමාම අතේ ගෙනහින් අනුමත කරගෙන එනවා නම් හොඳයි. නැතිනම් වැඩය කරන්න වෙන්නේ නැහැ. අපි ලිපි මඟින් යැව්වාම ඉංජිනේරු මහතා මාස 6ක් විතර මෙය තියාගෙන ඉන්නවා. එතකොට මේ අඟයට කරන්නත් බැහැ.

**තීරණය -**

විලේගොඩ සහ හල්වතුර අතර මාර්ගයේ ඇළ හරහා ඇති බෝක්කුව ඉදිකිරීම සඳහා රු.3,171,373.46 ක ඇස්තමේන්තුව සුදුසු බවටත් , එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 10.16 පොල්වත්ත හන්දියෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීම රු.1,000,000/= ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

__ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, පොල්වත්ත හන්දියේ අතුරු මාර්ගයේ විරෝධතා වගයක් තිබෙනවා. ඒ එක් කෙනෙකු අපගේ නිවසටත් පැමිණියා. එතැන මාගේ විරෝධතාවයක් නැහැ. මා ලංකාවේ ඕනෑම තැනක පාරක් හදනවාට කැමතියි. අපේ මතය ඒක. මට පුද්ගලිකව නිවසට පැමිණ කිවුවා. ඒ ගැන ටිකක් සොයා බලන ලෙස ඉල්ලා සිටිනවා.බෙනට් සිල්වා මහතාගේ ඒ අයගේ පවුලෙන් කෙනෙක් විරෝධතාවයක් තිබෙනවා.පැහැදිලිවම කියනවා. මාගේ පුද්ගලික මතය නම් පාරවල් හදනවාට මා කිසි විරෝධතාවයක් නැහැ.එහෙම විරෝධතාවයක් ගෙන්න අවශ්‍ය නැහැ. මෙය පවරලා ද තිබෙන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මෙය පවරා තිබෙන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , මාත් මුදල් වෙන් කළාද දන්නේ නැහැ. අර බුද්ධ දත්ත විද්‍යාලය අසළ ඇති පොඩි පාර නේද?

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

**ඔව්.**

__ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

**මාත් මුදල් වෙන්කළා.**

තීරණය -

පොල්වත්ත හන්දියෙන් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම රු.1,000,000/= ඇස්තමේන්තුව සුදුසු බවටත් , එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.17 පෝරඹ වලව්වත්ත පාර කොන්ක්‍රීට් කර්බ් යෙදීම රු.17000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පෝරඹ වලව්වත්ත පාර කොන්ක්‍රීට් කර්බ් යෙදීම රු.17000/= ක ඇස්තමේන්තුව සුදුසු බවටත් , එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.18 සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රීට් කර්බ් යෙදීම රු.15000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ පොඩි ගණන් මොනවාද? රු. 15000/= රු.170000/= ගණන් වල

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඒ පාරෙන් මේ පැත්තේ නිවෙස් වලට වතුර පෙරෙන නිසා ඔය කොන්ක්‍රීට් ගැට්ට දැම්මට තමයි ඔය.

තීරණය -

සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රීට් කර්බ් යෙදීම රු.15000/= ක ඇස්තමේන්තුව සුදුසු බවටත් , එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.19 ගර්භනී මවක් දරු ප්‍රසූතිය සඳහා රෝහල් ගත වීමේදි රැගෙන යා යුතු භාණ්ඩ ලැයිස්තුව නොමිලේ**

**11.** වෙනත් කරුණු :-

- **පස්වරු 1.00 ට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා සභා ගර්භයෙන් නික්ම ගියහ.**
- **පස්වරු 1.00 ට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ගරු සභාවේ මූලාසනයට පැමිණියහ.**

12. **න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :-**

**12.01 ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා පොල්වත්ත ක්‍රීඩාංගණය 2019.10.30,31 සහ 2019.11.01 දිනවලදි වෙන්කර තිබුණද අයහපත් කාලගුණ තත්ත්වය හේතුව නිසා එම ක්‍රීඩාංගණයේ එය පැවත්විය නොහැකි බැවින් එම මුදල් නැවත ඉල්ලීමක් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා පොල්වත්ත ක්‍රීඩාංගණය 2019.10.30,31 සහ 2019.11.01 දිනවලදි වෙන්කර තිබුණද අයහපත් කාලගුණ තත්ත්වය හේතුව නිසා එම ක්‍රීඩාංගණයේ එය පැවත්විය නොහැකි බැවින් එම මුදල් නැවත ඉල්ලීමක් කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි අනුමැතිය දී තිබෙන්නේ කොහොමද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපි අනුමැතිය ලබා දි තිබෙන්නේ 25% ක මුදලකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අපි කුමන පක්ෂයක සිටියත් , කුමන දේශපාලන මතිමතාන්තර දැරුවත් අපි ක්‍රිඩා පිටියක් වෙන්කරනු ලබන්නේ යම්කිසි හේතුවක් නිසා. නමුත් ක්‍රිඩා පිටියේ තිබුණා. ලෝක ළමා දින උත්සවය.එතකොට ක්‍රීඩා පිටිය මැද ඔක්කොම සවුත්තු වුණා.ඊටපසු පස් ගෙනත් දමා තිබුණා. ඊට පසු 27,29,30 දින මා ගොස් ක්‍රිඩා පිටිය පරික්ෂා කළා.ක්‍රිඩා පිටියේ මැද කකුළ තිබ්බාම අඟල් 6ක් විතර කකුළ යනවා.සමහර තැන්වල .එතකොට පක්ෂ නායකයෝ ඒ අවස්ථාවේදි ඒ භූමිය භාවිතා කරන්න බැහැ එවැනි රැස්වීමකට. දැන් ඔබතුමලාගේ පක්ෂයේ හෝ වේවා අපේ පක්ෂයේ හෝ වේවා.ජනතා විමුක්ති පෙරමුණේ හෝ වේවා ප්‍රධාන පක්ෂයේ ප්‍රධාන පක්ෂ නායකයින් ගෙන්වා කරන ලබන රැස්වීමකට දහස් ගණනක් සෙනඟ එකතු වෙනවා.මෙන්න මේ දහස් ගණනක් එකතු වන ක්‍රිඩා පිටිය මහ වගුරක් බවට පත්වෙනවා.මේ මඩ ගොඩක් එක්ක දමනවානම් .එහෙම අවස්ථාවකදි අම්බලන්ගොඩ නගර සභාව වගකීමෙන් එම ක්‍රිඩා පිටිය හදලා දෙනවා ද ? ඒ ජනතාවට ඉන්න පුළුවන් ආකාරයට. එහෙම නැතිනම් එම ක්‍රිඩා පිටියට ගෙවන ලද මුදල් මා මේ මුදල් ගැනීමට නෙමේ කතා කරන්නේ . සාධාරනය වෙනුවෙන් . එම නිසා නීති තිබෙන්න පුළුවනි. නිති ඕන තරම් කැඩෙනවා. අපි මේක වෙනස් කරනවා. එතකොට මේ සමස්ත සෙනඟ අර මඩ ගොඩට දමන්න පුළුවන්ද? ක්‍රිඩා පිටිය හදලා දෙනවාද? මා ගරු සභාපතිතුමාට කතා කළා. මා එතුමාට කිවුවා මා මෙය ගෙනෙනවා කියා. ලිඛිතව ගෙනෙනවා. මා මෙය සභාවේ කතා කරනවා. මේක වැරදියි. මෙය බැරි වුණාම අපි වෙනත් විකල්ප ක්‍රිඩා පිටියට යනවා.විකල්ප ක්‍රිඩා පිටියට ගිහිල්ලා මා හිතන්නේ ප්‍රජාපතියේ ක්‍රිඩා පිටියටත් වැලි කියුබ් 6ක් ගෙනත් දැම්මා. හෙලිකොප්ටරය බැමට පොල්වත්ත ක්‍රිඩා පිටියට වැලි කියුබ් 1 ½ක් බැවා.එතකොට එහෙම බැහැලා තමයි පොල්වත්ත ක්‍රිඩා පිටිය හෙලිකොප්ටරය බැමට හදා ගත්තේ. එතකොට ගරු සභාපතිතුමා අපි

නීතිය කියන්න පුළුවනි. මෙවැනි දෙයකදි කුමන දේශපාලන පක්ෂයක් වුවත් මා කියන්නේ නැහැ සංගීත සංදර්ශන , මා කියන්නේ නැහැ මුදල් උපයන දේවල් මෙවැනි දෙයකදි ඕනෑම පක්ෂයකට මුදා හරින්න නගර සභාව තින්දුවක් ගත යුතුයි.මොකද 1000කට 2000කට 3000කට දෙන ලේහෙසි පහසු වැඩක් නෙමේ අපි මේ කරන්නේ.එහෙම දාන්න බැහැ. එහෙම නම් නගර සභාවට වගකීමක් තිබෙනවා.එය ඉල්ලා තිබෙනවා නම් එයට වැලි හරි දමා හරි ගස්සා දෙන්න. එම දෙකෙන් එකක් වෙන්න ඕන.නැතිව මඩගොඩට දමා හංසයාට, පොහොට්ටුවට, අලියාට, සීනුව ට වෙන්න පුළුවන් ඒ වැඩය වෙන්න බෑ. සම්පූර්ණ විරුද්ධයි. එහෙම කළාම නගර සභාවේ ඒ සේවයක් නැහැ.ගන්න මුදලට සේවයක් නැහැ. නගර සභාව ඉන්නේ මුදල් ටික මඩ ගොඩේ ඕන දෙයක් කරගන්න කියා බලන් ඉන්නද? මා මගේ අදහස මා ඉදිරිපත් කළේ. මෙය සම්පූර්ණ වැරදියි. කොයි දේශපාලන පක්ෂය වුණත් මේ පිළිබඳ අවධානය යොමු කරලා මෙය වෙනස් කරන්න කියා ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාත් දුටුවා මේ ක්‍රීඩාංගණය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහි කියක් අයකර තිබෙනවාද? කියක් කපා තිබෙනවාද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි 75% ක් රඳවා ගෙන 25% නිදහස් කරන්න කියා තිබෙන්නේ. නිදහස් කරන්න කියා තිබෙන්නේ. මුදල රු.10500/= කි. එයින් 75%ක් රඳවා ගෙන 25%ක් නිදහස් කරන්න කියා තමයි ආදායම් පරික්ෂක මහතා විසින් වාර්තා කර තිබෙන්නේ. මය දින 10ක් ඇතුළත දැනුම් දී නැති බව තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මෙය සභාවට පුළුවන් ගෙවනවාද නැද්ද කියන එක කියන්න.ඒ සම්බන්ධව කතා කරනවා නම් මෙම ක්‍රීඩාංගණය වර්ෂාව වැහලා මඩ සහිත තත්ත්වයක් තිබුණේ. එමනිසා මෙයට පක්ෂයක් කියා බලන්න හොඳ නැහැ. යම්කිසි තීරණයක් ගන්නවා නම් . මෙහි ඒ වන විට රැස්වීමක් පවත්වනවා තියා ක්‍රීඩාංගණයට බැසීමට බැරි තත්ත්වයක් තිබුණේ. එමනිසා තමුන්නාසේලා තීරණය කරන්න මෙය ගෙවනවාද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඇත්තටම මේකයි වෙලා තිබෙන්නේ.කියපු කතාව සාධාරණයි. ක්‍රීඩාංගණයේ මෙය තැබීමට නොහැකි තත්ත්වයකි තිබුණේ. එහි ක්‍රීඩා භූමි භාරකරුගේ නිර්දේශයක් දමා මෙය මේ වගේ තත්ත්වයක් තිබුණේ කියා එම නිර්දේශය ගෙන හරියට ලියන්න. එහෙම කියා එම නිදහස් කිරීම කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඇත්ත වශයෙන්ම අපේ විපක්ෂ නායකතුමාගේ කතාවට එකඟයි. එයට එක පැත්තකින් විපක්ෂ නායකතුමාට ස්තූති වන්ත විය යුතුයි. මෙහි ගෙනත් එබුවානම් එහෙම ක්‍රීඩාංගණය සවුත්තුවෙලා යනවා. එහෙම ප්‍රශ්නයකුත් වෙනවා.මා කියන්නේ ඔය වගේ අවස්ථාවකදි අපේ ප්‍රශ්නය විතරක් නෙමේ ව්‍යාපාරික කටයුත්තකට මුදල් බැද්ද කෙනෙකුට වුණත් ඔය වගේ අවස්ථාවකදි සහනයක් දෙන්න වෙනවා.මොකද අපේ වැරැද්ද නෙමේ. ස්භාවයෙන් වැස්ස නිසා ක්‍රීඩාංගණය සවුත්තු වෙලා එය දීමට නොහැකියි.එතකොට ඒ අයට මේවා කරගන්න බැරි නිසා යුතුකම එය හරියට ලබා දෙන එක.ස්භාව ධර්මය . නගර සභාවට කරන්න දෙයකුත් නැහැ. එක හින්දාම නගර සභාවේ ක්‍රීඩා භූමි

භාරකරුගෙන් නිර්දේශයක් ගෙන එය කරන්න පුළුවන් නම් මා කියන්නේ දේශපාලන පක්ෂ විතරක් නෙමේ ඕනෑම තත්වයකදි ඒ වගේ සහන ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අධික වර්ෂාව නිසා මෙම ක්‍රිඩාංගණය වැසි ජලයෙන් පිරි තිබුණ නිසා මෙම ක්‍රිඩාංගණයේ රැස්විමක් පැවැත්විමට නොහැකි නිසාත් සභාවට මෙය යථාතත්වය පත්කර දීමට නොහැකි වු නිසා සභාවේ අනුමැතියට යටත්ව මෙම මුදල නිදහස් කිරිමට කැමති බවට සභාව තින්දු කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මටනම් විරුද්ධ වෙන්න වෙනවා. නිලධාරින්ගේ නිර්දේශ වලට උඩින් යන්න බැහැ. නිලධාරින්ගේ නිර්දේශය වෙනස් කරලා ගන්න. ඒක ගැටළුවක් නැහැ. ඒ අයටත් මොළයක් තිබෙන්න ඕන. මේ මඩවලේ මේ තින්දු තීරණ ගන්න බැහැ කියා. අපි නෙමේනේ වැරදි කාරයෝ. සභාවට බලයක් නැහැ . එය වෙනස් කරන්න. මේ රු.1000/= කට රු.2000/= කට අපි නිකන් නරක නාමය ගා ගන්න ඕන නැහැනේ.නිලධාරින් මෙහි රැස්විම පැවැත්විමට බැරිවිම ඇත්ත. නමුත් අපි යෝජනා අයවැයට දමා තිබෙන්නේ මෙය මේ විදියට කපා ගන්න. මේ විදියට දමා තිබෙන්නේ . නමුත් නිර්දේශ කිරිමේදි මතුවුණ ගැටළුවක් මේක. මේ නිර්දේශ කර තිබුණේ . ඉතිං එය ලබා දී තිබුණා නම් අපට සභාවට පුළුවන් නිදහස් කර දෙන්න. එක දෙන්න.

**තීරණය-**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා පොල්වත්ත ක්‍රීඩාංගණය 2019.10.30,31 සහ 2019.11.01 දිනවලදි වෙන්කර තිබුණද අයහපත් කාලගුණ තත්ත්වය හේතුව නිසා එම ක්‍රීඩාංගණයේ එය පැවත්විය නොහැකි බැවින් එම මුදල් ගෙවීම ( රු.12075/=ක්) සුදුසු බවට ගරු සභාවේ මුලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.02 පටබැඳිමුල්ල / පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබඳ වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පටබැඳිමුල්ල / පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. මෙහි ලොකුවට කියා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඕක කියන්න ගියොත් ලබන මාසය වෙනකම් කියන්න පුළුවනි. 8වෙනි මාසය දෙවැනි දින ගෙනත් තිබෙනවා ගෑස්. ඔය වාර්තාවෙන් බලා කියන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙන්න කොළ ගණන. එහෙම කියා ගන්න බැහැ.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

8වෙනි මසේ 02 දින හා 07 වෙනි දින කොච්චර ප්‍රමාණයක් ගෙන තිබෙනවාද?

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

කෝ. පුෂ්පා මහත්මිය ( අභ්‍යාන්තර විගණන )ඉන්නවාද ? 8වෙනි මාසයේ 02 වෙනිදින ගෑස් ගෙනා තොරතුරු නැහැ ඒවායේ.මේවා මේ අද දිනයේ දි බැහැ. මේවා ගරු මන්ත්‍රිවරුන්ට දිය යුතුයිනේ. දැන් මාස දෙකක් තිස්සේ කියනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙකේ එතුමියගේ පොඩි වරදක් තිබෙනවා.මෙය චෙක් කිරිමේ වරදක් තිබෙනවා කලින් ඉඳලා. දැන් මේ අයගේ ගෑස් ගන්න ඒවගේ එතනත් තිබෙනවා පොතක්. ගෑස් කියක් ගියාද ?, කිලෝ කියක් ගියාද කියා සටහන් වෙනවා.මෙහි වරදක් තිබෙනවා. නැත්තේ නැහැ. මෙය දැන් කතා කරන්න බැහැ. මා එය පස්සේ පෙන්වා දෙන්නම්.මෙහි ගෙනෙන ගණනයි , නිකුත් කරන ගනනයි. පොඩ්ඩක් චෙක් කරලා යන්න.මෙහි ගැටළුව තිබෙන්නේ ඒ අයගේ අතේ නෙමේ. මෙය ගබඩාව තුළ තිබෙන අතපසු වීමකි. මොනවා හරි ගැටළුවක් තිබෙනවා. එමනිසා අපි කියන්නේ මින් ඉදිරියට ගෙන එනවිට . මෙහි ප්‍රශ්නය පැමිණියේ 08වෙනි මාසයේ දෙවැනි දින සිට පස්වෙනි දින වන විට එම 8 අවසන් වූ පසු තමයි නැවත ඇණවුමක් දෙන්නේ.ඉවර නම් නෙමේ ඉවර වේගෙන එනවිට. ඕන නම් එක සිලින්ඩරයක් ඉතිරි වෙන්න පුළුවනි.එතකොට ඕගොල්ලන් මේ දින 5ට ගෑස් සිලින්ඩර් 07ක් කොහේට හරි ගිහින් අවසන් වෙලා පොත්වල ලියවිලා තිබෙනවා.එක වෙනම කතාන්දරයක්. වැරදි නම් නිවැරදි කරන්න. එහෙම වෙලා නැනේ ඔතන.දැන් මෙතැන එකක් තිබෙනවා.පටබැඳිමුල්ලට කියක් දිලා තිබෙනවාද? පොල්වත්තට කියක් දි තිබෙනවාද? 08 වෙනි දින එකෙක් තමයි ගෑස් සිලින්ඩර් 02ක් මෙතැන තිබෙන්නේ.ඔබතුමිය ඇඟට බේරෙන විදියට කතා කරලා වැඩක් නැහැ.ඔයාගේ ගැටළුවක් නැහැ. අපි ඔයාගෙන්නේ උත්තරය අසන්නේ. ඔයා එයට හරියට පිළිතුරු දිය යුතුයි.හරියට විස්තර ටික දිය යුතුයි. මේ වාර්තාව සකසා තිබ්බාට එහි නිවැරදිතාවය අසන්නේ පසුවයි. දැන් ඔබතුමිය හදන ලද වාර්තාවනේ. උත්තර දෙන්න එම වාර්තාව අනුව. ගරු සභාපතිතුමනි මෙය ලබන මාසයට ඉදිරිපත් කරන්න.

**තීරණය-**

පටබැඳිමුල්ල / පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබඳ වාර්තාව ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවේ මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.03 අම්බලන්ගොඩ,තල්ගස්ගොඩ,ගොඩහේන පාර අංක 4/15 හි කේ.එම්.එන්. ප්‍රියන්ති මහත්මිය විසින් අනුබෙදුම් අයදුම්පත් අංක SD/2019/121 යටතේ 1% ගාස්තු නිදහස් කිරිම සම්බන්ධයෙන් කරන ලද ගොනුව සභාගත කරන ලදී**

**තීරණය-**

අම්බලන්ගොඩ,තල්ගස්ගොඩ,ගොඩහේන පාර අංක 4/15 හි කේ.එම්.එන්. ප්‍රියන්ති මහත්මිය විසින් අනුබෙදුම් අයදුම්පත් අංක SD/2019/121 යටතේ 1% ගාස්තු නිදහස් කිරිම සම්බන්ධයෙන් කරන ලද ගොනුව ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාවේ මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 අම්බලන්ගොඩ නගර සභාව සතු මාර්ග වල පලුදු වැසීමේ කාර්යය සඳහා අප සේවකයින් විසින් නිපදවනු ලබන Pre Mix භාවිතයෙන් සිදු කිරිම සාර්ථකනොවන බව පෙනි ඇති නිසා යාන්ත්‍රිකව නිපදවනු ලබන ආයතනයකින් මීලදී ගෙන මාර්ග වල Pot holes ටොන් 10ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව සතු මාර්ග වල පලුදු වැසීමේ කාර්යය සඳහා අප සේවකයින් විසින් නිපදවනු ලබන Pre Mix භාවිතයෙන් සිදු කිරිම සාර්ථකනොවන බව පෙනි ඇති නිසා යාන්ත්‍රිකව නිපදවනු ලබන ආයතනයකින් මීලදී ගෙන මාර්ග වල Pot holes ටොන් 10ක ප්‍රමාණයක් ලබා ගැනීම සුදුසු බවට සභාවේ මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05** අම්බලන්ගොඩ , කන්දෙගොඩ, දෙවට පාර , අංක 24 පදිංචි , එල්.රෝෂාන් සමීර ද සිල්වා මහතා විසින් කන්දෙගොඩ මහචෛතිය පිරිවෙණේ පැවැත්වෙන ලේ දන් දීමේ පිංකම පිළිබඳ දැනුවත් කිරිමේ දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ න බස්නැවතුම්පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථගාල අසළ (අඩි 5*3 ප්‍රමාණයේ) නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ , කන්දෙගොඩ, දෙවට පාර , අංක 24 පදිංචි , එල්.රෝෂාන් සමීර ද සිල්වා මහතා විසින් කන්දෙගොඩ මහචෛතිය පිරිවෙණේ පැවැත්වෙන ලේ දන් දීමේ පිංකම පිළිබඳ දැනුවත් කිරිමේ දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ න බස්නැවතුම්පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථගාල අසළ (අඩි 5*3 ප්‍රමාණයේ) නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා ඉල්ලා සිටිනවා. ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ , කන්දෙගොඩ, දෙවට පාර , අංක 24 පදිංචි , එල්.රෝෂාන් සමීර ද සිල්වා මහතා විසින් කන්දෙගොඩ මහචෛතිය පිරිවෙණේ පැවැත්වෙන ලේ දන් දීමේ පිංකම පිළිබඳ දැනුවත් කිරිමේ දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ න බස්නැවතුම්පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථගාල අසළ (අඩි 5*3 ප්‍රමාණයේ) නොමිලේ ප්‍රදර්ශනය කිරිම සහා අවසර ලබා දීම සුදුසු බවට ගරු සභාවේ මුලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

12.06 ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා විසින් ජාතික ජන බලවේගයට ආධාර පිණිස ජන නියමු කලාකරුවන් විසින් පවත්වන්නට යොදෙන උත්සවයේ මහා රැස්වීම සඳහා 2019/11/08 වන දිනට කොඩි කණු 50ක් සහ පුටු 250ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

ජාතික ජන බලවේගයට ආධාර පිණිස ජන නියමු කලාකරුවන් විසින් පවත්වන්නට යොදෙන උත්සවයේ මහා රැස්වීම සඳහා 2019/11/08 වන දිනට කොඩි කණු 50ක් සහ පුටු 250ක් නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාවේ මුලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## වෙනත් කරුණු

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මේ ගරු සභාවේ ඔබතුමාගේ යෝජනාවෙන් මගේ ස්ථිරත්වයෙන් මේ අම්බලන්ගොඩ තනායම පිළිබඳ මුහුණ දි තිබෙන ගැටළුව පිළිබඳ අපි තින්දුවක් ගනු ලැබුවා.එම තින්දුව තමයි 2018.07.වෙනි මන සභා තීරණ අංක 12.08 යටතේ තීරණය තනායම සභාවේ ගරු මන්ත්‍රිවරුන්ගේ එකඟතාවය මත ලබා දී ඇති කාලයට අමතරව තවදුරටත් මාස 4ක කාලයක් ලබා දිමට එකඟ වු අතර 2019 ජුලි මස 30වෙනි දිනට ප්‍රථම එහි පළමු අදියරේ ඉදිකිරිම් ආරම්භ කළ යුතු බවත් එසේ නොමැති නම් එම ගිවිසුම අහෝසි කිරිමට සුදුසු බවට ලිඛිතව දන්වා යැවිය යුතු අතරත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කළ අතර ස්ථිර කරන ලදුව මෙම සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.දෙවැනි කරුණ තීරණය - තනායම භුමියේ ඉදිකරනු ලබන නව ගොඩනැගිල්ලේ ඉදිකිරිම් කටයුතු මාස 8ක කාලයක් තුළ ආරම්භ කළ යුතු බවත් ,2020 ජුනි මස වන විට එහි පලමු අදියරේ ඉදිකිරිම් කටයුතු අවසන් කළ යුතු බවත් ඉන්පසුව කිසිම හේතුවක් මත කාලය දිර්ඝ කිරිමක් සිදු නොකළ යුතු බවටත් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කිරිමෙන් ලදුව ඒකමතිකව සම්මත විය. 2020 ජුනි මස ප්‍රථම පලමු අදියරේ වැඩ කටයුතු අවසන් කළ යුතුයි.එතකොට කාමර

30කුත් මෙහි මේ ගරු සභාවේ මන්ත්‍රිවරු යම්කිසි තින්දුවක් ගන්නවා. එම තින්දුව ඒකමතිකව යෝජනා වෙනවා. සම්මත වෙනවා.මේ අම්බලන්ගොඩ තනායම පිළිබඳ ගැටළුව කිසිදු පක්ෂ භේදයකින් තොරව මේ සභාවේ සිටින ගරු සභාපතිතුමා ඇතුළු සියළු ගරුමන්ත්‍රිවරුන්ට ඔය තනායම් භූමිය පසු කරන්න කරන්න අම්බලන්ගොඩ සිටි පරණ මිනිස්සු මළගෙදරකට මොකක් හරි දෙයකට නගරයට ආපු වේලාවට අසනවා තාමත් තනායම එහෙමද? අම්බලන්ගොඩ නගරයට එන අපේ පරණ වැසියෝ ඒ අය පොඩි කාලයේ නාලා තිබෙනවා. ඒ අය කැමතියි මේ ස්වාභාවික නාන තටාකයේ පොඩි දරුවන් ගෙන ගොස් නෑමට. නමුත් මේ සියළු දේවල් අම්බලන්ගොඩ නගරයේ ජනතාවට අහිමි කර තිබෙන්නේ.එමනිසා අපි දැන් වසර 7ක් ඉවසුවා අම්බලන්ගොඩ ඇස්කෝට් ලංකා කියන සමිතියට දිලා.දැන් ඔය මහත්වරු වයිකෝට් දමාගෙන පැමිණියත් මා මේ පොත බලන විට මට කියන්නත් කනගාටුයි. පලවෙනි දින පැමිණ හොඳ සුද්ද සිංහලේන් බැණුම් ඇසුවා ජයන්ත ප්‍රදිප් මහතා. මේ ලංකා රියලිටි පෞද්ගලික සමාගම.මෙවැනි මේ පිළිතුරක් දිය නොහැකි පුද්ගලයෙක් මෙහි අධ්‍යක්ෂකවරයෙක් ලෙස දමා තිබෙන්නේ.උත්තරයක් දිය නොහැකි පුද්ගලයෙක්. මේ වගේ පොත් ඕන තරම් හැදිය හැකියි.මුදල් ඕන තරම් තිබෙනවා. මේ වැඩසටහන් කරන පුද්ගලයන් ළඟ කොළඹ ඕනතරම් තිබෙනවා.අපිට අවශ්‍ය වන්නේ ජායාරූප දෙකයි අවශ්‍ය විස්තර ටිකයි විතරයි.පොත හදලා ගන්න පුළුවන් පැයෙන්. එම නිසා මේවා දිලා අපි රවට්ටන්න බැහැ.එමනිසා ගරු සභාවේ මන්ත්‍රිවරුන්ගෙන් මා ඉල්ලා සිටිනවා.මේ අම්බලන්ගොඩ නගරයේ ජන්ම ලැබූ අපි කිසි කෙනෙක් දායකත්වය දෙන්න එපා. පව වුණා යම් කාලයකදි. දැන් එම පවට කර ගහන්න එපා. කර ගැහුවොත් ආත්මයක් ආත්මයක් පාසා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් මේ පව ගෙවන්න වෙයි. මා යෝජනා කරනවා ගෝඨාභය මහතා හෝ වේවා සජිත් ප්‍රේමාදස මහතා හෝ වේවා, අනුර කුමාර දිසානායක මහතා හෝ වේවා මේ රටේ ජනාධිපති වන කුමන හෝ පුද්ගලයා මැදිහත්වෙලා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් මේ තනායම ඉදිකිරිම සඳහා පියවර ගත යුතුයි.මේක අපි නගර සභා පාලනය යටතේ තබාගත යුතුයි. නගර සභාවට මෙය පාලනය කරන්න බැරි නම් රජයේ එය නාගරික සංවර්ධන අධිකාරිය හරහා පාලනය කරලා එකෙන් ආදායමෙන් කොටසක් නගර සභාවට ගත යුතුයි. මා කියනවා එහෙම කළත් අපි ලබා ගන්නා ලද දෙලක්ෂ ගණනට වඩා වැඩි මුදලක් ලබා ගැනීමට හැකියි. අපේ නගරයේ ඉගෙන ගත් විදේශිය සංචාරකයන්ට මෙයට යම් රැකිරක්ෂා සඳහා පමණක් නෙමේ බාහිර දේවල් කරලා තරුණ කොටස් තමන් රැකියාවක් විදියට ජිවත් වන්නේ මේ නගරය තුළ. මේ අපි ගත් තින්දුව කුමන හේතුවක් නිසා වත් වෙනස් කරන්න එපා. අපි තින්දුවක් ගෙන 2020 ජුනි මස 30 අවසාන දිනය. ගරු සභාපතිතුමා එදාට මේ අයට පුළුවන් නම් පලවෙනි පියවර අවසන් කරන්න . අපි කල් දි තිබෙනවා. දැන් මේ සමාගම් වල නම් වෙනස් කරලා මේ පොත් දිලා අම්බලන්ගොඩ ධර්මාශෝකයේ , දේවානන්ද විද්‍යාලයේ ඉගෙන ගත් අම්බලන්ගොඩ පරපුර අවමාන කරන්න මේ රැලට බැහැ කියන එකත් මා කියනවා. මා හිතනවා මේ කිසි මන්ත්‍රිවරයෙක් විරුද්ධ වෙන්නේ නැහැ.මේ තින්දුව අනුව ජුනි මාසය වෙනවිට අවසන් කරනවා නම් එසේ නොමැති නම් මෙය කරුණා කරලා නගර සභාවට අයිති කර ගන්න.ඔය භූමිය දිලා දෙලක්ෂ ගාණක් අයකර ගන්න මේ අම්බලන්ගොඩ ජනතාව ඕච්චරටම තුප්පැහි කාලකණ්ණි හිගන්නෝ නෙමෙයි කියා මා කියනවා. අම්බලන්ගොඩ ඉන්නවා හොඳ පරපුරක්. ඒ මිනිස්සුන්ගේ ගෞරුත්වය තබන්න. මෙවගේ හොරුන්ට , වංචාකරුවන්ට මෙය අයිති වෙන්න ඉඩ දෙන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා මේ කියන කරුණ මීට ඉහත කිහිප වතාවකදි සාකච්ඡා කරනවා. දැන් මෙයට කලින් සාකච්ඡා කළ පරිදි මෙතුමා කියන එකේ පරස් පරතාවයක් තිබෙනවා. දැන් මෙය සභාවේ තින්දු වෙන්න ඕන. එමනිසා මෙය අද තින්දු කරලා තිරණය කළානම් හොඳයි. මොකද මේක තවත් ඇදි ඇදි යනවා. ගරු මන්ත්‍රිවරුන්ගේ කැමැත්ත ගන්න. මේ සම්බන්ධව එක එක මත පැමිණෙනවා.නිත්‍යානුකූල ක්‍රමවේදයකුත් තිබෙන්න ඕන. අපි කරන වැඩය නිත්‍යානුකූල විය යුතුයි.එතකොට මෙය අපේ වෙනමම නිතිඥ මහතෙකු ලවා හරි උපදෙස් ලබා ගත යුතුයි. එමනිසා මා යෝජනා කරනවා මේ සම්බන්ධව දන්න නිතිඥ මහතෙකුගෙන් උපදෙස් ගෙන ඉතිරි වැඩ ටිකකට යන්න ඕන. මොකද එය නිතිඥ ශ්‍රීමාල් මහතා එවන ලද එක පිළිගන්න බැහැ. එතුමා නැතිව වෙනමම තින්දුවට ගිහිල්ලා උපදෙස් ගෙන කටයුතු කරන්න. මෙය හැදෙන්න ඕන කියන මතය තමයි අපිත් කියන්නේ. දැන් මෙහි විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. මේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම ලොකු ගැටළුවකට මුහුණ පාලා තිබෙන්නේ.එමනිසා ගිවිසුමේ කොන්දෙසි සමඟ මෙය ටිකක් ගැටළු සහගත තත්ත්වයක් තිබෙන නිසා නිසි ආකාරයෙන් නිත්‍යානුකූලව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා ගෙන එනු ලැබූ යෝජනාව මා අනුමත කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මමත් අනුමත කරන්න තමයි හිටියේ එම යෝජනාව. එතැන ගැටළුව වී තිබෙන්නේ. මා මුලින්ම ඇහුවේ මේ ගිවිසුම දෙපාර්ශවය විසින්ම දෙපාරක් මේ ගිවිසුම කඩ කර තිබෙනවා. එතකොට මෙවැනි ගිවිසුමක් තබාගෙන අපිට ඉදිරියට යන්න පුළුවන්ද කියා මා ඇසුවා. එහෙම ගැටළුකුත් තිබුණා. එම නිතිඥ මහත්මිය මට පැහැදිලි පිළිතුරක් දුන්නේ නැහැ. එම නිතිඥතුමියගෙන් මා දෙපාරක් තුන්පාරක් ඇසුවා. එම ගිවිසුම කඩ කර තිබෙනවා නේද කියා. එතකොට මෙය මේ වන විට වලංගුයිද කියා. එතුමිය එයට පිළිතුරු දුන්නේත් නැහැ පැහැදිලි පිළිතුරක් .මට හිතෙන්නේ අපේ නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කිවු දෙය සියයට සියයක්ම සාධාරණයි. විය යුත්තෙත් එයමයි.අපට තිබෙන ගැටළුව නිතිය ඉදිරියේ අපට තිබෙන කොහේ හරි වරදකරුවන් වේද? යන ප්‍රශ්නය තමයි මට තිබෙන්නේ.එමනිසා අපට හොඳයි කියන හිතෙන සාධාරණ නිතිඥ උපදෙස් ගෙන මේ තත්ත්වයට යා යුතුයි.ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගේ යෝජනාවට යා යුතු බවයි මා කියන්නේ.අපේ ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ ආකරයට ඉතා අඩු මුදලකට ලබා දී තිබෙන්නේ. එමනිසා විශේෂයෙන්ම මෙම ගිවිසුම ගැන බලා නිතිඥ උපදෙස් ලබා ගෙන පුළුවන් තරම් ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කිවු පරිදි මෙය කඩාගෙන යන්න පුළුන්ද කියා. මටනම් තෙරෙන හැටියට මේ ගිවිසුම කඩ වී තිබෙනවා.එමනිසා කොහොමටත් ඒ අය සමඟ ඉදිරියට යන්න පුළුවන්ද කියන එක තිබෙනවා. එය ඇසුවාට එම නිතිඥතුමිය පිළිතුරු දුන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහි දැමිය යුතුයි එක් නිතිඥයෙක් නෙමෙයි. මොකද මෙය අපේ නගරය සතු වටිනාම දේපල.මෙය කිහිපදෙනෙකුගේ කණ්ඩායමක්. එතකොට තනි පුද්ගලයෙකුගේ අදහස් නෙමේ එන්නේ. එතකොට තනි පුද්ගලයෙකුගේ නෙමේ එක් කෙනෙකුගේ දෙන්නෙකුගේ වෙත යොමු කළ යුතුයි. හැබැයි එහෙම යොමු කරන විට සියළු ලේඛණ ලබා දිය යුතුයි. මොකද වහන්න බැහැ එකක්වත්.එතකොට එම ලිපිලේඛණ දෙන ඒවා අපි ගරු මන්ත්‍රිවරුන්ට දෙන්න ඕන මෙන්න ගොණුව. මෙන්න ඇමිණුම. ගහපු පලවෙනි එකේ ඉඳලා ගහපු ලිපි ඔක්කොම, සභා වාර්තා ඔක්කොම තිබෙන්න ඕන. එම ලිපිලේඛණ සියල්ල තමයි එම නිතිඥ මඩුල්ල අධ්‍යනය කරන්නේ.එකක්වත් අඩුවෙන්න බැහැ. මොකද මේය එහෙම අධ්‍යනය කර බැලුවාට පසු මෙහි ඉතා පැහැදිලිව පෙනෙනවා 16 (අ), (ආ), (ඇ) ඔක්කොම කඩලා තිබෙන්නේ. ආයි කඩන්න කිසි දෙයක් නැහැ.මටත් කඩ පාඩම් මෙය කියවලා.අද ඔබතුමා තින්දු ගන්න. මෙහිදි විමසන්න.නිතිඥ මඩුල්ලකට දමා සියළු කරුණු සමඟ අපි කට්ටිය එකට වාඩිවෙලා තින්දුවකට පැමිණිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

තව එකක් මෙහි තිබෙනවා. මේ නිතිඥ මහතුන්ට වඩා නිත්‍යානුකුලභාවය ගන්න ඕන සමාගම් රෙජිස්ට්‍රාර්.මානේ කතා කරන්නේ. මාගේ අදහස මා ඉදිරිපත් කරන්නේ. මට තෙරෙන දේ . මට විරුද්ධවනේ ඔගොල්ලන් කතා කරන්නේ.ඔගොල්ලන් හිතන්නේ මා විරුද්ධයි කියා. එහෙම එකක් මට නැහැ. මා මේ පෙන්වන්නේ ගරු මන්ත්‍රිවරුන්ට අතින් ගෙවන්න වෙන එකයි. එක නොවෙන්නයි මා මේ කරන්නේ. මමත් අත ඔසවනවා ඔය අය සමඟ. හැබැයි මගේ සිමාවක් මට තිබෙනවා.මට අදාල නැහැ සමාගමක්. මා මේ පෙන්වන්නේ මට තිබෙන දැනුම අනුව. මා මෙය මගින් මගටම කියන්නේ මෙහි දෙපැත්තෙම කාරණාව තිබෙනවා. මේ සමාගම් ආඥා පණත අනුව මෙය නිත්‍යානුකුල ගිවිසුමක්.මේ සමාගම හරි. හැබැයි අපේ ගිවිසුමට අනුව මේ අය නියමිත කාලයට මෙය පටන් ගෙන නැහැ. එක කඩලා තිබෙන්නේ.දැන් එම ජනතාව කියනවා මේ සමාගමේ බලයට ඇවිත් කාලයයි වෙන්නේ නගර සභාවේ. එහෙම නම් අපි ඇයි මාස 8ක් තිබියදි කල් දුන්නේ මේ ගිවිසුම . දැනුත් අප පුළුවන්නේ. කොහේවත් යන්නේ මොකටද? ඉවත් වෙන්නේ මොකටද? මේ ගිවිසුමේ තිබෙනවා සමාගම් රෙජිස්ට්‍රාර් ළඟට යන්න කියා. මෙම ගිවිසුම අවංගු කරන්න කියා. කොහේවත් නිතිඥවරු ගාවට යන්න ඕනේ නැහැනේ. අපට මුදල් ගෙවන්න පුළුවන් නම් අර සමාගම් රෙජිස්ට්‍රාර් කියන මුදල් ගෙවන්න පුළුවන්නම් අපි ගිවිසුම අරගෙන එතැනට තමයි යා යුත්තේ. මේ නිතිමය පැත්තක් ඒක. කාගෙන්වත් අහන්න ඕන නැහැනේ ඒක. කාටවත් අපහාස කරන්න ඕන නැහැ.මර ලතෝනි දෙන්න ඕන නැහැ. මේක වසර 7ක් වසා තිබුණා . මැස්සෙක්වත් බැලුවේ නැහැ. කවුරුත් බැලුවේ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තිබුණේ. අවුරුදු 7ක් . නගර සභාවට සතයක්වත් හම්බ වුණේ නැහැ. මේ කවුරුහරි හිඟන්නෝ හරි අරගෙන ලක්ෂ එකසිය තිහක් නගර සභාවට ගෙවා තිබෙනවා. එය ප්‍රසිද්ධියේ පොලිය සමඟ ගෙවන්න පුළුවනි. ගෙවන්න පුළුවන් නම් ඒක තමයි ගිවිසුමකින් අයින් වෙනවා කියන්නේ. මේකයි බරපතලකම. මේක කියන්න කියන්න මා නිකං වැරදි කාරයෙක් විදියට හංවඩු ගසන්නේ.නැහැ මා තරහා ගන්නේ නැහැ. මෙය නිත්‍යානුකුලව පිළිතුර ආපු වේලාවට තේරුම් ගනිවි. දැන්නේ මා වැරදි කාරයා වෙන්නේ. මෙහි නිත්‍යානුකුල වෙන්නේ මා මේ

කතා කරන දේ වචනයක් හරි වැරදි නම් මේ සභාවේ මා ගරු මන්ත්‍රීකමින් ඉල්ලා අස්වෙනවා.මා මේ කියන එක වැරදි නම්.මා මේ වගකීමෙන් කියන්නේ.මා දන්න නිසා කියන්නේ. නිතිඥ මහත්වරු දමා මේ ඔක්කොම ගන්නකෝ. බලමු මොකද වෙන්නේ කියා.මා එකයි මේ කියන්නේ.සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ මේ හොල්ඩින් කියන තනි අකුරේ වරද තමයි මේ තිබෙන්නේ. මේ ගිවිසුම ගැහිමේදි හොල්ඩින් කියන එක හොල්ඩින්ස් කියන වචනේ වරද ඒ සිංහල තේරුම ව්‍යාපාර සමුහයක් එක සමාගමක්.එහි තිබෙන්නේ ඇස්කෝට් හොල්ඩින් අම්බලන්ගොඩ සමාගමක්. හැබැයි මෙය අයිති අපි මේ ගිවිසුම ගහපු මව් සමාගමට. එම මව් සමාගමත් එක්කයි මේ ගිවිසුම තිබෙන්නේ. මෙකයි ප්‍රශ්නය. මේක මේ මා දැනගන්න ඕන කාරණාවක් මේ මන්ත්‍රිවරු ඔක්කොම දැනගන්න ඕන කියා වාද කරනවා එහෙම නෙමේ. මා මෙය ඉදිරිපත් කරනවා මා දන්නා දේ. මේ සභාව . සභාවත් බේර ගන්න ඕන.බලමු මේ යෝජනා ඔක්කොම සම්මත කරලා තවත් කල් ඇරලා තවත් අපි කරන්නේ ගිවිසුම කඩ කරන එක. ඒ මිනිසුන් ඉල්ලනවා. මෙය හදන්න අවසර දෙන්න කියා. අපි තවත් කල් ගන්නවා. එහෙමනම් අවසර දීලා මෙකට යන්න. අපේ පැත්තෙන් අපි නිත්‍යානුකුල වෙන්න ඕන. මා දන්නේ නැහැ. මට උවමනා නැහැ අවසර දෙන්න. අපි නිත්‍යානුකුල වෙන්න ඕන. නිතිවිරෝධි වෙලා කොහොමද මේක කරන්නේ. එක කොහොමද කරන්නේ. අපිත් නිතිය කඩනවානේ.මා දන්නේ නැහැ මේ සභාවේ අනිත් මන්ත්‍රිවරුන්ට තෙරෙන්නේ එහෙම නෙමේද කියා. එහෙම නම් මට විතරක් මෙය අමුතුවෙන් තෙරෙනවා ඇති.මාගේ ස්ථාවරය විතරක් මා ඉදිරිපත් කරනවා සභාවට. මේ වැඩි කැමැත් මේ ගරු මන්ත්‍රිවරු 20ක් ඉන්නවා. මා තනි මන්ත්‍රිවරයා. ඒ මන්ත්‍රිවරු 20ට ඕන විදියට කටයුතු කරන්න. මාගේ අදහස මා ඉදිරිපත් කළා සභාවට.එක විවේචනය කරන්න එපා.ඔබතුමලා දන්න අදහස ඉදිරිපත් කරන්න ගරු සභාවට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ අපේ ගරු නගර සභා මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටියා ඇස්කොට් අම්බලන්ගොඩ (ප්‍රයිවට්) ලිමිටඩ් කියන සමාගම. මේ තිබෙන්නේ බදු ගිවිසුම. කොළය වහන්න බැහැ. අපිත් සමාගම් දන්නවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ඔය කොළේ වහනවා කියන්නේ මමද ?මට මෙතැන තිබෙන උවමනාව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මා දන්න දේ මට කියන්න එපා.මා කොළය වහන්න නෙමේ කියන්නේ. මා ගිවිසුමත් සමඟ කතා කරන්නේ. මා ඔබත් සමඟ අමනාපයෙන් නෙමේ කතා කරන්නේ. මා ගිවිසුමත් සමඟ කතා කරන්නේ.මමත් සමාගම් ගැන දන්නවා. මා සම්ගම් අයිතිකාරයෙක්. මාත් සමාගම් අධ්‍යක්ෂකවරයෙක්. දැන් ඔබතුමා කිවුවා එස්කෝට් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් යටතේ තිබෙන මවු සමාගම කියන නම ලංකා රියලිටි

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එක එක සමාගමක්.

## ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

එක සමාගම හෝ වේවා ලංකාවේ සිංහල භාෂාවෙන් හෝ ඉංග්‍රිසි භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් ගිවිසුම් අත්සන් කරන්නේ.එහි දැන් ඔබට හොඳට පැහැදිලියි සිංහල . දෙමළ , ඉංග්‍රිසි භාෂා දෙකෙන්ම තිබෙනවා. අපි ගිවිසුම් ඕන තරම් අත්සන් කරනවා. ලංකාවේ මේ අපේ මවු රටේ බදු ගිවිසුමක් අත්සන් කරන්නේ නම් විදේශිකයොත් සමඟ අපි ඉංග්‍රිසියෙන් අත්සන් කරනවා. සිංහලෙන් ලියන ගිවිසුම ඉංග්‍රිසි වචන භාවිතා කරන්න පුළුවනි. ඒ මොකද වචන වල තිබෙන අර්ථය වෙනස් වන නිසා. හොඳට මතක තියා ගන්නවා.එහෙම නම් ඔබතුමා කිවුවා මේ මවු සමාගම මෙකේ තිබෙනවා කියා. මා කියනවා. සම්පූර්ණ වැරදි මවු සමාගම හෝ වේවා කුමන සමාගමක් හෝ වේවා යාබද්ද සමාගමක් හෝ වේවා ඒ සමාගම් මේ සමාගමත් සමඟ අනුබද්ධ නම් මේ ගහන බදු ගිවිසුමට ඇස්කොට් අම්බලන්ගොඩ නොහොත් නැතහොත් අර සමාගම කියා මෙහි සඳහන් විය යුතුයි.එහෙම නැත. මෙය කියවා බලන්න. එමනිසා මේ පිළිබඳව ගරු සභාපතිතුමනි,මෙයද සමාගම් ගිවිසුමත් සමඟ කිසිදු අවුලක් නැත. මේකේ සමාගමත් එක්ක අවුලක් තිබෙන්නේ.මෙන්න මේ සමාගමේ සිටින අධ්‍යක්ෂකවරු ඊළඟ සමාගමට අධ්‍යක්ෂකවරු විදියට ඒ අයම පෙනී සිටි නම් යම්කිසි අධ්‍යක්ෂක මණ්ඩලයක් නැතිනම් අධ්‍යක්ෂක මණ්ඩලය තිරණයක් ගන්නවානම් මේ බදු ගිවිසුම සමාගම් මැඳුර හා යා කර මේ ගිවිසුම වෙනුවට සංශෝධනය කරනවා අහවල් නමට එය සමාගම් මැඳුරේ ලියා පදිංචි කරනවා එදින සිට මෙන්න මේ සමාගම වලංගුයි කියා ලිඛිතව නගර සභාව දැනුවත් කළ යුතුයි.ලිඛිතව දැනුවත් කළ යුතුයි. පසු ලේඛන බැහැ. එහෙම නම් අදාල ලේඛන මේ සභාවේ අද ඉදිරිපත් කරලා සභා වාර්තා ඉදිරිපත් කළ යුතුයි.එහෙම නැතිව මේවා බැහැ.මෙයට අපි වැඩි දුරට කාලය ගන්න ඕන නැහැ.මේ පිළිබඳව මා දකින්නේ මෙච්චරයි.මේවා යාබද කරන්න බැහැ.සමාගම් මැදුරේ එහෙම නිති රිති නැහැ. පුළුවන් . අර විදියට පුළුවන් . ඕන විදියට මටයි සරත් මහතාටයි ඔබතුමාටයි ඔන විදියට මේ දැන් ගිහින් සමාගමක් හදා ගන්න පුළුවන්. හැබැයි එම සමාගම හැදුවා කියා එස්කොට් සමාගම ගන්න අපට බැහැ. එස්කොට් සමාගම ගන්න යම්කිසි ක්‍රියා පටිපාටියක් තිබෙනවා.එම ක්‍රියා පටිපාටිය තුළ . එස්කොට් සමාගමට තිබෙනවා යම්කිසි දේපලක්. එහෙම නම් එම දේපල පරිවර්ථනය විය යුතුයි මේ සමාගමට .එම දේපල කොටස් කරුවන්ට අපි මුදල් කරන්න ඕන. මේ තිබෙන කොටස්කරුවන්ට. නිකං මේ සමාගම් කොළ කැල්ලේන් කොළ කැල්ලට මාරු කරන රටේ නිතියක් නැහැ. එමනිසා මා අවසාන වශයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. අපි අර විදියට කම්ටුවක් දමන්න.

## ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

මා එම සාකච්ඡාවේදි හිටියේ නැහැ.මෙතැන වූ ප්‍රශ්නයක් නිසා. මා හිතන්නේ ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස් ප්‍රකාශ කර අවසන් ද?

## ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

මට තව එක දෙයක් කියන්න ඕන. සමාගම් මැදුරේ ප්‍රශ්නය වුණත් ගරු විපක්ෂනායකතුමාට වත් අපි කාටවත් එය දමා ගන්න ඕන නැහැ. නිතිඥ මඩුල්ලට දැම්මාම ඒ අය කියයි සමාගම් මැඳුරට යන්න ඕනද නැද්ද කියා නිතිඥ මඩුල්ලෙන් දැන ගන්න පුළුවන්. ඒ අනුව ක්‍රියාත්මක වෙන්න.

## ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ඒ අනුව ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස් අනුව එතුමලා මා හිතන්නේ තිරණයක් ගන්න ඇති. මෙහි සිටින අධ්‍යක්ෂක මණ්ඩලය කවුද ? ඒ අය කාලයක් දෙන්න ඇති මේ කාලය අනුව අරගෙන එනවා කියා. ඒ කාලය ඇතුළත අපි මෙය නිතිඥ මණ්ඩලයක් හරහා මේ ගිවිසුමේ තිබෙන ගැටළු මොනවාද ? මේ ගැටළුවට අපි නිදහස් වෙන්නේ කොහොමද කියන එක ප්‍රශ්නය සොයා බලා දැන් අපි මෙය වසර 7ක් තිස්සේ මෙය හදාගන්න බැරිවුණා.

විශේෂයෙන් මා කියන්න ඕන එක්සත් ජාතික පක්ෂය වත් නෙමෙයි මෙයට බැණුම් අසන්නේ. පාලක පක්ෂය වන අපි තමයි මෙයට බැණුම් අහන්නේ. අපේ පාලන කාලයේ තමයි මෙය කඩා අයින් කළේ.එත් නගර සභාව මෙකට හවුල් වුණේ නැහැ. දකුණු පළාත් සභාව හරහා මෙය කඩා ඉවත් කළේ. නමුත් මේ වෙච්ච වැරැද්ද අපි ඇඟ බේර ගන්න කතා කරන්නේ නැහැ.මෙය කෙරෙන්න ඕන ජනතාව බනින්නේ අපටයි. පාලකයෝ වශයෙන් අපිට බනිනවා . මෙය කෙරෙන්නේ නැති හේතුව මොකද කියා. මා මතක් කරන්න ඕන අපට වඩා අපේ ගරු සභාපතිතුමාට දොස් කියනවා මෙයට. මා නම් දන්නා තරමට මෙයට ගරු සභාපතිතුමා ගැවිලාවත් නැහැ ගරු විපක්ෂ නායකතුමනි. මා එතුමාට හුණු ගාන්න කතා කරනවා නෙමේ. එතුමා මෙයට ගැවිලාවත් නැහැ.මෙය කෙරෙන්නේ නැති හේතුව මොකක්ද කියා අපටත් අභිරහසක්. අද වෙනකම් මෙහි අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉන්නේ කවුද ? කියා මෙයට දැනුම් දුන්නේ නැහැ. ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව මේ ගිවිසුම . මා හිතන්නේ මේ ගිවිසුම හදන ලද නීතිඥ මහතා තමයි මේ ගිවිසුමේ නීත්‍යානුකූල තත්ත්වයක් තිබෙනවා කියා අපට දන්වා එවා ඇත්තේ.එම නිසා එතුමා හැර වෙනත් නීතිඥ මහතුන් ලවා මෙය බලවලා පරීක්ෂණයක් කරලා මෙයට ගන්න පුළුවන් යන්න පුළුවන් විසඳුම . අපි ඇත්තටම මෙහිදි දන්න නීතිය අඩුයි. අපි නීතිඥ මහත්වරු නෙමෙයිනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. මෙතැන පොඩි ගැටළුවක් තිබෙනවා. ඒ අය දැන්වූවා කියනවා. මේ නගර සභාවට මේ පිළිබඳ දැන්වූවා කියා. එහෙම එකක් තිබෙනවාද? එහෙම ලියුමක් තිබෙනවා නම් ඇයි ඉදිරිපත් නොකළේ. ඇයි සභාගත නොකළේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

මැයි මාසයේ 05 වෙනි දින. එතුමන්ලාට අපි කාලයක් දි තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>

අපි කතා නොකළේත් එකයි . මෙකේ යට ප්‍රශ්න ගැටළු තිබෙනවා. ඇත්ත කතාන්දරය මේක. මෙය මේ ගරු මන්ත්‍රීවරුන් බේරා විනිවිදභාවයෙන් අවසන් වෙන්න ඕන. ඕන තැනක පුද්ගලික ආයතන හදා මේ තිබෙන දේවල් වුණත් විකිණීමක් සිද්ධ වෙන්න පුළුවන්. එක නෙමේ අපි බලාපොරොත්තු වෙන්නේ. මේක හැදෙන්නේ නැති එකයි. සියළු දෙනාටම . එකයි මෙහි ප්‍රශ්නය තිබෙන්නේ. නැතිනම් දෙලක්ෂ ගණනක මුදල් ඒ අයත් ගෙවනවා. මෙහි ඉවරයක් තිබෙන්න ඕන. ගැටළුවක්. මොකක්ද එවා තිබෙන්නේ ඔය ලිපියේ .කවදා ද එවා තිබෙන්නේ. අපි දි තිබෙන්නේ ඇස්කොට් අම්බලන්ගොඩ කියන සමාගමට. එතකොට එහි වෙනස්කමක් වෙනවා නම් නගර සභාව දැනුවත් කරන්නේ නැද්ද? එහෙම ඇතුළත් වෙලා නැද්ද?

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මට තව ඉල්ලීමක් කරන්න ඕන. ඒ අය 31 වෙනිදා එමට පෙර මේ පිළිබඳ තීරණයක් ගෙන තිබිය යුතුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එක තමයි මෙය දිගින් දිගටම යනවා වැඩියි. ගරු මන්ත්‍රීතුමා අපි තීරණයක් ගන්න එපායි.එක එක්කෙනා නැගිට කතා කරන විට තීරණයක් ගන්න බැහැනේ.එම නිසා කියන්නේ . එතුමලා මෙතැනට අධ්‍යක්ෂක මණ්ඩලයත් ගෙන මෙතැනට පැමිණෙනවා. ඒ පැමිණීමට පෙර නිතිඥ මණ්ඩලයක් හරහා තීන්දුවක් ගන්න කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

අපි එදත් කිවුවේ අධ්‍යක්ෂක මණ්ඩලයට මෙහෙට එන්න කිවුවේ. එතකොට අධ්‍යක්ෂක මණ්ඩලය ආවේ නැහැනේ. මේ උපදේශක මඩුල්ලක්නේ පැමිණියේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාණෙනි,මේ අය පැමිණෙන විට තින්දුව ගත යුතුයි. තින්දුව ගන්නේ නැහැනේ. ඔබතුමා වාඩිවෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

මා යෝජනා කරනවා . අම්බලන්ගොඩ උපත ලද අම්බලන්ගොඩ නිතිඥ මහතෙක් වන නිතිඥ ඩික්සන් මහතා සුදුසු යයි යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ  මහතා කතා කරමින්</u>**

අපි එතුමන්ගේ ඉතිහාසය බලන විට , මා මේ පුද්ගලිකව කියනවා නෙමේ. මේ නගර සභාවට විදින්නට සිදුවන ගැහැටකාරි තත්ත්වයෙන් මේ නගර සභාව මුදවා ගත යුතුයි. එතුමන්ගේ නාමය තුළ පුවත්පත්වල පළ නොකළ යුතුයි. එතුමාගේ ඉතිහාසික තොරතුරු එතරම් පිරිසිදු නොවේ. එවැනි කෙනෙක් ඇයි මෙයට යොදා ගන්නේ. තරුණ නිතිඥවරු නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

එහෙනම් මා යෝජනා කරනවා නිතිඥ ලූෂාන් වඩුතන්ත්‍රි මහතා සුදුසු බව. තුන්දෙනෙකු දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ් . ඒ. සෝභිත රංජිත්  මහතා කතා කරමින්</u>**

මා යෝජනා කරනවා නිතිඥ සමන් ත්‍රාබේව් මහතා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

නිතිඥ සමන් ත්‍රාබේව් මහතා යෝජනා වුණා. නිතිඥ අශෝක වීරසිංහ මහතා හොඳ නැද්ද

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ අම්බලන්ගොඩ සිටින කවුරුහරි අපි යෝජනා කළානම් හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

දිස්ත්‍රික් අධිකරණයේ සිටින නිතිඥ මහතෙකු යොදන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නිතිඥ අශෝක විරසිංහ මහතා කොළඹ ගොඩක් ඉන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපේ නිතිඥ ආනන්ද මහතා හොඳ නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නිතිඥ නුජිත් ද සිල්වා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතුමා දමන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් කවුද ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතාණෙනි දමන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් සිටිනවා. මට ඕන නම් සහතිකයක් දෙන්න පුළුවනි.නිතිඥ රෝහණ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

කමක් නැහැ දමන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නම කියන්න. නිතිඥ රෝහණ සම්පත් මධ්‍යගේ යන නිතිඥ මඩුල්ලක් ඉදිරියේ මෙය දෙසැම්බර් 20 කලින් මෙහි නිත්‍යානුකුල තත්ත්වයත් සොයා බලන්නට කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු ලේකම්තුමියණනි, සියළුම ලිපි ලේඛණ දින දෙකක් ඇතුළත භාර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කෙරම්ණිය මගේ ගමේ පතිරාජ මාවත දක්වා දිවෙන අන්න අර කියන ලූෂාන් වඩුතන්ත්‍රි මහතාගේ නිවස අසළ පාර . අන්න ඒ පාර සභාවට පවරා ගෙන සංවර්ධනය කළා. අත්පත් කර ගත්තා. මෙහි මුදල් දෙදෙනෙකුට ගෙවන්න අනුමත වෙලා තිබෙන්නේ. ඒ දෙදෙනා මේ වන්දි ඉල්ලනවා. මේ ලිපිය මා කියවන්නේ නැතිව ඔබතුමාට එවනවා. එය නිකුත් කරලා මේ දෙදෙනාගේ වන්දිය ගෙවන්න කියා තමයි මේ ඉල්ලා සිටින්නේ. ලක්ෂ දෙකක වන්දියක් තිබෙන්නේ.ලේකම් තුමිය මතක නැද්ද? අත්පත් කර ගත් මාවතක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා මේ මැතිවරණ කාලයේ වන්දි ගෙවීමේ කටයුතු සිදු කරන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

නැහැ . ප්‍රශ්නයක් නැහැ. ඡන්දය දිනා කරන්න. දැන් මාස දෙකකට කලින් මා කිවුවා වඳුරෝ සෙල්ලම් කරනවා කියා. අර විදුලි ලාම්පුවල බාර්වල එල්ලිලා.මේ වඳුරෝ උවදුරේන් මේ විදුලි ආම් බේරා ගන්න. විශේෂ කැම් වර්ගයක් ගෙනත් දැන් ගොඩක් කල්. අන්න අරක ඇතුළේ තිබෙනවා. ඇයි තාම බැරි වුණේ විදුලි අංශයේ ඔවුන් හතර දෙනාට තාම මේය සවිකර ගන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඇත්තටම මාත් සැහිමකට පත් වෙන්නේ නැහැ විදුලි අංශයේ සැපයීම පිළිබඳව. සමහර වේලාවට අපි දකිනවා එක විදුලි ලාම්පුවක් දෙකක් දමා කැම වේලාව වෙනකම් කොහේ හරි නතර කර සිට කැමට පැමිණෙනවා. එම නිසා මාත් සැහිමකට පත් වෙන්නේ නැහැ. ඔබතුමා විතරක් නෙමේ.කියන කතාව සත්‍යයක්. ලේකම්තුමිය එම නිලධාරින් ක්‍රියාත්මක කිරිමේදි ඔවුන් කවුරු යටතේ ද සිටින්නේ. සඳුන් මහතාණෙනි මා ඇත්තටම දකින දෙයක් මා හිතෙනවා ඔබතුමාටත් ලොකු වැඩ කොටසක් තිබෙනවා. සේවකයොත් දැන ගන්න ඕන. සමහර වේලාවට විදුලි ලාම්පු එකක් දෙකක් දමා කැම වේලාවට පැමිණෙනවා. ඊට පසු නැවත ආපහු ගිහින් විදුලි ලාම්පුවක් දෙකක් දමා පැමිණෙනවා. මේවා කෙරෙන්නේ නැති එකයි ප්‍රශ්නය. ලේකම්තුමියට ගිහින් බලන්න බැහැ. එය ඇත්ත.එගොල්ලන්ම ස්වේච්ඡාවෙන් බලන්න ඕන. ඒ අය වැටුපක් ගන්නවා. එම වැටුපට සැහෙන්න . අපි කියන්නේ නැහැ සියයට සියයක් වැඩ කරන්න කියා. එහෙම වැඩ කරන්නේත් නැහැ. සාමාන්‍යයෙන් සියයට සියයක් වැඩ කරන්නේත් නැහැ මනුස්සයකු. සාමාන්‍යයෙන් වැටුපක් ගන්නේ . එහෙම වැටුපක් ගන්නවානම් 75%ක් වත් වැඩ කරන්න ඕන. එය කෙරෙන්නේ නැතේයි කියන මතයේ මා සිටිනවා. එය ඉතා ඉක්මනින්ම සොයා බලන්න ඕන. මොකද මෙය සවි කරන්න මා වේලාවක් යන්නේ නැහැ.එම නිසා ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ පිළිබඳ ඉතා ඉක්මනින් සොයා බලන්න කියනවා.ගරු සභාපතිතුමා තාක්ෂණසේවා නිලදධාරින්ට සහායකයින් ලබා දීමට පෞද්ගලිකව එම ආයතනයට කතා කරලා දෙදෙනෙක් එවන්න කියා දන්වා සිටියා. හැබැයි කතා කළ ආයතනයට නෙමේ ලිපිය යොමු කර තිබෙන්නේ වෙනත් ආයතනයකට.කතා කළේ කටුනායක තාක්ෂණ ආයතනයට . අදාල විෂය ලිපිකරු එය ඇරියා බලපිටිය කාර්මික විද්‍යාලයට. බලපිටියෙන් එන්නේ දෙසැම්බර් මාසයෙන් පසුවයි. එය නිවැරදි කර තිබෙනවාද දන්නේ නැහැ. මා නැවත ගරු සභාපතිතුමාට ගිහින් කිවුවා. ගරු සභාපතිතුමා නැවත එම ආයතනයට කතා කළා. ලිපිනයත් අරගෙන දුන්නා. මෙය අරින්න කියා. මා දන්නේ නැහැ. තවම ඇරලා ද නැද්ද කියා. මේ ආයතනයේ කිවුව දෙයක් පිළිපදින්නේ නැති නිලධාරින් කොටසක් ඉන්නවා. සමහර වේලාවට ලේකම්තුමිය කිවුවත් ගණන් ගන්නේ නැහැ.ඒ වගේ එක්කෙනෙක් දෙදෙනෙක් සිටිනවා. මා සමහර වේලාවට දොස් කිවුවාම අඬාගෙන යනවා.සමහර වේලාවට මට හිතෙනවා මා දොස් කියනවාට වඩා හොඳයි නිකං හිටියා නම් කියා.එම නිසා මා එතුමා කියාපු දෙය පිළි ගන්නවා. ඔවුන් ලොකු කාර්යයක් කරනවා. සමහර වේලාවට මේ ඇස්තමේන්තු අන්තිම මොහොතේ දෙන්නේ ඒ සම්බන්ධවයි. ලොකු වැඩ කොටසක් කරනවා. සභාවෙන් අනුමත කලා ගෙවීම කරන්න. හැබැයි නිලධාරින්ට උවමනාවක් නැහැ ගෙන්වා ගන්න. කටුනායක තාක්ෂණසේවා නිලධාරින්ගෙන් ඒ අය ගෙන්වා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

මං වැඩියේ කතා කරන්නේ නැහැ. ඊයේ සිදුවූ සිදුවීමක් නිසා මා මේ ගැට තැන් ලිහා ගන්නයි අහන්නේ. ඊයේ අපේ සෞඛ්‍ය අංශයේ සේවකයෙකුගේ සොහොයුරෙක් නැති වෙලා අවසන් කටයුතු කළා. එතකොට එම සේවකයාගෙන් තමයි එම සහෝදරයා යැපුනේ. හදවතේ පිළිකාවක් ඇතිවෙලා ලෙඩය සොයාගෙන තිබෙන්නේ පෙරේදා. ඊයේ දිනය එහි අවසන් කටයුතු සිදු කළා. බොහොම දුක්ඛිත නිවහනක්. මෙම අවමංගල්‍යයට මා අපේ ගරු සභාපතිතුමාට සහභාගි වන ලෙස දන්වා සිටියා.එතැනට ගිහින් බැලුවාම අපේ කිසිම අපේ නායකයෙක් මහජන නියෝජිතයෙක් ගිහින් නැහැ. එමනිසා මා කියනවා අපේ නිලධාරියෙක් යොදවන්න. අවමංගල්‍ය දැනුම් දීමට. ඒ දුන් වහාම කියන්න අහවල් තැන අවමඟුලක් වහාම යන්න කියා. ඒ එක්කම මා ගරු සභාපතිතුමාට කියා සිටියා . ගරු සභාපතිතුමනි , මේ අවමඟුලට මට මාගේ බයිසිකලයෙන් යන්න පුළුවන්. නමුත් සභා කැබ් රථයක් දෙන්න මා ඒහි වචන දෙක තුනකුත් කතා කර එන්නම් කියා. ගරු සභාපතිතුමා කිවුවා එහෙම හොඳ නැහැ. විපක්ෂ නායකතුමා අසා තිබෙනවාද මෙහේ ගරු මන්ත්‍රීවරයෙක්ට එහෙම මේ සභාවේ එහෙම සම්පතක් භාවිතා කිරීම අකැපද? මොකද කියන්නේ. ඡන්දය නිසා නෙමේ. මේ අපේ පරම පූජනීය 21 දෙනා මේ සිටින්නේ. මේ මුළු මහත් සමස්තයේ අග්‍රගණ්‍යයයි සිතලා උත්තරීතර අයුරින් පත්කරන ලද පුද්ගලයින් 21 දෙනා මේ සිටින්නේ.බල ප්‍රධානියා හැටියට අපි බලය ප්‍රධානය කර තිබෙනවා. ඔන්න ඔබයි ප්‍රධානියා කියා.ඒ ඔහුගේ තනි මතයට පත් වෙච්ච ධුරයක් නෙමෙයි එය. ඔහු දැන ගත යුතුයි. මා බනිනවා නෙමේ ඔහුට. ඔහු දැනගත යුතුයි ඔහුට පැවරු මේ වැඩ කටයුත්තේ කොටසක් අපටත් පැවරිමට. නමුත් එවැනි ප්‍රධානියෙක් තවම බිහිවී නැහැ.බිහි වන්නට දෙන්නෙත් නැහැ කුහකත්වය නිසා. ගරු උප සභාපතිතුමනි අනාගතයේ ඔබතුමා එන්නට පෙරුම් පුරනවා මෙතැනට. නමුත් ඔබතුමා සිතේ දරා ගන්න. නමුත් එතුමා බලවත් ප්‍රභලයෙක්.හිටියා නම් හොඳයි. නැතිනම් එතුමා නැතිවෙලා කතා කළා කියනවා.එතුමා ප්‍රබලයෙක් . පරිණතයෙක්. අනාගතයේ පොහොට්ටුවේ නායකත්වය ගෙන දිස්ත්‍රික්කයේ වැජඹවායි කියා අපි හිතනවා. අපි ගරු කරනවා.නමුත් ප්‍රතිගුණය සැලකිල්ල අපට ලැබෙන්නේ නැහැ. ඇයි ඒ. මා කියනවා ගරු මන්ත්‍රීවරුන්ට කැබ් රථය අවශ්‍යද යම් විටක අභය නොකර දෙන්න බලා ගන්න සුදුසු දෙයක් නම්. ඒ සමඟම අපි කියනවා මේ අහිංසක සෞඛ්‍ය සේවකයෝ වැස්සේ තෙමි තෙමි මේ කසළ එකතු කරනවා. පස්සෙන් ගොස් ගදේ බැහැ.මොවුන් සියළු දෙනාට ඇඟ ආවරණය ලැබුණාද? ඒ එක්කම ඔවුන් අනියම් ආදේශක වර්ගීකරණයකින් තොරවද ලැබෙන්නේ. ඉහත කරුණ ගැන සලකා බලන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සියළු දෙනාටම.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මට විනාඩියක පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අර පුහුණුව සඳහා තාක්ෂණසේවා ආයතනයෙන් පුහුණුකරුවන් ගන්නවා කිවුවා. ඒ අයට ගෙවීමක් සභාවෙන් කරනවාද? නැතිනම් පුහුණුවට අය ගන්න බැරි වෙනවා අම්බලන්ගොඩ නගර සභාවට.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා එහෙම වාහනයක් දෙන්න නිත්‍යානුකූල තත්ත්වයක් නැහැ. හැබැයි ඒ වෙනුවට තමයි ඔබතුමලාට ඉන්ධන දීමනාවක් තිබෙන්නේ. හැබැයි යම්කිසි නගර සභාවේ යම්කිසි රාජකාරි දෙයක් හරි තමන්ගේ කොට්ඨාශයේ රාජකාරියක් කෙරෙන්න ඕන නම් නගර සභාව හරහා එන උදාහරණයකට ඇස්තමේන්තුවක් තමන්ගේ ගමේ ගාලු ගොස් අනුමත කරගෙන එන්න ලේකම්තුමියට ඉල්ලීමක් කළාම වාහනයක් ලබා ගන්න පුළුවනි. හැබැයි පෞද්ගලික වාහනය නිදහස් කරන්න ඒ වගේ දේවල් වලට වාහනය නිදහස් කරන්න බැහැ. ඒ වෙනුවට තමයි ඉන්ධන දීමනාවක් ලබා ගැනිමට කටයුතු කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

බොහොම ස්තුතියි. මා අදහස් කළේ අර නැතිවු දරුවාගේ සහෝදරයාට අභිමානයක් එක් කිරිම පමණයි. නැතිනම් මට මෙහි යන්න කාගේවත් කැබ්රථ ඕන නැහැ. මට අනාගතයේ ලැබෙන වේලාවට එම වාහන ලැබෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ප්‍රකාශ කළාට අපිවත් , ලේකම්තුමිය වත් දන්නේ නැතිව ඇති. ඔබතුමාට එය ආරංචි වුණේ කොහෙන්ද කියා. ඔබතුමා කියනකම් අපි දන්නේත් නැහැ.කවුද කොහේද කියලා. සෞඛ්‍ය පරිපාලකලා දන්නවා ද ? දන්නවා නම් කියන්න.ඒ කියන්නේ කොඩියක්වත් දැම්මේ නැද්ද? පුටු ටිකක් වත් දුන්නේ නැද්ද? මෙතුමා කියනවා දැන් මොකක්වත් කළේ නැහැ කියා.එක දැන්නුවේ නැහැ. කොහේද සාරාංග.ඕලබැද්දේ. අපිනම් දන්නේ නැහැ.එහෙම දෙයක් වුණාම ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන්න. නැතිනම් ලේකම්තුමියට කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි. මෙතුමා ගෙන එනු ලබන දේවල් හරි වැදගත්. මෙතුමාට ඉදිරියට යන්න දෙන්නේ නැහැ ඔබතුමලා. ඒකයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඉතිං නැති බැරි මනුස්සයකුට පිහිට වෙන්නේ මෙතුමා විතරයි.අපට තෙරෙනවා එක.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාණෙනි,ඔබතුමා එහෙම වේලාවට මගේ වාහනය ඉල්ලන්න. මා ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒක තමයි. මේ වගේ ගරු මන්ත්‍රීවරයෙක් ඉන්න එක ගැන සතුටු වෙන්න ඕන. මේ ප්‍රශ්න ගැටළු කිහිපයක් තිබෙනවා.මට මේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා ධීවර සංකීර්ණය සම්බන්ධව. අපිට නෙමේ තිබෙන්නේ ධීවර සංකීර්ණය. නමුත් අපේ වගකීම තමයි ඒ ආයතන වල මහජනතාව පවිච්චි කරන එම ආයතනයේ යටතල පහසුකම් සපයා දීම ඒ ආයතනය සතුයි. මොකද රු.9000/= ක මුදලක් ගන්නවා ධීවර සංකීර්ණය. බලන්නකෝ හැටි දැන්. විදුලි පංකා කැරකැවෙන්නේ නැහැ.අනෙක් එක වැසිකිළි පහසුකම් වල හරි

ගැටළුවක්. මේ සම්බන්ධව දැඩි ලෙස ක්‍රියා කරන්න. මේවායේ බදු ගෙන නිසිලෙස පහසුකම් ලබා දෙන්නේ නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා , අපට තමයි ධීවර සංකීර්ණය තිබුණේ. අපි සභාව පාලනය නැති දිනවල ලේකම් පාලනය තිබෙන කාලවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මෙය පවරාගෙන තිබෙනවා. අපි ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා , ගරු අමාත්‍ය දිලිප් වෙද ආරච්චි මහතාට අපි එදා මේ ගැන කියා සිටියා.අපි ඉල්ලා සිටිනවා ඔබ දෙපලට පුළුවන් එය ලබා දෙන්න ආපහු. මොකද ඇත්තටම විදුලි පංකාවක් වැඩ කරන්නෙත් නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැතිනම් අනාගතයට ඔය ධීවර සංකීර්ණය නැති වෙනවා. තව දෙයක් මා බැලුවා පසුගිය ගෙවීම් වලදී තල්ගස්ගොඩ , තල්ගස්ගොඩ කියා කිහිපයක් තිබුණා. ඔය අම්බලන්ගොඩට ජලය සපයන එක තමයි කළුවඩුමුල්ලේ ජල ටැංකිය. මාර්ගයේ කාණු පද්ධතියක් නැහැ. මාර්ගය අදටත් කැඩෙනවා. කාණු පද්ධතිය දමන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මඩ ගහන්න එපා. ඔබතුමා ගිහින් බලන්න තල්ගස්ගොඩ පාරවල් වල යන්න පුළුවන් ද කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒක නෙමේ මා මේ කියන්නේ. කළුවඩුමුල්ලේ වතුර ටැංකිය පාරේ පාර කැඩිලා.කාණු පද්ධතිය නැහැ. ඔබතුමලාගේ මන්ත්‍රීවරයෙක් මෙහි සිටින්නේ. මෙහි තිබෙන කොට සාමාන්‍යයෙන් කොටස් වශයෙන් බෙදී යන්න ඕන සංවර්ධන කටයුතු.එමනිසා කළුවඩුමුල්ලේ කාණු පද්ධතිය අන්තිම සවුත්තු වෙලා. අනිත් කරුණ තමයි ඕකන්දේ ප්‍රජා ශාලාව . මා දැන් වාර ගණනාවක් මා කිවුවා. ඕකන්දේ ප්‍රජා ශාලාව.වහල කැඩිලා . මේවා නගර සභාවේ ඒවා.මේවා අරගෙන ඉවර වෙලා හදලා නගර සභාවට පවරලා තිබෙනවා. ෂීට් දෙක තුනක් කැඩිලා තිබෙනවා. අද වනතුරු හදලා නැහැ. උඩින් තෙමෙනවා.මේක මෙහෙම යන්න බැහැ.මේ පොඩි වැඩයි තිබෙන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරිතුමනි, අදම යවන්න. ෂීට් තිබෙනවා. ගලවලා අයින් කරන ලද ෂීට් තිබෙනවා. හල්වතුර කසළ අංගණයේ. අපගේ වඩු වැඩකරු අදම යවා මේ ෂීට් දෙක දමන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

අනිත් එක මාර්ග සති පාර . යන්න පුළුවන්ද කියන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක හැදුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

යන්න පුළුවන්ද කියන්න.මේ බොරු කරන්න එපා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

යන්න පුවවන් වෙන්න හැදුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කොන්ක්‍රීට් කරලා හරි ඒවා අවසන් කරන්න. මොකද ඒවා මීටර් 100 ද ? මෙතුමාගේ නිවසට එහා පැත්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපි එය හැදුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනිත් කරුණ තමයි හල්වතුර ඉඩම් සම්බන්ධව. දැන් රැස්වීමක් කැඳවා එය අවලංගු කළා.කවුද නිලධාරින් මඩුල්ලක් පැමිණෙනවා කිවුවා. පැමිණියාද ? එම රැස්වීම ඇයි අවලංගු කළේ.මොකද අපි එයට සූදානම් වෙලා හිටියා. මෙය වැදගත් එකක්. ඒටික අවසන් කර ගන්න. දැන් ජාතික ක්‍රිඩාංගණයත් දැන් සකස් වෙමින් යනවානේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය රාහුල මන්ත්‍රීතුමා නොවැලැක්විය හේතුවක් නිසා එන්න විදියක් නැහැ කියා දන්වා තිබෙනවා.එම නිසා තමයි දන්වා තිබෙන්නේ. එයට වෙනත් දිනයක් ඉල්ලා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනිත් එක තමයි පනියන පාර කුලරත්න විද්‍යාලයට යන. වෙනදා කිසිම දිනක ගැලුවේ නැහැ. පොඩි වැස්සක් වැස්සත් දැන් යටවෙනවා. ඇළ මාර්ගය අවහිර වෙලා තිබෙන්නේ. එයට මොකක් හරි ක්‍රමවේදයක් දමා එය සුද්ද කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඇළ නෙමේ . ගරු රාහුල මහතාණෙනි මමත් ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාත් ගියා. අර මෝය කටේ තනිකර ගල් හිරවෙලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ලේකම්තුමියට ගිය සභාවේදි කිවුවා . වාරිමාර්ගයට දන්වා යවා එතැන සුද්ද කරන්න කියා.ගරු සභාපතිතුමා කිවුවා ගිය සභාවේදි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

තව හේතුවක් තිබෙනවා. එහි ඉස්සත් අල්ලන්න ලයිට් කණුවක් දමා සිල්බර කොට දමා මෙහෙම හරස් කර තිබෙන්නේ. ඒවාට උඩින් තමයි වතුර පාර යන්නේ.ඒවා ඉවත් කරන්න ඕන. නැතිනම් වතුර බහින්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කලිනුත් ඉස්සෝ ඇල්ලුවා. දැන් එක නෙමේ මෙතැන වෙලා තිබෙන්නේ.මෙතැන වෙලා තිබෙන්නේ කුලරත්න පාරේ එහා පැත්තෙන් කාණුවක් තිබිලා තියෙනවා. එක දැන් වැහිලා. කාණුව සම්බන්ධ වෙන්න ඇළට වැටෙන්න සුද්ද වෙන්න ඕන.කුලරත්න පාරේ ඇත්තටම යන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ළමයින් මේස් සපත්තු ගලවලා යන්නේ. එමනිසා පොඩි වර්ෂාවකට වුනත් යටවෙනවා. එම පාරේ බෝක්කුව පනින කොටම බලන්න. පාර කැඩිලා. තනිකර පාර කැඩිලා තිබෙන්නේ. අන්න ඒ පාර නවීකරණය කර දෙන්න.මොකද යන්න බැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය නවීකරණය කරනවා කියන්නේ . එම පාර තනිකරම උස්සන්න ඕන. අඩි තුනක් විතර.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි දැන් ඔබතුමන්ලා පැමිණ තිබෙන්නේ එකටනේ. එමනිසා එය කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමත් පැමිණ තිබෙන්නේ එකටනේ.හරි අපි එකතු වි කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අර තල්ගස්ගොඩට විතරක් කරලා හරි යන්නේ නැහැ. මේවාටත් කරන්න ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා ඉංජිනේරුතුමාටත් කතා කළා. හදිස්සි වෙලාවේ පැමිණ උඩ තිබුණ ගල්ටික අරන් දමා ගියා. එමනිසා වතුර බැස්සා. හැබැයි තව යට තිබෙනවා අස් කරන්න. අපි නැවත වතාවක් කථා කර මැෂින් එක ගෙන්වා ගෙන අයින් කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙකට ගන්න ඕන හොඳම විසඳුම කියන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

විසඳුම තමයි මෝය කට සුද්ද කරන එක. අර හරහට දමන ලද සිල්බර කොට අයින් කරන්න ඕන. එය පලාත් වාරිමාර්ගයට අයිති ස්ථානයක්.එමනිසා මා ඉංජිනේරු වරයාටත් කථා කළා. ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාත් ගියා. ඒ වේලාවේ හදිස්සි නිසා එක දිනයක් වැඩ කරලා මැෂින් එක ගෙන ගියේ. මා පෞද්ගලිකව මැදිහත්වෙලා කතා කරලා එය විසඳන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ අය පැමිණ සුද්ද කරන කොට ගමේ අයත් දැනුවත් කරන්න. මොකද ඒ ගැන දන්න අය ඉන්නවා.ඇත්තෙන්ම ඔතන නැහැ කියා ඒ අය යනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

සමහර වේලාවට අපි දන්නේත් නැහැ. ඒ අය පැමිණිලා යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය  මහතා කතා කරමින්</u>**

පොඩ්ඩක් දැනුවත් කර එන්න කියන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

- පස්වරු 1.30ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

| | |
|---|---|
| රණසි උත්පල ගුණවර්ධන මිය | අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු |
| ලේකම් | සභාපති |
| අම්බලන්ගොඩ - නගර සභාව | අම්බලන්ගොඩ - නගර සභාව |

2019.11.27

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය